# යොහන්

## බයිබල් පාඩම



යේසුස්: නැවත නැගිටීමද, ජීවනයද, මමය. මා කෙරෙහි අදහන්නා මළ නුමුත් ජීවත් වන්නේය.

— යොහන් 11:25

# ඇයි යොහන්ගේ සුභාරංචිය ලීවේ

***මෙම පොතේ ලියා නැති බොහෝ හාස්කම් ගෝලයන් ඉදිරියේ යේසු කළා. "නමුත් මේවා ලියන්නේ දෙව්පුත් යේසුස්, ක්‍රිස්තුස් බව ඔබලා විශ්වාස කරන පිණිසත්, විශ්වාස කර එතුමගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය"*** - යොහන් 20:30, 31

"යේසු බොහෝ සේ ආදරය කළ ගෝළයා" තමා බව යොහන් කියයි. අන් සියලු ගෝළයන්ට වඩා, යොහන්ට පමණක් යේසු වැඩියෙන් ආදරය කළ බව සිතීම අසීරු දෙයක් නමුත් සමහරවිට, අන් සියලු ගෝළයන්ට වඩා යේසුගේ ආදරය හැඟීම්බරව යොහන්ට දැනෙන්නට ඇති එමනිසා යේසුගේ ආදරය ඉතා ගැඹුරින් අගය කළ යොහන්, එතුමගේ ලෝ සේවයට හා අරමුණට ඉතා ගැඹුරින් හා සියුම් හැඟීම් සමග ඇපකැපව සිටියා

මතෙව්, මාර්ක් හා ලුක් නැමැති සුභාරංචි ලියා වසර කීපයක් නිමවූ පසු, යේසුස් සාමාන්‍ය මිනිසෙක් බවට මිත්‍යා ඉගැන්වීම් එවකට පතල වී තිබුණා. එමනිසා "ජීවමාන මැවුම්කරු දෙවියන් මාංසාකාරයෙන් ලෝ ආ බව" ඔප්පු කිරීම පිණිස යොහන් මෙම පොත ලීවා යේසු කළ හාස්කම් සිය ගණනකින්, යේසු කවුද යත්, යේසුම කී ලෙස ඔප්පු වන හාස්කම් පමණක් යොහන් ඉතා සියුම් ලෙස තෝරාගත්තා. මෙම හාස්කම් යොහන් සඳහන් කළේ "ලකුණු" කියාය.

තවද, එකළ සිටි ආගම් නායකයන් යේසුට ද්වේශකර, එතුමා කුරුසියේ ඇණගැසීමට පාවා දුන්නේ ඇයිද කියා යොහන් ඔප්පුකර ඇත. ඒ, දෙවියන් හා තමා එක හා සමාන බව යේසු කී නිසයි. එමෙන්ම ලෝ පාපය දුරලන "දෙවියන්ගේ බැටළු පැටවා" බවට යේසු සැළසුම් කළේ කෙලෙසද යත් යොහන් පෙන්වා දෙනවා දේව කැමැත්ත අනුව ලෝ පාපය දුරැලීමෙහි එකම සර්වසම්පූර්ණ පූජාව වීමට යේසු සිය කැමැත්තෙන්ම සිය නිර්මල ජීවිතය පුද කළා.

යොහන්ගේ පිවිතුරු අරමුණ නම්, මෙම සුභාරංචිය තුළින් සියල්ලන් යේසුව විශ්වාස කර, පිළිගෙන, එතුමගේ වචනය පිළිපැද සදාකාල ජීවනය ලැබීමය.

මගේ යාඥාව වන්නේද යොහන් විසින් ලියූ මෙම සුභාරංචිය තුළින් යේසුව විශ්වාස කර, ඔබගේ ජීවිතයට එතුමව ඔබගේම ගැළවුම්කරු හා ස්වාමින් ලෙස පිළිගන්නා ලෙසටය.

යේසුස් ජීවනයයි. එමනිසා, සදාකාලයෙන් සදාකාලයට එතුමගේ එම ජීවනය බෙදාගැනීම පිණිස යේසු අද ඔබව කැඳවයි ඔබගේ පරණ ජීවිතය අත්හැර, යේසුව ඔබ පිළිගන්නා බව, එතුමට අද ඔබට කීමට පුළුවන එතුමගෙන් ඔබ ලබන නව ජීවනය නිසා, යේසුට ඔබ තුති ප්‍රසංසා කරන්න; දිනපතා එතුමා හා සබඳතා ප්‍රීතියෙන් භුක්තිවිඳින්න; යේසුට කීකරුව එතුමා සතුටු වන ලෙස දිනපතා ජීවත් වෙන්න; ආදරයෙන් යේසු ගැන අන් අයටද දන්වන්න. ඔබට මෙන් ඔවුන්ටද යේසු ආදරෙයි

**- විකී ආර්. බෙන්සන් මහත්මිය (Mrs. Vicky R Benson)**



# දේව වචනය ඉගෙනගන්නේ කෙසේද

01. දේව උපකාරය සඳහා යාඥා කරන්න - බයිබලයෙන් ඉගෙනගන්නා දෙය වටහාගැනීමට දේව උපකාරය ඔබට අවැසියි. ගීතාවලිය 119:18 යාඥාවක් ලෙස ගන්න: "ඔබගේ ව්‍යවස්ථාවෙන් පුදුම දෙය දක්නා පිණිස මාගේ නෙත් පහදා දෙන්න ”

02. නිහඬ තැනකට වී බයිබල් පද කියවන්න - ඔබගේ සිතට තදින් කා වදින පද ලකුණු කරන්න. එතුමගේ වචනය තුළින් ඔබට දෙවිඳුන් කථා කරන බව මතක තබාගන්න.

03. අසා ඇති ප්‍රශ්නවලට බයිබල් කොටස්-වලින් පිළිතුරු ලියන්න.

04. එම පිළිතුරු හරිදැයි දැනගැනීමට පිටුපස ඇතුලු කවරයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

05. කටපාඩම් කිරීමට දී ඇති පද ඉගෙනගන්න - එම පද හා සඳහන් කිරීම් මතකයේ රැඳෙන තුරු සිතැතිව කියවන්න. ඔබ සමග ගෙන යාම පිණිස එම පද හා සඳහන් කිරීම් කාඩ් පතක ලියා තබන්න. පහසුවෙන් මතක තබාගැනීම පිණිස දිනපතා ඒවා කියවන්න. වැරදි ඇත්දැයි දැනගැනීම පිණිස මිතුරෙකුට ඒවා කියවන්න. එහෙමත් නැත්නම් මතකයෙන් ඒවා ලියා, හරිදැයි බැලීම පිණිස බයිබලය සමග සසඳා බලන්න. ඔබ පද හොඳින් දන්නා මුත්, සතියකට එක් වරක්, සති හතක කාලයක තුළද ඉන්පසු මසකට වරක්වත් ඒවා නිරීක්ෂණය කරන්න (නැවත කියවන්න). මෙම "යහපත් අමිල වස්තුව" ඔබගේ සිතේ තැන්පත් කරගන්නා විට ඔබගේ සිතුවිලි, කතා හා ක්‍රියා පුදුම අයුරින් වෙනස් වෙයි. කටපාඩම් කිරීම පිණිස ඔබ කැමති වෙනත් පද ද ඔබම තෝරාගන්න.

06. ඔබ කියවූ, ඉගෙනගත් හා කටපාඩම් කළ "දේව වචනය" මෙනෙහි කරන්න. දිවා රෑ දේව වචනය මෙනෙහි කරන්නන්ට විශේෂ පොරොන්දු දෙවිඳුන් දී ඇත.


> ***මෙම ව්‍යවස්ථා පොත කියවීම ඔබේ කටින් පහ නොවේවා. මෙහි ලියා ඇති සියල්ල කරන්ට බලාගන්නා පිණිස දිවා රෑ ඒ ගැන මෙනෙහි කරන්න. එවිට ඔබේ මග සඵල වී ඔබට යහපතක්ම සිදුවෙයි.***
> - යෝෂුවා 1:8

> ***ඔහුගේ මහත් ප්‍රීතිය ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහිය. ඔහු එම ව්‍යවස්ථාව දිවා රෑ මෙනෙහි කරයි. ඔහු දිය ඇළ අසළ හිටවූ, නියම කලට පල දරන, නොමැලවෙන, කොළ ඇති ගසක් හා සමානය. ඔහු කරන සියල්ලද සඵල වෙයි.***
> - ගීතාවලිය 1:2,3

07. දෙවිඳුන් කියන සියල්ල ක්‍රියාවට දමන්න - යාකොබ් 1:22 මෙසේ කියයි: "නමුත් ඔබලා ඔබලාවම රවටාගනිමින් වචනය අසන්නන් පමණක් නොවී, එය පිළිපදින්නන්ද වෙන්න." වචනය අසා එය පිළිනොපදින මිනිසාව, වැලි මත තම නිවස හැදූ මෝඩ මිනිසෙකුට, යේසු ඔහුව සමාන කළා. සුළඟ සමග වැසි හා ගං වතුර පැමිණ, වැලිමත තැනූ එම ගෙය බිම ඇද දැම්මා. නමුත් යේසු සමිඳුගේ වචනය අසා එය පිළිපදින පිරිමියා හෝ ස්ත්‍රිය හෝ පිරිමි හෝ ගැහැණු ළමයාව, තම නිවස පර්වතයක් මත හැදූ නුවණින් පූර්ණ අයෙකුට සමාන කළා. එය පර්වතයක් මත ගොඩනගා ඇති බැවින් සුළං සමග කොපමණ වැසි හා ගං වතුර පැමිණියද ඔහුගේ නිවස හොසෙල්වී තිබුණා. අප ආත්මිකව වැඩෙමින් තව තවත් දෙවිඳුන්ව හඳුනාගැනීමට ඇවැසි නම් දෙවිඳුන් කියන දෙය අප කළ යුතුමයි. ඔබ කිරීමට සැලසුම් කරන දෙය ලියන්න. එය කරන්න. දෙවිඳුන් ඔබ යමගයි. එතුමා උපකාර වෙයි.

08. දේව වචනය තව අයෙකු හා බෙදාගන්න - ඔබ ඉගෙන ගත් දෙය, ඔබගේ පවුලේ අය සමග බෙදාගැනීමට ඔබ සතුටු ඇති. ද්විතීය 6:7 මෙසේ කියයි: "ඒවා ඔබේ දරුවන්ට හොඳින් උගන්වා, ගෙයි ඔබ ඉන්නා විටද, මග යන විටද, ඔබ සයනය කරන කලද, නැගිටින කලද ඒවා හොඳින් උගන්වන්න."

# 1 යේසුස් ක්‍රිස්තුස්ගේ සුවිශේෂ හැඳින්වීම



### යොහන් 1:1-18

1පටන්ගැන්මේදී වාක්‍යාණෝ සිටිසේක.
වාක්‍යාණෝ දෙවියන් සමග සිටිසේක.
වාක්‍යාණෝ දෙවියන්ව සිටිසේක.
2පටන්ගැන්මේදී එතුමා දෙවිඳුන් සමග
සිටිසේක. 3එතුමා විසින් සියල්ල සාදන
ලදී. සාදන ලද කිසිවක් එතුමා නොමැතිව
සාදන නොලදී. 4එතුමා තුළ ජීවනය
තිබුණේය.ඒ ජීවනය මිනිසාගේ ආලෝකය
විය. 5ආලෝකය අඳුරේදී බබළයි. අඳුර
එය ග්‍රහණය නොකළේය. 6දෙවිඳුන් වෙතින්
එවන ලද යොහන් නම් මිනිසෙක් විය.
7සියල්ලන් විසින් අදහන පිණිස, ආලෝකය
ගැන සාක්ෂි දැරීමට සාක්ෂියක් පිණිස ඔහු
ආවේය. ඔහු ඒ ආලෝකය නොව, ඒ
ආලෝකය ගැන සාක්ෂි දෙන පිණිස ආ
තැනැත්තාය. 9ලෝ එන සියලු මිනිසුන්
ආලෝකමත් කරන සැබෑ ආලෝකය, ඒ
ආලෝකයයි. 10එතුමා ලෝ සිටිසේක.
ලොවද එතුමා විසින් සාදන ලදී; නමුත්
ලෝකයා එතුමා හඳුනා නොගත්හ. 11එතුමා
සිය සෙනග වෙත ආසේක. එතුමගේම
සෙනග එතුමව පිළිනොගත්හ. 12නමුත් යම්
පමණ දෙනෙක් එතුමා පිළිගත්තද, එනම්
එතුමගේ නාමය කෙරෙහි අදහාගන්නෝද,
ඔවුන්ට දේව දරුවන් වීමට එතුමා බලය
දුන්සේක. 13 ඔවුහු ලෙයින්වත්, මංසයේ
කැමැත්තෙන්වත්, මිනිස් කැමැත්තෙන්වත්
උපන් අය නොව, නමුත් දෙවියන්ගෙන්ම
ඉපදී සිටිති, 14තවද වාක්‍යාණෝ
මාංසවත්ව, කරුණාවෙන්ද, සැබෑවෙන්ද
පූර්ණව අප අතරේ වාසය කළසේක.
පියාණන්වහන්සේ වෙතින් වූ ඒකජාතක
පුත්‍රයාණන්ගේ මහිමය අප දුටුවෙමු.

15යොහන් එතුමා ගැන සාක්ෂි
දෙමින්: මට පසුව එන තැනැත්තා මට
පළමුව සිටිය බැවින් ඔහු මට වඩා උතුම්ව
සිටිනසේක කියා මා කීවේ යම් කෙනෙකු
ගැනද, ඒ මොහුමයි හඬනගා කීවේය.
16කුමක් හෙයින්ද එතුමගේ පූර්ණත්වයෙන්
අප සියල්ලන්ම අනුග්‍රහයෙන් අනුග්‍රහය
ලබා ඇත. 17මක්නිසාද ව්‍යවස්ථාව
මෝසෙස් විසින් දෙන ලදී, නමුත් අනුග්‍රහයත්
සැබෑවත් යේසුස් ක්‍රිස්තුස් තුළින් අවේය.
18කිසිවෙක් කිසිවිටෙක දෙවියන් දැක නැත.
පියාණන්ගේ ළයේ සිටින ඒක ජාතක
පුත්‍රයාණන්ම එතුමව ප්‍රකාශ කළසේක.

# ඔබ කළ යුතු දෙය

**අ.** සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න. පිළිතුරු දීමට අපහසු නම්, නැවත ඒම බයිබල් කොටස් කියවන්න.

01. වාක්‍යාණෝ නම් කවුරුන්ද? ............................................(පළමු පදය)

02. වාක්‍යාණෝ සිටියේ කොහේද? .......................................................(1)

03. වාක්‍යාණෝ තුළ තිබුනේ මොනවාද? ....................................(4)

04. කුමක සිට ආලෝකය බබළයිද?.......................................................................................(5)

05. ආලෝකය කෙරෙහි සාක්ෂි දැරීමට දෙවියන් කවුරුන් එව්ද? ............................... නම් මිනිසෙක්. (6)

06. යේසුව පිළිනොගත්තෝ කවුරුන්ද? එතුමගේම ............................................(11) (ජාතිකයක් ලෙස, දෙවියන් විසින් තෝරාගත් ඉශ්‍රායලයම යේසුව පිළිගත්තේ නැත)

07. යේසුව පිළිගත් අයට එතුමා දුන් බලය කුමක්ද ?........................... .......................................... වීමට බලය. (12)

08. දෙවියන්ගෙන් ඉපදී සිටින අය ......................... .................................. කැමැත්තෙන්වත් .......................... කැමැත්තෙන්වත් ඉපදී නැත. නමුත් ............................................. ඉපදී සිටියි. (13)

[යමෙක් දේව දරුවෙක් වීම, දෙවියන් විසින්ම කරන භාස්කමකි. ක්‍රිස්තියානි මාපියන්ට ඉපදීමෙන් එය සිදු නොවෙයි; එවැන්නක් සිදුවිය යුතු නිසා හෝ එය ඔබට සිදු නොවෙයි; තව කෙනෙකුගේ උවමනාව පිණිස ඔබ "නැවත ඉපදිය" (ආත්මිකව) යුතු නිසා හෝ එය සිදුනොවෙයි. මෙම නව උපත (ආත්මිකව) දෙවියන්ගේම අදරුති ක්‍රියාවකි]

09. වාක්‍යාණෝ කෙසේ පැමිණියේද? ...............................(14)

10. වාක්‍යාණෝ වාසය කළේ කා අතරේද ? ...................................අතරේ (14)

11. අප තුළ ක්‍රිස්තුස් සිටියි නම් අපට ලැබී ඇති දෙයාකාරය කුමක්ද? එතුමගේ ......................................... අප සියල්ලන්ම .................................. ............................. ලබා ඇත. (ආසිරි පිට ආසිරි) (16)

12. කිසිවෙක් දෙවියන් දැක නැති නිසා, එම දෙවියන් කවුරුන්ද යත්, අපට පෙන්වීම පිණිස ආවේ කවුද? ඒකජාතක ..........................................(18)

[යේසු සදාකාල දෙවියන්මයි. එමනිසා එතුමට එකවිට පොළොවිද ස්වර්ගයේද සිටීමට පුළුවන. (18 පදය පළමු පදය හා සසඳන්න)].

**ආ.** මෙම පදය ලියා කටපාඩම් කරන්න: යොහන් 1:12

## යේසුස් දෙවියන්මයි. එතුමා මාංසාකාරයෙන් ආවේය

යේසුව පිළිගෙන එතුමගේ නාමය කෙරෙහි විශ්වාස කිරීමට පෙර, යේසු කවුරුදැයි අප දැනගත යුතුය. දෙවියන් අති ශුද්ධය. කිසිවෙකුට එතුමා බැලීමට බැරි තරමට දෙවිඳුගේ තේජස එපමණටම දීප්තිමත්ය. එබැවින් දෙවිඳුන් පෙන්වීමෙහිලා යේසු අප වෙත පැමිණි බව 18 පදය පෙන්වා දෙයි.

මිනිසා පව්කාරය. එනිසා ඔහු ආත්මිකව අන්ධකාරයේ ජීවත්වෙයි. මෙම අන්ධකාර ලොව මිනිසව දෙවියන්ගෙන් සොරාගෙන, ඔහුව එතුමගෙන් වෙන්කර ඇත. නමුත් මෙම අඳුරට ආලෝකය නැති කරන්නට බැරි බව පස්වන පදය අපට උගන්වයි.

බයිබලය මෙසේ කියයි; "දෙවියන් අලෝකයයි. එතුමා තුළ කිසිම අඳුරක් නැත" (1 යොහන් 1:5). යේසු දෙවියන් "සැබෑ ආලෝකයයි" (9 පදය). මිනිසා සැබවින්ම කවුරුන්ද යත් මෙම සැබෑ ආලෝකය තුළ ඔහුට ඔහුවම පෙනෙයි - පවුකරුවෙක්. තවද මෙම සැබෑ ආලෝකය තුළ, සැබවින්ම දෙවිඳුන් කවුරුද යත් දැකගැනීමට පුළුවන. එමෙන්ම මිනිසා සැබවින්ම කුමක් විය යුතුද යන්නද පෙන්වා දෙයි.

අපට දෙවිඳුන් පෙන්වන පිණිස සැබෑ ආලෝකය (යේසු) මෙම අන්ධකාර ලොව තුළ දීප්තිමත් ආලෝකයක් වීම කොපමණ යහපත්ද? එක් කුඩා ගැහැණු දරුවෙක් මෙසේ කීවා: "දෙවියන් ගත් හොඳම පිංතූරය තමයි යේසු." ඇත්තෙන්ම යම් කෙනෙකුට පෙනෙන, ඇසෙන හා ස්පර්ශ කිරීමට ඇති දෙවියන්ගේ පිංතූරය යේසුමයි.

මිනිසුන් අතරේ යේසු වාසය කළා. මෙම 14 පදයේ ඇති "වාසය කළා" යන්නෙහි තේරුම "මණ්ඩපයක්" වූ බවයි. යේසු අප අතරේ "මණ්ඩපයක්" වුවා. පරණ තෙස්තමේන්තුවේ ඇති "මණ්ඩපය" නම්, ඈත ඉතිහාසයේ සිටි ඉශ්‍රායෙල් සෙනඟ තැනින් තැන යන විට ගෙන ගිය, දෙවියන්ගේම සැලැස්ම අනුව හැදූ කුඩාරමක් වැනි "දේවස්ථානයයි". ඇත්තෙන්ම යේසු අප අතරේ "මණ්ඩපයක්" නැත්නම්

දේවස්ථානයක් වුනා. ස්වාමි වූ දෙවිඳු තම තෝරාගත් සෙනඟ අතරේ වාසය කළ මණ්ඩපය, පසුව යෙරුසලමේ මාළිගාව වුනා. ඉශ්‍රායෙල්වරු පව් කිරීමට පටන්ගත් පසු දේව අභිමුඛයේ තේජස එයින් නික්ම ගියා. දැන් යේසුස් ක්‍රිස්තුස් තුළ, එතුමගේ සෙනඟ අතරේ මණ්ඩපයක් වීමට දෙවිඳු නැවත පැමිණ ඇත. බොහෝ දෙනෙක් එතුමව අඳුනානොගැනීම දුකට හේතුවකි. නමුත් දෙවියන් තුළ විශ්වාස කළ සියල්ලෝම, යේසු ලෝ ආ කළ (14 පදය) දෙවියන්ගේ එම තේජස දුටුවා.

## දේව වචනය යේසුස්ය

බයිබලය මෙසේ කියයි: "ඔබගේ වචනය මාගේ පාදයන්ට පහනක්ය, මාගේ මාවතට ආලෝකයක්ය" ගීතාවලිය 119:105. "දේව වචනය" ඒ, යේසුගේ තවත් නමකි(1 පදය, 14 පදය හා සසඳා බලන්න). දෙවිඳු ලියූ ජීවමාන වචනය බයිබලය වේ. දෙවිඳුගේ ඒ ජීවමාන වචනයේ ජීවනය යේසු වේ. ඒ ඇයිද යත්, දෙවිඳු එතුමා ගැන අපට එළිදරව් කරන්නේ යේසු තුළින් නිසාය.

"ආදි කාලයේදී බොහෝ කොටස්වලින්ද, විවිධ ක්‍රමවලින්ද, දෙවිඳු ප්‍රොපේතවරු ලවා පියවරුන්ට කතා කර, මෙම දවස් අගදී සිය පුතුනුවන් ලවා අපට කතා කළේය" - හෙබ්‍රෙව් 1:2[අ]

## දෙවියන්ගේ ජීවනය යේසුස්ය

අප හදවත්වලට යේසුව පිළිගත් කළ, අප දේව දරුවන් වන්නේ ඇයිද කියා ඔබ සිතා බැලුවද? ඒ, "එතුමා තුළ ජීවනය තිබූ නිසයි" (4 පදය).

සියලු ජීවීන් යේසුම මවා ඇති බව පළමුව අපට පෙනී යයි. (3 හා 10 පද) "එතුමා උදෙසා එතුමා විසින්ම සියල්ල මවන ලදී - සියල්ලන්ට පළමුව එතුමා සිටීය. සියල්ලද එතුමා තුළ පවතියි" - කොලොස්සි 1:16[ආ] 17. සියලු ජීවීන්ගේ උල්පත, ජීවමාන මැවුම්කාර, එකම දෙවිවූ යේසුස්මයි. සියලු ජීවිතද එතුමා පෝෂණය කරයි. "සියල්ලන්ට ජීවිතයද, හුස්මද........ එතුමා දෙන්නේය. මක්නිසාද, අපි එතුමා තුළ ජීවත්වෙමු, හැසිරෙමු, පැවතෙමු" - ක්‍රියා 17:25[ආ], 28[අ]

මැවීමේදී, මිනිසාගේ කායික පැවැත්මට දෙවිඳු ජීවන හුස්ම හෙලූ විට, මිනිසා ජීවමාන ප්‍රාණයක් වුනා. එලෙසම යේසු වෙත එන සියල්ලන්ට සදාකාල ජීවනය දෙන පිණිස එතුමට බලය ඇත. (යොහන් 17:2) "පුතුනුවන් ඇත්තාට ඒ ජීවනය ඇත, පුතුනුවන් නැත්තාට ඒ ජීවනය නැත" - 1 යොහන් 5:12

යේසුව පිළිගෙන, එතුමා තුළ සියලු විශ්වාසය තැබූ ඔබට මෙම නව ජීවනය (ආත්මික) ලැබී ඇද්ද? එසේ නම් ඔබ, සදාකාල ජීවනය උරුමකරගත්,

දෙවිඳු සතු දේව දරුවෙකි. තව තවත් ඔබ එතුමගේ ආලෝකය තුළ පා නගමින්, එතුමගේ ජීවනය ඔබ තුළ අත්දකිනා විට, වැල නොකැඩී එන ආසිරි භුක්තිවිඳීමට ඔබට පුළුවන (16 පදය). ඔබේ ගැළවුම්කරු ලෙස ඔබ තවමත් යේසුව පිළිගෙන නැද්ද? එසේනම් ඒ සාමලත් නව ජීවනය සමග ඔබ ජීවිතයට එන ලෙස විශ්වාස සිතින් යේසුට කියන්න - යේසුගේ සදාකාල ජීවනය, ඔබටද අයිතිය.

කවුරු හෝ ඔබ නිවසේ දොරට තට්ටු කරනවා ඔබ අසා ඇති. එහෙම නේද? මෙදැන් ඔබගේ හදවත නැමැති දොරට තට්ටු කරමින් යේසු ඔබ ලඟ සිටියි. "යමෙක් මාගේ හඬ අසා දොර අරියි නම්, මම ඔහු තුළට ඇතුල් වෙමි" - එළිදරව් 3:20


## 2 යොහන් බෞතීස්ත යේසුගේ මාර්ගය සුදානම් කරයි



**යොහන් 1:19-34**

19ඔබ කවරෙක්දැයි යොහන්ගෙන්
ඇසීමට යුදෙව්වරු විසින් යෙරුසලමේ
සිට පූජකයන්ද, ලෙවියන්ද යැවූ කල
ඔහුගේ සාක්ෂිය මේය. 20ඔහු නොසඟවා
ඇත්ත කියමින්: මම ක්‍රිස්තුස් නොවෙමි
කීය. ඔවුහුද: එසේනම් කුමක්ද? 20ඔබ
එළියා දැයි ඔහුගෙන් ඇසූහ. එසේ නැත
කියා ඔහු කීය. 21ඔබ අනාගතවක්තෘදැයි
ඇසූ කල, නැත කියා ඔහු උත්තර
දුන්නේය. 22එබැවින් ඔවුහු කතා කර: අප
එවූ අයට උත්තර දෙන පිණිස ඔබ
කවුරුද? ඔබ ගැනම ඔබ කියන්නේ
කිමෙක්දැයි ඔහුගෙන් ඇසූහ. 23ඔහුද:
මම වනාහි අනාගතවක්තෘ යෙසායා
කී ලෙස සවාමින්වහන්සේගේ මාර්ගය
සමතලා කරන්න කියා වනයේ හඬ
ගසන්නෙකුගේ හඬ වෙමියි කීය. 24ඔවුන්
එවන ලද්දේ ඵරසිවරුන්ය. 25එවිට ඔවුහු
කතා කර: ඉතින්, ඔබ ක්‍රිස්තුස්වත්,
එළියාවත් නොවේ නම් බෞතීස්ම
කරන්නේ ඇයි දැයි ඔහුගෙන් ඇසූහ.
26යොහන් ඔවුන්ට උත්තර දෙමින්: මම
වතුරෙන් බෞතීස්ම කරමි. ඔබලා
නාඳුනන කෙනෙක් ඔබලා මැද සිටියි.
27එනම්, මට පසුව එන තැනැත්තාය.
එතුමගේ වහන්සගලේ පටිය මුදන්ටවත්
මම නොවටිමි කීය. 28මේ දේවල්

**සිදුවුනේ යොහන් බෞතීස්ම කරමින් සිටි යෝර්දානෙන් එගොඩ බෙතානියේදීය. [29]පසුවදා ඔහු තමා වෙත යේසු එනවා දැක කතා කර: අන්න ලෝකයේ පාපය දුරලන දෙවියන්ගේ බැටළු පැටවා! [30]මට වඩා උතුම්ව සිටින තැනැත්තා මට පසුව එන්නේයැයි මා කීවේ මොහු ගැනය. මක්නිසාද මට පළමුව ඔහු සිටීය. [31]මම ඔහු නැඳින සිටියෙමි; නමුත් මා වතුරෙන් බෞතිස්ම කරමින් අවේ ඔහු ඉශ්‍රායෙල් වරුන්ට ප්‍රකාශ වන පිණිස යයි කීය. [32]තවද යොහන් සාක්ෂි දෙමින්: ආත්මයාණන් පරවියෙකු මෙන් අහසින් බසිනවා දුටිමි; එය එතුමා පිට නැවැතුනි. [33]මම ඔහු නැඳින සිටිමි. නමුත් වතුරෙන් බෞතීස්ම කිරීමට මා එවූ තැනැත්තාම**



**මට කතා කර: ආත්මයාණන් යම් කෙනෙකු පිට බැස නවතිනවා ඔබ දකියිද, ශුද්ධාත්මයෙන් බෞතීස්ම කරන්නේ ඔහු යයි මට කීය. [34]මමද එය දැක: ඔහු දෙවියන්ගේ පුතුණුවන් බවට සාක්ෂි දුනිමියි කීය.**

## ඔබ කළ යුතු දෙය

නිසි වචනයෙන් හිස්තැන් පුරවන්න.

01. ................................................................................................හඬ නඟන්නෙකුගේ......................................................ඔහු බව යොහන් බෞතීස්ම කීය (23).

02. අනාගතවක්තෘ යෙසායා කී ලෙස යොහන් බෞතීස්ත මෙසේ කීයඃ. ස්වාමින්ගේ.............................................. ..............................................කරන්න (23)

03. යේසු මට......................................................................................එන තැන්ත්තා වූ නමුදු ඔහු මට......................................................................................සිටි තැනැත්තා බව යොහන් කීය. (27,30)

[මෙහි තේරුම නම් යේසුගේ මාර්ගය පිළියෙල කිරීම පිණිස යොහන් බෞතීස්ත ආ නමුත්, ඉතාමත් උතුම්වූ තැනැත්තා යේසු බවයි. වැඩකරුවෙකු ලෙස යේසුගේ වහන්සගලවත් ගලවා දැමීමටවත් ඔහු නොවටිනා බව යොහන්ම කීවා. ඒ, යේසු කොපමණ උතුම්ද යත් යොහන් දැන සිටිය නිසාය.]

04. අන්න........................... ...........................දුරලන........................... ...........................

කියා එතැන සිටින මිනිසුන්ට යොහන් යේසුව පෙන්වීය. (29)

05. යොහන් මිනිසුන්ට වතුරෙන් බෞතීස්ම කිරීම පිණිස අවේ, යේසු .......................................... ප්‍රකාශ වන පිණිසය (31)

06. දෙවියන්ගේ ආත්මය......................................................................මෙන් පැමිණ යේසු පිට නැවතුන නිසා, යේසු දේව පුතුනුවන් බව යොහන් දැන සිටියා (32) තවද.......................................................................................බෞතීස්ම කරන්නේ යේසු බවට එය සාක්ෂියක්ද වුනා. (33)

# යේසුගේ මාර්ගය පිළියෙල කිරීම

දෙවියන් විසින් තෝරාගත් සෙනඟ වූ ඉශ්‍රායෙල්වරුන්ට දෙවියන්ගෙන් පණිවුඩයක් ගෙන ඒම පිණිස අවුරුදු 400 කාලයක් මුළුල්ලේ කිසිම අනාගතවක්තෘ කෙනෙක් සිටියේ නැහැ. දේව අවශ්‍යතා හා පොරොන්දු ගැන ඔවුන්ට කියා දීමට එවකට තිබුණේ පරණ ගිවිසුම පමණි. නමුත් දේව ආනුභාවයෙන් පූර්ණ, මිදුම්කරුවෙකු වන මෙසියස් නම් තැනැත්තෙකු ඉශ්‍රායලය පාලනය කිරීමට එන බව ඔවුන් දැන සිටියා. එතුමා කන්‍යාවෙකු තුළින් ඉපදෙන බවත්, ඔහු “එම්මානුවෙල්” එනම්, “දෙවියන් අප සමඟය” යනු ලෙසත්, යෙසායා පෙන්වා දී ඇත (යෙසායා 7:4). තවද ඔහු බෙත්ලෙහෙමේ ඉපදී, ඉශ්‍රාලයේ පාලකයෙක් වන බවට මීකා කියා ඇත (මීකා 5:2).

ස්වාමීන්ගේ ඒමට සූදානම් වෙන්න කියා යොහන් බෞතීස්ත දේසනා කරනා විට, එම සෙනඟ මවිතයටත්, සතුටටත් පත්වුනා කියා ඔබ සිතනවද? මෙම සෙනඟ සූදානම් වෙන්නේ කෙසේද? යොහන් මෙසේ දේසනා කළ බව මතෙව් අපට කියයි: “පසුතැවිලිවෙන්න, මක්නිසාද ස්වර්ග රාජ්‍යය අත ළඟය” මතෙව් 3:2. එවිට බොහෝ අයගේ “පාපෝච්චාරණයෙන්” පසු යොහාන් ඔවුන්ව යෝර්දාන් ගඟේ බෞතීස්ම කළා. යේසුව පිළිගැනීමට අප සිත් සූදානම් කරගන්නේ කෙසේද? පළමුව අප අපේ පාප පිළිගත යුතුය. දෙවනුව අප ඒවට පසුතැවිලි වී ඒවා අත්හැර දැමීමට කැමති විය යුතුය. ඔබත්, මමත් සියලුම වැරදි හා පව්කාර සිතුවිලි, වචන හා ක්‍රියා අත්හැරීමට කැමැති වූ විට, දෙවියන් වෙත ඇති එකම මාර්ගය වන යේසුව, අපේම රජ හා සවාමින් ලෙස පිළිගැනීමට අප සිත් සූදානම් වෙයි. යොහන් වතුරෙන් බෞතීස්ම කිරීම පරණ මිනිසා වළ දමා අලුත් මිනිසෙකු මෙන් නැගිටීමයි. නමුත් ගින්නෙන් දවාලන්ට මෙන් (මතෙව් 3:11, 12) යේසු අපව

පාපයෙන් නිදොස් කර ශුද්ධාත්මයෙන් බෞතීස්ම කිරීම අපට නව දම්ටු ජීවිනයක් දීමයි. (අප තුළ ක්‍රිස්තුස්ගේම ජීවනය). ඔබ ඔබේ පාප දෙවිඳුට කියා දුන්නද?

## දෙවියන්ගේ බැටළු පැටවා යේසුස්ය

දේව සබඳතා පැවැත්වීමේදී බැටළු පැටවකුගේ වැදගත්කම එකල ඉශ්‍රායෙල්වරු දැන සිටියා. මින් අවුරුදු දහස් ගණනකට ප්‍රථම ඉශ්‍රායෙල්වරුන් ඊජීප්තුවේ වහල්කමේ සිටින විට දෙවියන්ගේ මෙම සෙනඟ ඊජීප්තුවෙන් නිදහස්කර යැවීමට එතුමා පාරාවෝගේ සිත පෙළඹුවා. ලක්ෂ 20 පමණ වන මෙම සෙනඟ නිදහස් කර යැවීමට පාරාවෝගේ සිත එකඟ කරගැනීමට වසංගත 10 එවීමට දෙවිඳුට සිදුවුනා. ඉන් දරුණුම හා භයානකම වසංගතය වුයේ, සවාමීන් ඊජීප්තුව හරහා යන විට එක් රැයකදී සෑම පවුලකම කුළුදුලා නැතිවීමය.



නමුත් බේරීමට මඟක් තිබුණා. ඒ අනුව දෙවියන්ට කීකරු වු සියලුම නිවැසියන් ජීවත් වුනා. කැලලක් නැති බැටළු පැටවකු මැරීමට දෙවිඳු අණ කළා. ඒ බැටළු පැටවාගේ ලෙය තම නිවසේ දොර මුදුනේ හා දෙපැත්තේ තැවරිය යුතුව තිබුණා. මෙම ලෙය එම දොරවල්වල තිබෙන දුටු දෙවිඳු එම නිවස “පසුකර” යන නිසා එම මරණ වසංගතය එම නිවසට බලපෑවේ නැහැ. කොපමණ පුදුම සැලැස්මක්ද? එදා සිට ඉශ්‍රායෙල් සෙනඟ එම “පසුකර යෑමේ” මංගල්‍යය හදාරති. තම සෙනඟ බැටළු පැටවකුගේ ලෙය සිය දොරවල්වල තවරා තැබීමෙන් දේව විනිශ්චය ඔවුන්ව “පසුකර යෑමේ” දිනය නොහොත් “පාස්කුව” සැමරීම එම මංගල්‍යය වේ. (මෙම කතාව නික්මයාම 12:1-42 ඇත)මෙම පාස්කුව ක්‍රිස්තියානි සමරන පාස්කුව නොවේ.

යේසුගේ පළමු ප්‍රකට හැඳින්වීම “දෙවියන්ගේ බැටළු පැටවා” වීම කොපමණ විශිෂ්ඨද? අප පාපයට එරෙහිව ඇති දේව විනිශ්චය අපව “පසුකර යාම” නම්, එතුමා හැලූ ලෙය අප හදවත නැමැති දොරට තවරා ගැනීමය. හෙබ්‍රෙව් 9:22 අපට මෙසේ කියයි: “.......ලේ වැගිරීමක් නැතිව කමා කිරීමක්ද නැත” (පාප කමාව). ලෙවී 17:11 මෙසේ කියයි: “මක්නිසාද සමඟිකමක් කරන්නේ ලෙයය..........”. මෙතෙක් කල් පුජාවක් උදෙසා මැරූ බැටළු පැටවුන් පෙන්නුම් කරන්නේ ලෝ ආ “දෙවියන්ගේ බැටළු පැටවා” දෙසටය. සිය ගැළවුම්කරු ලෙස එතුමව පිළිගන්නා අයට අප

වෙනුවෙන් යේසු හැලූ නිමල ලෙයින් සේදී, ශුද්ධව සිටීමට හැකි වෙයි. “සැබෑවක් සැබවක් ඔබලට කියමි, මාගේ වචනය අසා, මා එවූ තැනැත්තව අදහන්නාට සදාකාල ජීවනය ඇත; ඔහු විනිශ්චයට පත් නොවී, මරණය කෙරෙන් ජීවනයට පැමිණ ඇත” - යොහන් 5:4

යෙසායා 53:7 මෙසේ කියයි: “මරණෝට ගෙන යන බැටළු පැටවකු මෙන්..............”. යේසු ලෝ ආවේ අප පාපය වෙනුවෙන් එතුමගේ නිමල ජීවිතය කැප කරන්නයි. අප පාපය වෙනුවෙන් සිය ලේ හලා, අපේ පාපය දුරුලන “දෙවියන්ගේ බැටළු පැටවා” නම් යේසුට ඔබ තුති ප්‍රසංසා කරන්න. දෙවිඳු එතුමගේ ලේ දකින විට ඔබගේ පාප එතුමට තවත් නොපෙනෙයි; නමුත් දෙවිඳුට ඔබ තුළ පෙනෙන්නේ, අපේ පාපය තමන් පිටට ගෙන, අප නිසා සිය ජීවිතය පිදු යේසුව පමණයි. දෙවිඳුට ප්‍රසංසා වේවා!



**ඔබගේ පාප බරෙන් නිදහස් වීමට ඔබ සතුටුද**
**ලේවල බලේ ඇත, ලේවල බලේ ඇත**
**නපුරට විරුද්ධව ඔබට ජය ඕනෑද**
**ලේවල අනගි බලේ ඇත**

**සමඟිකමක් යනු, යේසුගේ ලෙය අප පාප සෝදා හැර අප දෙවියන් හා එක්කෙනෙක් වීමය**

# 3 යේසුව හඳුනාගැනීම

**යොහන් 1:35 - 49**



35නැවත පසුදා යොහන් සිය
ගෝළයන් දෙදෙනෙකු සමග සිටියදී,
යේසු යනවා දැක, 36අන්න! දෙවියන්ගේ
බැටළු පැටවා කියා කීය. 37ඒ ගෝළයන්
දෙදෙනා ඔහුගේ කීම අසා යේසු පසුපස
ගියහ. 38යේසු හැරී, ඔවුන් පසුපස
එනවා දැක; ඔබලා සොයන්නේ කුමක්
දැයි ඔවුනේගෙන් ඇසීය. ඔවුන්ද:
රබ්බි, ඔබ නැවතී සිටින්නේ කොතනදැයි
ඇසීය (රබ්බි යනු ආචාරිනී අර්ථයයි).

39ඇවිත් බලන්නැයි එතුමා ඔවුන්ට කීය.
එසේ ඔවුහු ගොස් එතුමා සිටින ස්ථානය
දැක, එදින එතුමා සමග නැවතුනහ. ඒ
වෙලාවේ දසවෙනි පැය පමණ විය.
40යොහන්ගේ කීම අසා එතුමා පසුපස
ගිය දෙදෙනාගෙන් එක්කෙනෙකු නම්
සීමොන් පේත්‍රුස්ගේ සහෝදරවූ ඇන්ද්‍රෑය.
41ඔහු පළමුකොට තම සහෝදරවූ සීමොන්
දැක: අපට මෙසියස් සම්භවීයයි ඔහුට
කීය (මෙසියස් යනු අර්ථය ක්‍රිස්තුස්ය.) 42ඔහු
යේසු ළඟට සීමොන් කැඳවාගෙන ආවේය.
යේසු ඔහු දෙස බලා: ඔබ යොහන්ගේ පුතුනු
සීමොන්ය. ඔබට කේපස් කියනු ලබන්නේ
යයි කීය (එහි අර්ථය, පේත්‍රුස්).

43පසුවදා එතුමා ගලීලයට පිටත්ව
යෑමට අදහස් කර පිලිප් දැක: මා අනුව
එන්න කියා ඔහුට කීය. 44පිලිප් වනාහි
ඇන්ද්‍රෑ සහ පේත්‍රුස් විසූ බෙත්සෙයිදා නුවර
වැසියෙක්ය. 45පිලිප් නතානියෙල් දැක: යම්
කෙනෙකු ගැන මෝසෙස් විසින්
ව්‍යවස්ථාවෙත්, අනාගතවක්තෘවරුන්
විසිනුත් ලියන ලද එතුමා අපට හමුවිය.
එතුමා යෝසප්ගේ පුත්‍රවූ නාස්රිය යේසුස්
යයි ඔහුට කීය. 46නතානියල්ද: නාසරත්
නුවරින් යම් යහපතක් එන්ට පුළුවන්දැයි
ඔහුට කීය. 47ඇවිත් බලන්නැයි පිලිප් ඔහුට
කීය. යේසුස් නතානියෙල් තමන් වෙත එනවා
දැක: මෙන්න සැබවින්ම ඉශ්‍රාලයෙක්, මොහු
තුළ කිසි වංචාවක් නැතැයි ඔහු ගැන
කීය. 48ඔබ මා අඳුනන්නේ කෙසේදැයි
නාතානියෙල් එතුමට කීය. යේසු උත්තර
දෙමින්: පිලිප් ඔබ කැඳවන්ට පළමුව,
අත්තික්කා ගස යට ඔබ සිටියදී ඔබ දුටුමියි
කීය. 49නතානියෙල් එතුමට උත්තර දෙමින්:
රබ්බි, ඔබ දෙවියන්ගේම පුතුනුවන්ය.
ඔබ ඉශ්‍රායල්වරුන්ගේ රජු යයි කීය.



## ඇවිත් බලන්න

"අන්න දෙවියන්ගේ බැටළු පැටවා" යොහන් කී කළ ඔහු සමග සිටි ඔහුගේම ගෝලයන් දෙදෙනාට යේසු ගැන දැනගැනීමට ඉමහත් කුතුහලයක් ඇති වුනා. යේසු කොහේ වාසය කරයිද යත් දැනගැනීමට ඔවුහු තිරණය කළා. "ඇවිත් බලන්න" කියා යේසු ඔවුන්ට කීවා. ඔවුහු යේසු සමග මොනතරම් සාකච්ඡාවක යෙදුනද යත් අපට සිතා ගන්නටත් බැරි තරම්ය! ඔවුහු යේසු ගැන බොහෝ දේ ඉගෙන ගන්න ඇති බව පෙනී යන්නේ, ඉන් එක්කෙනෙක් වූ අන්ද්‍රෑ, ඔහුන්ට මෙසියස් හමුවූ බව ඔහුගේ සහෝදරයා වන පේත්‍රුස්ට කී බැවිනි.

මෙසියස් නම් "ආලේප කළ තැනැත්තා" යනුයි. එනම් ඉශ්‍රායෙලය පාලනය කිරීමට දෙවියන් විසින් එවන ලබන අනාගතවක්තෘය, පූජකයාය, රජුය. ලෝ එන මෙම විශේෂ තැනැත්තා ගැන පරණ ගිවිසුමේ සිටින බොහෝ අනාගතවක්තෘන් කතා කර තියෙනවා. මෝසෙස්ද එතුමා ගැන ලිවා. දෙවිඳු මෝසෙස්ට මෙසේ කීවා: "මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් ඔබට සමාන අනාගතවක්තෘ කෙනෙක් ඔවුන්ට නැගිටුවා දී, මගේ වචනය ඔහුගේ මුඛයෙහි තබන්නෙමි, මා ඔහුට අණ කරන සියල්ල ඔහු ඔවුන්ට කියන්නේය." - ඓතිය 18:18

පසුව යේසු මෙසේ කීවා: "..................මාගේ පියාණන් මට ඉගැන්වූ ලෙස මේ දේවල් මම කියමි" - යොහන් 8:28[අ]. එම පුද්ගලයන් කොපමණ කුතුහලයකින් ඉන්න ඇද්ද!

යේසු ගැන කුතුහලයක් ඔබටත් තියෙනවද? එතුමා ගැන ඉගෙනීමට ඔබ සතුටුද? යේසු කවුද කියා ඔබ සිතනවද? "ඇවිත් බලන්න" ඒ ඔබට යේසුගේ ඇරයුමයි. ඔබ එතුමා සමඟ සිටිමින්, එතුමගේ වචනයෙන් ඔබට කතා කිරීමට ඉඩ දුන් විට, ඇත්තෙන්ම එතුමා කවුද යත් යේසුම ඔබට කියා දෙයි. "මම සවාමින් බව දැනගැනීමට ඔවුන්ට සිතක් දෙමි. ඔවුන්ද මාගේ සෙනඟ වෙනවා ඇත, මම ඔවුන්ගේ දෙවියන් වන්නෙමි. මක්නිසාද ඔවුන් සිය මුළු සිතින් මා වෙතට හැරෙනවා ඇත" - යෙරමියා 24:7

## යේසු ගැන සාක්ෂි

යමෙක් යේසු වෙත පැමිණ එතුමා කවුද කියා දැනගත් විට, එතුමා ගැන අන් අයට කියා දීමට ඔහු පසුබට වන්නේ නැහැ. ඔහු එසේ කරන්නේ ඔවුන්වද "ඇවිත් බලන්න" ඇරයුම් කරමිනි. යේසුව ඔබ පුද්ගලිකව දන්නවානම්, එතුමගෙන් ඉගෙනගන්නවා නම්, අන් අය සමඟ ඔබ මෙම සුභාරංචිය බෙදාගන්නවද?

යේසු ඔබට කවුරු වේද කියා පහත ලියන්න.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

"ඇවිත් බලන්න" කියමින් තව කෙනෙකු සමඟ ඔබගේ සාක්ෂිය බෙදාගැනීම පිණිස දෙවිඳුගෙන් අවස්ථාවක් ඉල්ලන්න.

# 4 විවාහයකට යේසු සතුට ගෙන දෙයි



යොහන් 2:1-11

[1]තුන්වැනිදා ගලීලයේ විවාහ සරණ මංගල්‍යයක් විය; යේසුගේ මවද එහි සිටිය. [2]යේසුවද එතුමගේ ගෝලයන්වද විවාහ මංගල්‍යයට කැඳවනු ලදහ. [3]මුද්‍රිකපානය ඉවර වූ කළ: ඔවුන්ට මුද්‍රිකපානය නැතැයි යේසුගේ මව යේසුට කීවා. [4]යේසුද: ස්ත්‍රිය, ඔබගෙන් මට කම මොකද? මගේ වේලාව තවම පැමිණ නැතැයි ඇට කීවා. [5]එතුමගේ මව: එතුමා ඔබලට කියන කොයි දෙයක් නමුත් කරන්නැයි මෙහෙකරුවන්ට කීවා. [6]යුදෙව්වරුන්ගේ පවිත්‍රවීම අනුව එක එකේ මෙත්‍රෙ දෙක තුනක් පමණ වතුර අල්ලන ගල් භාජන හයක් එහි තබා තිබුණා. [7]භාජනවලට වතුර පුරවන්නැයි යේසු ඔවුන්ට කීය. ඔවුහු ඒවා කට ළඟටම පිරවූහ. එතුමද: [8]ඉතින් එයින් ගෙන මංගල්‍යයයේ ප්‍රධානියා ළඟට ගෙනියන්නැයි ඔවුන්ට කීය. ඔවුහු ගෙනගියහ. [9]මංගල්‍යයේ ප්‍රධානියා මුද්‍රිකපානය වූ වතුර රස බලා, ඒවා කොතැනින් වීදැයි (වතුර ගෙනා මෙහෙකරුවා දන්නා මුත් ඔහු නොදැන) මනමාලයාට අඬගසා: [10]කවුරුත් පළමුව හොඳ මුද්‍රිකපානයද, මිනිසුන් හොඳටම බීවායින් පසුව බාල මුද්‍රිකපානයද දෙති. ඔබ මේ වන තුරු හොඳ මුද්‍රිකපානය තියාගෙන සිටි යයි ඔහුට කීය. [11]යේසු ගලීලයේ කානාන්හිදී සිය ලකුණුවලින් මෙම පළමුවැන්න කර සිය මහිමය ප්‍රකාශ කළේය. එතුමගේ ගෝලයෝද එතුමා කෙරෙහි අදහාගත්හ.

(මෙත්‍රෙ එකක් ගැලුම් 8 3/4 පමණය.)

## ඔබ කළ යුතු දෙය

මෙම කතාව නිසි වචනයෙන් හිස්තැන පුරවන්න.

01. මෙහෙකරුවන්ට යේසුගේ මව මෙසේ කීවා "...............................................................................................................................". (5)

02. වතුර භාජන පුරවන්නැයි යේසු මෙහෙකරුවන්ට කී විට ඔවුන් ඒවා ............ ..........................පිරවූහ. (7)

# සතුටට ඇති ප්‍රධාන දෙය කීකරුකමයි

යේසු හාස්කම් කරනවා මින් ප්‍රථම යේසුගේ මව දැක නැත. නමුත් ඈ දැන සිටියා උපකාර කරන පිණිස යේසු යමක් කරන බව. දැන් අප දන්නවා, මෙම විවාහයේදී පාවිච්චි කල මුද්‍රිකපානය, මිනිසුන්ව මත් කරන මුද්‍රිකපානය නොවන බව. අද මෙන් මත් වන මුද්‍රිකපානය නොවෙයි. එදා තිබුණේ මුද්‍රික පලවලින් හදන ඉතා රසවත් බීමක් නිසා ඒවා විගස ඉවරවීම පුදුමයක් නෙමේ!



ඔබ ක්‍රිස්තියානියෙකුද? ඔබ යම් දෙයකින් "හිස්වී" තිබෙනවද? දවස අවසන් වීමට ප්‍රථම ඉවසීමෙන් ඔබ "හිස්වී" තිබෙනවද? මෙම මොහොතේ ඔබේ හදවත සතුටින් හෝ ආදරයෙන් හිස්වෙලාද? එය කුමක් වුවත් ඔබට උපකාර කිරීමට යේසුට පුළුවන්. හාස්කමකින් ඔබ ජීවිතයට ආසිරි ගෙන ඒමට එතුමා බලා සිටිනවා. ඔබගේ ක්‍රිස්තියානි ජීවිතය සතුටෙන්, සාමයෙන් හා ආදරයෙන් හිස්ව දවස පුරාම ඔබ පැකිලී නොසන්සුන්ව සිටීම එතුමගේ කැමැත්ත නොවෙයි. යේසු මෙසේ පොරොන්දුවී ඇත: "එතුමා කෙරෙහි අදහන්නා ලැජ්ජාවට නොපැමිණේ" - රෝම 9:33[අ]. නමුත් ඔබ දැනගත යුතු රහසක් තියෙනවා! ආසිරිවලට ඇති ප්‍රධානම දෙය කීකරුකමයි. "එතුමා ඔබලට කියන කොයි දෙය නමුත් කරන්න". අප කීකරු වු විට හාස්කමක් කිරීමට යේසුට පුළුවන. එතුමා තුළ අපේ විශ්වාසය තහවුරු කරන්නේ අපේ කීකරුකමය.

ඔබට වැරදි කළ කෙනෙකුට ඔබ සමාවී තිබෙනවද? "මක්නිසාද ඔබලා මිනිසුන්ට ඔවුන්ගේ වරද කමා කරන්නහු නම්, සවර්ගයේ සිටින පියාණන්ද ඔබලගේ වරද ඔබලටත් කමා කරයි. නමුත් ඔබලා මිනිසුන්ට ඔවුන්ගේ වරද කමා නොකරන්නේ නම්, ඔබලගේ පියාණන්ද ඔබලගේ වරද කමා නොකරයි" - මතෙව් 6:14-15. ඔබ වස්තුව එකතු කරන්නේ සවර්ගයේද? "නමුත් ඔබලට සවර්ගයේ වස්තු රැස්කරගන්න; එහිදී කාවෝවත්, මලකඩවත් ඒවා නාස්ති නොකරති, සොරු උමං කැන ඒවා සොරා නොගනිති" - මතෙව් 6:20. සමහරවිට දෙවිඳුන්ගේ වැඩවලට උපකාර වීමට ඔබට නොහැකිව ඇත. ඔබගේ වුවමනා සියල්ල යේසු දන්නා බව සිත් බැඳගන්න. එතුමව විශ්වාසකර, එතුමට මුළුමනින්ම කීකරුවෙන්න. "........මා විසින් ඔබලට අහසේ කවුළු ඇර ඉඩ මදිවන තරම් ඔබලට ආශිර්වාදයක් වගුරුවා දෙන්නේ නැද්ද කියා එයින් මා සොදිසි කර බලන්න" -මලාකි 3:10[අ].

"ආත්මයෙන් පිරී ඉන්න" කියා අද ඔබට දෙවිඳු කියයි (එපීස 5:18). දිනපතා

ඔබව එතුමගේ ආත්මයෙන් පිරවීමට දෙවිඳුට ඔබ ඉඩ නාරියි නම් ඔබට හෝ කිසිම ක්‍රිස්තියානියෙකුට හෝ සතුටින් පූර්ණ ජීවිතයක් ගත කිරීමට බලාපොරොත්තු විය නොහැක.

සමහරවිට ඔබ ක්‍රිස්තියානියෙකු නොවීමට පුළුවන. සමහරවිට පාළුවූ ජීවිතයක් ගත කරනවාත් ඇති. නමුත් ඔබටත් පුළුවන් යේසුගේ අණට කීකරුවෙන්න. එන්න යේසු වෙත මෙදැන්. "මා අවේ ඔවුන්ට ජීවනය ලැබනෙ පිණිසත්, එය අධික ලෙස ලැබෙන පිණිසත්ය"- යොහන් 10:10. එම මෙහකරුවත් සම්පූර්ණයෙන් කීකරු වුනා. ඔවුන් එම වතුර භාජන බාගයකට හෝ තුන්කාලට පිරෙව්වේ නැහැ. නමුත් "කට ළඟටම" පිරෙව්වා. ඔබගේ මුළු සිතින් ඔබ දෙවිඳුට කීකරුවූ විට ඔබට සතුට සමඟ ආසිරි වැසිවසියි. "සියල්ලේදී කීකරුවෙන්න. ඔබලට ඔබලගේ විපාකය වූ උරුමය සවාමින්ගෙන් ලැබෙන බව දැන, ඔබලා කරන කොයි දෙය මුත් මිනිසුන්ට නොව සවාමින්ට මෙන් සිතෙන් කරන්න" - කොලොස්සි 3:23,24.

එතුමට කීකරුව ඔබ කළ යුතු දෙයක් යේසු ඔබට කියා තියෙනවාද? එසේ නම් ඇයි එය අදම නොකරන්නේ?

ගෝළයන් එම හාස්කම දුටු විට ඔවුන්ගේ විශ්වාසය තවතවත් වර්ධනය වී ඔවුන් දැඩි ලෙස එතුමා "කෙරෙහි විශ්වාස කළා." ඔබ දේව වචනයට කීකරුව, දෙවිඳු ක්‍රියා කරනවා දුටු විට, ඔබේ ඇදැහිල්ලද දැඩිව වර්ධනය වෙයි. ඇදැහිල්ල අප ශරීරයේ ඇති පේශීන් මෙන්ය. ශරීරය ශක්තිමත් වන්නේ ඒවා ක්‍රියා කිරීමෙන්ය, එනම්, ව්‍යායාම කිරීමෙන්ය. සෑමදින ඇදැහිල්ලෙන් පිය මැනීමට අපි තෝරාගනිමු. "ධර්මිෂ්ඨයා ඇදැහිල්ලෙන් ජීවත් වෙයි" - රෝම 1:17.

**ඇදැහිල්ල = සියල්ල අතහැර මම එතුමව විශ්වාස කිරීම**

# 5 යේසු දේව මාළිගාව පිරිසිදු කරයි



**යොහාන් 2:13-22**

**13 යුදෙව්වරුන්ගේ පාස්කුව ළංව**
**තිබුණි. යේසුද යෙරුසලමට ගියේය. 14 එවිට**
**දේවමාළිවේ ගවයන්. බැටළුවන් හා**
**පරවියන් විකුණනන්ද,මිළ මාරුකරන්නනන්ද**
**වාඩිවී ඉන්නවා දැක, 15 ලනුවලින් කසයක්**
**හදා, බැටළුවන්ද, ගවයන්ද, දේව**

**මාළිගාවෙන් පිටපතට එළවා, මිළ මාරු කරන්නන්ගේ මිළ විසුරුවා, මේස පෙරළා දැමීය. 16 තවද උන්වහනසේ පරවියන් විකුණන්නන්ට කතා කර: මේ දේවල් මෙතනින් ඇරන් යන්න; මාගේ පියාණන්ගේ ගෘහය වෙළදුම් ගෙයක් නොකරන්නැයි කීය. 17ඔබගේ ගෘහය ගැන ඇති ජ්වලිතය මා දවන්නේ යයි ලියා තිබෙන බව එතුමගේ ගොළයන්ට මතක් විය. 18එකල යුදෙව්වරු: ඔබ මේ දේවල් කරන බැවින් මොනා ලකුණක් අපට පෙන්වන්නේදැයි එතුමගෙන් ඇසූහ. 19යේසු ඔවුන්ට උත්තර දෙමින්: මේ මාළිගාව කඩා දමන්න, එය තුන් දවසකින් නැගිටු වන්නෙමියි කීය. 20යුදෙව්වරු කතා කර: මේ මාළිගාව ගොඩනැගීමට සතළිස් අවුරුද්දක් ගත විය, ඔබ එය තුන් දවසකින් ගොඩනගන්නේදැයි කීය. 21එතුමා කතා කළේ සිය ශරීරය නැමැති මාළිගාව ගැනය. එබැවින් එතුමා මෙය කී බව යේසු මළවුන්ගෙන් නැගිට් පසු එතුමගේ ගෝලයෝ සිහිකර, ලියවිල්ලද, එතුමා කී වචනය ද විශ්වාස කළහ.**

# යේසු දත් දෙය

"පාස්කුව" හෝ "පසුකර යාම" කුමක්ද කියා ඔබට මතකද? ඒ ගැන 10 පිටුවේදී අප ඉගෙන ගත්තා. යේසු යෙරුසලමට ගියේ "පාස්කුව" සැමරීමටයි. දේව මාළිගාව තුළ එතුමා දුටුවේ පිළිකුලකි. දෙවිඳුන් නැමදීමට හෝ එතුමා හා හරිගැස්සීමටවත් එය තැනක් වී තිබුණේ නැහැ. එය ක්‍රියාශීලී වෙළඳ පොළක් වී තිබුණා. දේව අභිමුඛය එයින් දුරස්ව තිබුණා. මේ තත්වය දුටු යේසුට තරහ ගියා.

දෙවිඳුට පූජා කිරීමෙහිලා සතුන් මිළට ගැනීම වුවමනා බව සත්‍යයකි. එම වෙළෙන්දෝ වැඩි මිළට විකුණමින්, මිනිසුන්ට වංචා කළා පමණක් නොව, ඔවුන් එම සතුන් දේවමාළිගාව තුළම තියා විකුණුවා. මාර්ක් 11:1 මෙසේ කියයි: "මාගේ ගෘහය සියලු ජාතීන්ට යාඥා ගෘහයකැයි කියනු ලබන්නේ යයි ලියා තිබෙනවා නොවේද? නමුත් ඔබලා එය සොරුන්ගේ ගුහාවක් කළා යයි කීය"

# දේවමාළිගාව යේසුගේ ශරීරයයි

සලමොන් විසින් හැදූ මෙම මනරම් දේවමාළිගාව එකල "සවාමින්ගේ තේජසින් පිරී" තිබුණා. ඉශ්‍රායෙල් සෙනඟ මිථ්‍යා දෙවිවරු අදහා ඔවුන්ට සේවය කිරීමට පටන්ගත් විට, සවාමින්ගේ එම තේජස දේවමාළිගාවෙන් පිටව ගියා, පසුව එය විනාශ කරනු ලැබුවා. ඉන්පසු දෙවිඳු වෙත හැරී ඒමට සිටිය අය විසින් මෙම දේව මාළිගාව නැවත ගොඩනැගුවා. එදවස් දෙවිඳු මෙසේ කීවා: "......... සියලු ජාතීන් ආසාවෙන (මෙසියස්) දෙයද පැමිණෙයි, මේ ගෘහය මම තේජසින් පුරවන්නෙමියි සේනාවල සවාමින් කීය" - හග්ගයි 2:7. මෙතන දී මෙම

දේවමාළිගාව පිරිසිදු කිරීමෙහිලා එම දේවමාළිගාවට යේසු පැමිණෙමින් සිටියි. එපමණක් නොව, මෙහිදී එතුමාගේ ශරීරය දෙවියන්ගේ මාළිගාව බව එතුමා ප්‍රකාශ කළා.


"මක්නිසාද එතුමා තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම් ශරීරාකාරයෙන් වාසය කරයි" - කොලොස්සි 2:7

"............දෙවිඳු මාංසයේ ප්‍රකාශ විය" - තිමෝති 3:16

"බලව කන්‍යාව ගර්භනීයව පුත්‍රයෙකු ප්‍රසූත කරයි; එතුමාට එම්මානුවෙල් යන නම තබනවා ඇත............ඒ නාමයේ අර්ථය නම් "දෙවියන් අප සමඟය යනුයි" - මතෙව් 1:22,23

"....................මේ ලෝකයේ මූලාදෑනීන්ගෙන් කිසිවෙක් නොදනියි. දැන සිටියා නම් ඔවුන් තේජසේ ස්වාමීන්ව කුරුසියේ ඇණගසන්නේ නැත" - 1 කොරින්ති 2:8, 4 වැනි කතාවේදී යේසු සිය තේජස එළිදරව් කල සැටි මතකද (යොහන් 2:11). තේජසේ ස්වාමීන් ඔවුන් සමඟ බවත්, එතුමා යේසු තුළ ජීවමාන බවත්, දේවමාළිගාව පිරිසිදු කිරීමට එතුමාට අයිතියක් ඇති බවත්, එකල යුදෙව් නායකයන් දැන සිටියේ නැහැ.

## දේවමාළිගාව කොහේද අද





"ඔබලා දෙවියන්ගේ මාළිගාව බවද, දෙවියන්ගේ ආත්මය ඔබලා තුළ වාසය කරන බවද නොදනිද්ද?" - 1 කොරින්ති 3:16

සිය හදවත්වලට සැබෑ ලෙස යේසුව පිළිගත් අය තුළ එතුමාගේ ශුද්ධ ආත්මය තුළින් යේසු ඔවුන් තුළ වාසය කරයි! අපගේ ශරීර එතුමාගේ මාළිගාවයි. කොපමණ පුදුම දෙයක්ද එය! "ඔබලාගේ ශරීරය දෙවියන්ගෙන් ලද ඔබලා තුළ ඇති ශුද්ධාත්මයාණන්ගේ මාළිගාව බව නොදන්නෙහිද? ඔබලා ඔබලාට අයිති නැත.

මක්නිසාද ඔබලා මිළකට ගනු ලැබුවහුය. එබැවින් ඔබලාගේ ශරීරයෙන් දෙවිඳුට ගෞරවය කරන්න" - 1 කොරින්ති 6:19,20

නිර්මලව ජීවත්වීම ඉතා වැදගත්ය! අපේ ශරීරවලින් පව් නොකළ යුතුයි. ඒ ඇයිද යත්, අප ජීවිතවලට යේසුව පිළිගෙන නම්, එතුමට අප යාවී ඇති නිසාය. එමනිසා එතුමට විශ්වාසව සිටිය යුතුය. සිය මාළිගාව පිරිසිදු කිරීමට දෙවිඳුට සියලු බලය ඇත. අප ජීවිතය පුරා ඇති එතුමට අප්‍රසන්න කොටස් පවිත්‍ර කිරීමට දෙවිඳුට සියලු බලය තිබේ. එමනිසා එතුමගේ පිරිසිදු කිරීමට සැමවිටම යටත් විය යුතුයි. එතුමගේ වචනය තුළින්, දෙවිඳු අපව පවිත්‍ර කරයි.

"තරුණයෙක් සිය මාර්ගය පවිත්‍ර කරගන්නේ කුමකින්ද? ඔබගේ වචනය අනුව පැවතීමෙන්ය" - ගීතාවලිය 119:9

"අපේ පව් අපි කියා දෙමු නම් අපේ පව් අපට කමා කරන්ටත්, සියලු අධර්මිෂ්ඨකමින් අපව පවිත්‍රකරන්ටත්, එතුමා විශ්වාසව, ධර්මිෂ්ඨ සිටියි" - 1 යොහන් 1:9

"නමුත් එතුමා ආලෝකයෙහි සිටිනා සේම අපිද ආලෝකයේ (එතුමගේ වචනයේ) හැසිරෙමු නම් එකිනෙකා සමඟ අපට පංගුකාරකම ඇත. එතුමගේ පුතුනු යේසුගේ ලෙයද සියලු පාපවලින් අපව පවිත්‍ර කරයි" - 1 යොහන් 1:7

වෙන්වෙන් වශයෙන් සියලුම ක්‍රිස්තියානින්ව එතුමගේ මාළිගාව කරගන්නවා පමණක් නොව, ලෝ වෙසෙන සියලු ක්‍රිස්තියානින් එකතුව ඔවුන් ක්‍රිස්තු යේසුගේ ශරීරය බවද දෙවිඳු ප්‍රකාශ කරියි.

"බොහෝ දෙනෙක් වු අපිද.............ක්‍රිස්තුස් තුළ එකම ශරීරයකි" - රෝම 12:5

"එතුමා සභාව නැමති ශරීරයට හිසව සිටියි" - කොලොස්සි 1:18 අ

"ක්‍රිස්තුස් යේසුස්ම කොනේ ප්‍රධාන ගලවී සිටියි. එතුමා තුළ මුළු ගොඩනැගිල්ල හොඳ හැටියට එකතු කරන ලදුව, සවාමින් තුළ ශුද්ධ මාළිගාවක් සැදීගෙන යයි. එතුමා තුළ ඔබලත් ආත්මයාණන් තුළ දෙවිඳුගේ වාසය පිණිස එකට ගොඩනඟන ලදී" - එපීස 2:20ආ-22

දෙවිඳු වාසය කරන එක් ආත්මයක් කොපමණ විටිනවාද! ඇත්තෙන්ම අප අන් ක්‍රිස්තියානින්ට ඉතා ආදරයෙන් හා කරුණාවෙන් සළකිය යුතුයි. අප ඔවුන්ට සැළකීම, ක්‍රිස්තුස්ට සැළකීමයි.

අපිද පාවුල් සමඟ එකට කියමු: "මගේ ශරීරය කරණකොටගෙන ජීවිතයෙන් වේවා, මරණයෙන් වේවා, ක්‍රිස්තුස් ගෞරවයට පැමිණේවා" - පිලිප්පි 1:20

සැමදින දෙවිඳු සමඟ පිය මනිමින් එතුමගේ අභිමුඛයේ සිටිමින් මාළිගාව නැමැති අප ශරීර යාඥා ස්ථානයක් ලෙස අපි තියාගනිමු. දේව තේජස පහකර, අප ශරීර "සොරුන්ගේ ගුහාවක්" වෙන ලෙස තණ්හාවන්ට හා ආසාවන්ට ඉඩ නොදී අපි සිටිමු.

# 6 නැවත ඉපදිය යුතු කෙසේද යත් යේසු ප්‍රධානියෙකුට කියා දෙයි



යොහන් 3:1-8, 14-21, 36

1යුදෙව්වරුන්ගේ ප්‍රධානියෙකු වූ
නිකොදේමුස් නම් ඵරිසියෙක් සිටියා.
2ඔහු රාත්‍රියේ එතුමා වෙත ඇවිත්: රබ්බි,
ඔබ දෙවියන් කෙරෙන් ආ ගුරුවරයෙක්
යයි අපි දනිමු. මක්නිසාද ඔහු සමග
දෙවියන් නැත්නම් ඔබ කරන මෙම හාස්කම්
කිරීමට කිසිවෙකුට නුපුළුවනැයි කීය. 3යේසු
උත්තර දෙමින්: සැබෑවක් සැබෑවක් ඔබට
කියමි, යමෙක් නැවත නූපන්නොත් ඔහුට
දෙවියන්ගේ රාජ්‍ය දකින්නට නොහැකි යයි
ඔහුට කීය. 4නිකොදේමුස් එතුමට කතා
කර: මිනිසෙක් මහලුව සිටියදී උපදින්ට
පුළුවන් කෙසේද? දෙවන වර මව් කුසට
ඇතුල්ව උපදින්ට පුළුවන්දැයි එතුමට
කීය. 5යේසු උත්තර දෙමින්: සැබෑවක්
සැබෑවක් ඔබට කියමි, යමෙක් වතුරෙන්ද,
ආත්මයෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්ගේ
රාජ්‍යයට ඇතුල්වීමට බැරිය. 6මාංසයෙන්
උපදින දෙය මාංසයය; ආත්මයෙන් උපදින
දෙය ආත්මයය. 7ඔබලා ආත්මයෙන්
උපදින්ට ඕනෑ යයි මා කීවාට පුදුම
නොවන්න. 8සුළඟ කැමති තැනකට හමයි,
එහි හඬ ඔබට ඇසෙයි, නමුත් කොතැනින්
එන්නේද කියාවත්, කොතැනකට යන්නේද
කියාවත් ඔබ දන්නේ නැත.

14මෝසෙස් කාන්තාරයේදී සර්පයා
එසෙවූ ලෙසම, මනුෂ්‍ය පුත්‍රයාවද එලෙස
ඔසවනු ලබන්ට ඕනෑය. 15එසේ වන්නේ
එතුමා කෙරෙහි අදහගන්නා සැමදෙනම
සදාකාල ජීවනය ලබාගන්නා පිණිස
යයි කීය. 16මක්නිසාද දෙවියන් සිය
ඒකජාතක පුතුනුවන් දෙන තරම් ලෝකයාට
ප්‍රේම කළා. එසේ කළේ එතුමා කෙරෙහි
අදහගන්න සැමදෙනම විනාශ නොවී,
සදාකාල ජීවනය ලබන පිණිසය.
17මක්නිසාද දෙවියන් පුතුනුවන් ලොවට
එව්වේ, ලෝකයා විනිශ්චය කරන පිණිස
නොව, ලෝකයා එතුමා කරණකොටගෙන
ගළවනු ලබන පිණිසය. 18එතුමා කෙරෙහි
අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ.
අදහානොගන්නා දෙවියන්ගේ පුතුනුවන්ගේ
නාමය කෙරෙහි අදහනොගෙන සිටින
බැවින්, දැනටම විනිශ්චයකරනු ලැබ සිටියි.
19මිනිසාගේ ක්‍රියා නපුරු බැවින් ආලෝකයට
වඩා අඳුරට ඇළුම් වූ බවයි. 20නපුරුකම්

**කරන සැමදෙන ආලෝකයට වෛර වී තමන්ගේ ක්‍රියා වැරදි බව ඔප්පු නොවන පිණිස ආලෝකයට නොඑති. [21]නමුත් සැබෑව කරන්නා තමාගේම ක්‍රියා දෙවියන් වහන්සේ තුළ කළ බව ප්‍රකාශ වන පිණිස ආලෝකයට එන්නේයයි කීසේක. [36]පුතුනුවන් කෙරෙහි අදහන්නාට සදාකාල ජීවනය ඇත; නමුත් පුතුනුවන්ට කීකරු නොවන්නා ජීවනය නොදක්නේය, දෙවියන්ගේ උදහස ඔහු කෙරෙහි පවතියි.**

## ඔබ කළ යුතු දෙය

**අ.** නිසි වචනයෙන් හිස්තැන් පුරවන්න.

01. නිකොදේමුස් යුදෙව්වරුන්ගේ..............................................................................(1)
යේසු වෙත ඔහු.........................................................................................ආවේය. (2)

[දුගී දුප්පත්, පොහොසත්, උගත්, නූගත් සියල්ලන්ටම යේසු එක සේ සළකනවා]

02. නිකොදේමුස් සිතුවේ යේසු දෙවියන් වෙතින් ආ.................................................
කියායි. (2)

03. ස්වර්ග රාජ්‍ය දැකගැනීමට නම් මිනිසෙකු. ................................... ...............................
ඕනා බව යේසු කීය. (3)

04. ....................................................ද.............................. ද මිනිසෙකු නුපදීනම් ඔහුට ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට නුපුළුවන. (5)

[වතුර කියා නිකොදේමුස් අදහස් කළේ පවිත්‍ර කිරීමයි. මිනිසුන් පසුතැවිලි වී පාපෝච්චාරණය කළ පසු යොහන් බෞතීස්ත ඔවුන්ව වතුරෙන් බෞතීස්ම කළ බව අපි දෙවන පාඩමේදී ඉගෙනගත්තා. නමුත් සියල්ලන්ව ආත්මයෙන් බෞතීස්ම කර ඔවුන්ට නව ජීවනයක් දෙන පිණිස යේසු ආවේය. දෙවියන්ගේ රාජ්‍යයට (ස්වර්ගයට) ඇතුල්වීමට නම්, අපි අපේ පාපය අත්හැර, ශුද්ධාත්මයෙන් ජීවමානව සිටිය යුතුය]

05. මාංසයෙන් ඉපදුන දෙය.......................................................(6)

[මාංසය නම් අප ශරීරය පමණක් නොවෙයි. නමුත් අප තුළ ඇති මිනිස් තෘෂ්ණාවන්ටද එසේ කියනු ලැබේ. (රෝම 8:8,9)]

06. ආත්මයෙන් ඉපදුනු දෙය.......................................................(6)

[ලෞකික මාපියන්ට ඉපදුන විට අපට ලෞකික ශරීර ඇත. නමුත් අප

ආත්ම දෙවිඳුන් තුළ උපදින විට, දෙවිඳුගේ ආත්මික දෙය වටහාගැනීමට හැකි, ජීවමාන ආත්මයක් අපට ලැබේ. (1 කොරින්ති 2:12,14)]

07 ............................................................කාන්තාරයේදී.............................................
එසෙවු ලෙස මනුෂ්‍ය පුත්‍රයාවද (යේසුවද) එසවීමට (කුරුසියේ ඇණගැසීමට) ඕනෑය. (14)

08. යේසු ලොවට ආයේ, දෙවියන් ලොවට.................................................කළ බැවිනි. එතුමා තුළ අදහන කිසිවෙක්..........................................................නොවී සදාකාල.....................................ලබයි. (16)

09. එතුමගේ පුතුනුවන් දෙවිඳු ලෝ එව්වේ ලොව.......................................................................
කරනු පිණිස නොව (අවසානයේදී එතුමා විනිශ්චය කරනවා ඇත) නමුත් පුතුනුවන් එව්වේ ලොව................................................................පිණිසය. (11)

10. යේසු කෙරෙහි අදහාගන්නාව........................................................කරනු නොලබයි. නමුත් යේසු කෙරෙහි ..................................................................විනිශ්චය කරනු ලබයි. (18)

11. ආලෝකය ලොවට පැමිණ ඇත. නමුත් මිනිසා.........................................
වඩා....................................ඇලුම් වූහ. එසේ වුයේ ඔවුන්ගේ ක්‍රියා......................
බැවිනි. යේසු මෙයට.......................................කියා කියයි. (19)

[විනිශ්චය නම් දෙවිඳුගෙන් සදහටම වෙන් කිරීමය]

12. නමුත්.........................................කරන්නා ආලෝකය ලබයි. (21)

[අලෝකයට පැමිණෙන්නේ යහපත කරන අය නොව, "යහපත කරන්නෙක් නැත. එසේ එක්කෙනෙක්වත් නැත" - රෝම 3:12. සැබෑව කරන්නා ඔහුගේ පාප සැබවින්ම කියාදී දෙවිඳුගේ පවිත්‍රකම ලැබගනියි. "අපේ පව් අපට කමා කරන්නටත්, සියලු අධර්මිෂ්ටකමින් අප පවිත්‍ර කරන්ටත්, එතුමා විශ්වාසව, ධර්මිෂ්ඨව සිටියි" - 1 යොහන් 1:9]

**ආ.** 6 වන කතාවේ ඇති මෙම පද යට ඉරි ගසන්න නැතහොත් එවා ලියා කටපාඩම් කරන්න.

**යොහන් 3:16 සහ යොහන් 3:36**

# නැවත ඉදපීම නම් කුමක්ද?

අප ආත්මිකව ඉපදීම "නැවත ඉපදීම" වේ. එනම්, නව පටන්ගැනීමක් සමග නව ජීවිතයක් පටන්ගැනීමය. සාමාන්‍ය ඉපදීම අපව මිනිස් පවුලට එක් කරයි. ආත්මික ඉපදීම අපව, දෙවියන්ගේ පවුලට එක් කරයි. ශුද්ධාත්මය අප තුළ ක්‍රියා කරන විට, ඇතුළතින් හා පිටතින් සහමුලින්ම අප වෙනස් වෙයි. නිදසුනක්: සොරකම් කළ කෙනෙක් නැවත සොරකම් නොකරයි. එය හරියට හමන සුළඟ වගේ. අපට සුළඟ නොපෙනුනත්, එහි ක්‍රියාව අපට පෙනෙනවා.

යමෙක් ශුද්ධාත්මයෙන් ඉපදී නැත්නම් ඔහු මැරී ඇත. (එපීස 2:1,5) යේසු සමිඳුගේ මරණය තුළින් හා අපේ පාපි ස්වභාවය සම්පූර්ණයෙන් අත්හැරීමෙන්, පාපයෙන් අප නිදොස් වෙයි. ඉන්පසු අපට, ආත්මයාණන් තුළ නව ජීවනයකින් සාමලත් නව ජීවිතයක් ලැබේ. එනම් යේසුගේ "නැවත නැගිටීමේ" ජීවනය. සදාකාල සවර්ග රාජ්‍යයට ඇතුල්වීමට ඒ සියල් ඇවැසියි. අප ජීවිත තුළට ශුද්ධාත්මයාණන් ආ කළ (යේසුගේම ආත්මය) අප "නැවත ඉපදෙයි" (ආත්මිකව) රෝම 8:9අ. ක්‍රිස්තු ආත්මය යම් කෙනෙකුට නැත්නම්, ඔහු එතුමට අයිති නැත.

නැවත ඉපදීමෙන් යේසුගේ ස්වභාවය අපට ලැබේ (2 පේත්‍රුස් 1:4). එනම් නව ගතිගුණ පාලනය කළ හැකි නව බලයක් හා විශේෂයෙන් "දේව වචනය" තේරුම්ගැනීමේ නව හැකියාව.

ඔබ නිකොදේමුස් වගේද? සමහරවිට ඔබ භක්තිවන්තයෙකු වීමට පුළුවන, එසේත් නැත්නම් නීතිගරුක පුද්ගලයෙකු වීමට පුළුවන. එසේත් නැත්නම්, යම් නායකයෙකු වීමට පුළුවන. නමුත් ඔබ "නව මැවිල්ලක්" වීම පිණිස දෙවියන්ගේ ශුද්ධාත්මය තුළින් ඔබ නැවත ඉපදී තියෙනවාද? 2 කොරින්ති 5:17- "එබැවින් යමෙක් ක්‍රිස්තුස් තුළ සිටියි නම් ඔහු නව මැවිල්ලක්ය. පරණ දෙය පහව ගියේය. මෙන්න සියල්ලම අලුත් වී තිබේ." ඔබ "අලුතින් ඉපදී" නැත්නම්, නිකොදේමුස් මෙන් මෙදැන් යේසු වෙත එන්න. නව ජීවනයක් ලබා දෙවියන්ගේම පවුලේ කෙනෙකු වීම පිණිස, ඔබ ජීවිතයට යේසුට එන ලෙස යාඥා කරන්න. 1 යොහන් 5:12: පුතුනුවන් ඇත්තාට ඒ ජීවනය ඇත; දෙවියන්ගේ පුතුනුවන් නැනැත්තාට ඒ ජීවනය නැත.

# වනාන්තරයේ සිටි මෝසෙස්

මෝසෙස්ගේ නායකත්වයෙන් ඉශ්‍රායෙල් සෙනග කාන්තාරයේ ජීවත් වන විට, ඔවුන් කන් කෙඳිරිගාමින්, දෙවිඳුට හා මෝසෙස්ට විරුද්ධ බොහෝ නරක දේ කීවා. දෙවිඳුගේ සැලකීමට හා සැපයීමට විරුද්ධව ඔවුන් චෝදනා කළා. එවිට දෙවිඳුන්, ඔවුන්ට දෂ්ට කිරීම පිණිස සර්පයන් එව්වා. බොහෝ දෙනෙකු එයින් මිය ගියා.



ඉන්පසු ඒ සෙනඟ මෝසෙස් වෙත පැමිණ, තම පාපයට සමාව ඉල්ලුවා. එම සර්පයන් පහකරන ලෙසට, දෙවිඳුට යාඥා කරන මෙන් ඔවුන් මෝසෙස්ට කන්නලව් කළා. ඇතතෙන්ම දෙවියන් ඔවුන්ට පිළිතුරු දුන්නා. නමුත් වෙනස් ක්‍රමයකට. පිත්තල සර්පයෙකු සාදා එය කුඩයක් උඩ තැබීමට දෙවිඳු මෝසෙස්ට කීවා. සර්පයින් දෂ්ට කළ කවුරු මුත්, තඹ සර්පයා දෙස බැලූ විගසින් සුව වුනා. (මෙම කතාව පිණිස ගණන් කතාව 21:4-9 බලන්න)

පාපය, විසගෝර සර්පයෙකුගේ දෂ්ට කිරීම වැනිය. කිසි පාපයක් නොදත් යේසු අප පාප වෙනුවෙන් තම නිමල ජීවිතය පුද කළා. අප එතුමා දෙස නොබැලුවොත්, අපද අපේ පාපයේම මැරී යයි. එම කාන්තාරයේදී බොහෝ දෙනෙක් මැරුණ මුත්, තඹ සර්පයා දෙස බැලූ සැවොම ජීවත් වුනා. නව ජීවනයක් සඳහා නිකොදේමුස් යේසු දෙස නොබලයි නම්, ඔහු විනාශ වන බව යේසුස් ඔහුට දැන්වුවා.


තඹ සර්පයා දෙස බැලූ සෙනඟ ජීවත් වූ ලෙසම, ලෝ පාපය දුරලීමට රුදු කුරුසියක් මත සිය නිමල ජීවිතය පිදූ යේසු දෙස අපද බැලිය යුතුය. (යොහන් 12:32,33). යේසු දෙස බලා ජීවත්වෙන්න. තඹ සර්පයා දෙස බැලීමෙන් ඔවුන් සුව වෙන්නේ කෙසේද යත් දැනගැනීම ඔවුන්ට අනවශ්‍ය දෙයකි. ඔවුන් කළ යුතු දෙය වුයේ ඇදැහිල්ලෙන් හා විශ්වාසයෙන් කීකරු වීමයි. එවිට සියල්ලම එලෙසම සිදුවුනා.

**බලා ජීවත්වෙන්න, මා සොයුර ජීවත්වෙන්න**
**මෙදැන් යේසු දෙස බලා ජීවත්වෙන්න**
**හලේලූයා කියා එතුමගේ වචනයේ ඇත**
**ඔබ බැලුවොත් පමණක් ජීවත්වෙයි**

## ආලෝකයට ඒම

යේසු වෙත අප ආ කළ, එතුමා ආලෝකය බැවින් අපේ පාපය අපට පෙනී යයි (යොහන් 1:9). අඳුර සැබෑව සැඟවෙයි, නමුත් ආලෝකය, සියල්ල ඒ සැටියෙන්ම පෙන්වයි.

අප ජීවිත නව ජීවිතයකට හරවන්නේ දෙවිඳුමයි. ආලෝකයට ඒමට අකමැති අය, සිය පාපයේම ජීවත්වෙමින්, එම නව ජීවනයට විරුද්ධව සිටිති. පාපී දනෝ සදාකාල අපාය වෙත දැනුත් ගමන් කරමින් සිටිති. ඔවුන්ට එයින් බේරීමට ඇති එකම මග යේසු පමණය. යේසුව පිළිනොගත් අය දේව උදහසට ලක්ව ඇත. (30 පදය) නමුත් යේසුව පිළිගෙන සිටින අය, සවර්ගයේදී ලබන "සදාකාල ජීවනය" මෙලොවදීම ලබා ඇත. 1 යොහන් 1:5-7. "අප විසින් එතුමගෙන් අසා ඇති, ඔබලට
දන්වන පණිවුඩය නම්, දෙවියන් ආලෝකය බවත්, එතුමා තුළ කිසිදු අඳුරක්
නැති බවත්ය, 6අපි එතුමා සමඟ පංගුකාරකම් ඇතැයි කියමින් අඳුරේ හැසිරෙමු
නම්, අපි බොරු කියනවා මිස සැබෑව නොකරමු. 7නමුත් එතුමා ආලෝකයේ සිටිනා
සේම, අපිද ආලෝකයේ හැසිරෙමු නම්, එකිනෙකා සමඟ අපට පංගුකාරකම ඇත.
එතුමගේ පුතුනුවූ යේසුස්ගේ ලෙයද, සියලු පාපවලින් අපව පිරිසිදු කරයි."



යමෙකුට නිමල ජීවිතය ඇවැසිද, එසේනම් ඔහු සිය පාප පිළිගෙන, ඒවාට සමාව ලබාගත යුතුය. ක්‍රිස්තුස් යේසුස් වෙත ඒම, සාදාලිකව ජීවත්වීමයි. ඔබගේ ඉදිරි අනාගතය සැදී ඇත්තේ, සිය ගැළවුම්කරු හා සවාමින් ලෙස යේසුව හා එතුමගේ ආලෝකය පිළිගැනීම හා පිළිනොගෙනීම මතය. අඳුරේ සැඟවෙන්න එපා. එන්න යේසු තුළ ආලෝකයට!




**ඇදැහිල්ල + දේව වචනය(යේසු) = සදාකාල ජීවනය**

# 7 යේසුස් ක්‍රිස්තුස්ගේ සුවිශේෂ හැඳින්වීම



යොහන් 4:5 -42

5එතුමා සමාරිය මැදින් යන්ට ඕනෑ
බැවින්, යාකොබ් තමාගේ පුත්‍රවු යෝසෙප්ට
දුන් බිම් කොටස ළග තිබෙන සිබාර් නම්
සාමාරියේ නුවරකට පැමිණිසේක. 6එහි
යාකොබ්ගේ ළිඳ තිබුනේය. යේසු ගමනින්
වෙහෙසව සිටිසේක, ඒ ආකාරයෙන්ම ළිඳ
ළග හිඳ ගත්සේක. ඒ හවෙනි පැය පමණ
විය. 7 සමාරියේ ස්ත්‍රියෙක් වතුර අදින්නට
ආවාය. මට බොන්න දෙන්නැයි යේසුස්
වහන්සේ ඇට කීසේක. 8මක්නිසාද එතුමගේ
ගෝළයෝ කෑම මිළයට ගන්ට නුවරට
ගොස් සිටියහ. 9එවිට සමාරියේ ස්ත්‍රී
එතුමට කථා කොට: යුදෙව් කෙනෙක්
වු ඔබ සමාරියේ ස්ත්‍රියෙක් වු මගෙන්
බොන්ට ඉල්ලන්නේ කොහොමදැයි කීවාය.
(මක්නිසාද සමාරියන් සමග යුදෙව්වන්ගේ
ගනුදෙනුවක් නොමැත). 10යේසුස්වහන්සේ
ඇට උත්තර දෙමින්: දෙවියන්වහන්සේගේ
දීමනාවත්, මට බොන්න දෙන්නැයි ඔබට
කීවේ කවුද කියාත් ඔබ දැනගෙන සිටියා
නම්, ඔබ ඔහුගෙන් ඉල්ලනවා ඇත, එවිට
ඔහු ඔබට ජීවනදායක වතුර දෙනවා
ඇතැයි කීසේක. 11ස්ත්‍රියද: ස්වාමිනී වතුට
අදින්නට භාජනයක් ඔබට නැත, ළිඳත්
ගැඹුරුය. එබැවින් ඒ ජීවනදායක වතුර
ඔබට කොහින්ද? 12ළිඳ අපට දුන් අපේ
පිය වු යාකොබ්ට වඩා ඔබ උතුම්ද? ඔහුද
ඔහුගේ පුත්‍රයෝද ඔහුගේ සිවුපාවෝද මෙයින්
බීවෝ යයි උන්වහන්සේට කීවාය. 13යේසු
උත්තර දෙමින්: මේ වතුර බොන හැම
දෙනාටම නැවත පිපාස වන්නේය. 14නමුත්
මා දෙන වතුර බොන කවරෙකුට නමුත්
කිසිකලෙක පිපාස නොවන්නේය; මා ඔහුට
දෙන වතුර ඔහු තුළෙහි සදාකාල ජීවනය
නික්මවන වතුර උල්පතක් වන්නේ යයි
කීසේක. 15ස්ත්‍රීද: සවාමිනී මට පිපාස
නොවන පිණිසත් වතුර අඳින්නට මෙපමණ
දුර නොඑන පිණිසත් ඒ වතුර මට දුන
මැනවයි කීවාය. 16ගොස් ඔබේ පුරුෂයා
කැඳවාගෙන මෙහි එන්නැයි යේසු ඇට
කීසේක. 17ස්ත්‍රීද උන්වහන්සේට උත්තර
දෙමින්: මට පුරුෂයෙක් නැතැයි කීවාය.
එතුමා ඇට කියනසේක්: මට පුරුෂයෙක්
නැතැයි ඔබ කීවා හරිය. 18මක්නිසාද ඔබට
පුරුෂයන් පස්දෙනෙක් සිටියෝය; ඔබට දැන්
සිටින තැනැත්තා නුඹේ පුරුෂයා නොවේ.
එය ඔබ සැබෑ ලෙස කීවේ යයි කීසේක.
ස්ත්‍රී එතුමට කියන්නී: 19ස්වාමිනී, ඔබ
අනාගතවක්තෘ කෙනෙකු බව මට පෙනේ.
20අපෙගේ පියවරු මේ කන්දේදී නමස්කාර
කළෝය; නමුත් මිනිසුන් විසින් නමස්කාර

කරන්නට යුතු ස්ථානය යෙරුසලමේ යයි ඔබලා කියන්නාහු යයි කීවාය. යේසු ඇට කියනසේක්: 21ස්ත්‍රීය, මා විශ්වාස කරන්න, මේ කන්දේදීවත්, යෙරුසලමේදීවත්, ඔබලා පියාණන්ට නමස්කාර නොකරන කාලය පැමිණෙන්නේය. ඔබලා නමස්කාර කරන්නේ නොදන්නා දේටය. අපි දන්නා දේට නමස්කාර කරමුව. මක්නිසාද ගැළවීම යුදෙව්වන්ගෙන්ය.. 23නමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්ට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය, දැනටමත් පැමිණ තිබේ. මක්නිසාද පියාණන් තමන්ට නමස්කාර කරන්නන් වන පිණිස එබඳු වුවන් සොයන සේක. 24දෙවියන් වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද, සැබෑකමෙන්ද නමස්කාර කළ යුතු යයි කීසේක. 25ස්ත්‍රී උන්වහන්සේට කථා කොට: (ක්‍රිස්තුස් කියන) මෙසියස් එන බව දනිමි. උන්වහන්සේ ආවාම සියල්ල අපට දන්වනසේකැයි කීවාය. ඔබ සමග කථා කරන මම ඔහු යයි ඇට කීසේක.

27එවිට උන්වහන්සේගේ ගොළයෝ ඇවිත්, උන්වහන්සේ ස්ත්‍රීයක් සමග කථා කරමින් සිටියාට මවිත වුවෝය; එහෙත් ඔබ කුමක් සොයන්නේදැයි නොහොත් ඇ සමග කථා කරන්නේ මක්නිසාදැයි කිසිවෙක් ඇසුවේ නැත. 28එකල ස්ත්‍රී තමාගේ කළය තබා නුවරට ගොස්: 29මා කළ සියල්ල මට කියු මිනිසෙකු බලන්නට වරෙල්ලා, ඒ ක්‍රිස්තුස් වේදැයි මිනිසුන්ට කීවාය. 30එවිට ඔව්හු නුවරින් පිටත්ව උන්වහන්සේ වෙතට ආවෝය. 31ඒ අතර ගෝලයෝ කථාකොට: රබ්බි, කෑව මැනවයි එතුමාගෙන් ඉල්ලා සිටියෝය. 32නමුත් උන්වහන්සේ: ඔබලා නොදන්නා කෑමක් කන්නට මට තිබේ යැයි ඔවුන්ට කීසේක. 33එබැවින්: කවුරුත් එතුමට කෑම ගෙනාවාදැයි කියා ගෝලයෝ එකිනෙකා සමග කථා කරගත්හ. 34යේසුස්ද: මාගේ කෑම නම් මා එවු තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. 35තව හාරමසක් ගිය කළ ගොයම් කපන කාලය පැමිණෙන්නේ යයි ඔබලා කියනවා නොවේද? මම ඔබලට කියමි - ඔබලගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලන්න. වපුරන්නාත් කපන්නාත් එක්ව සතුටු වන පිණිස, කපන්නා කුලී ලැබ සදාකාල ජීවනයට අස්වැන්න එකතුකර ගන්නේය. 37මක්නිසාද: එක් කෙනෙක් වපුරන්නේය, වෙන කෙනෙක් කපන්නේය යන කීම මෙයින් සැබෑවේ. 38ඔබලා විසින් වැඩ



**නොකළ ගොයම් කපන්නට මම ඔබලා යැවීමි. අන්‍යයෝ වැඩ කළෝය, ඔබලා ඔවුන්ගේ වැඩට පැමිණියෝ යයි කීසේක. 39මා කළ සියල්ල එතුමා මට කීසේකැයි සාක්ෂි දුන් ස්ත්‍රියගේ වචන නිසා ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් යේසු කෙරෙහි අදහාගත්හ. 40එවිට සමාරියවරු එතුමා ළගට ඇවිත්, තමුන් සමග නවතින ලෙස යේසුගෙන් ඉල්ලුවෝය. එතුමා දෙදවසක් එහි නැවතුණු සේක. 41වෙනත් බොහෝ දෙනෙක් එතුමගේ වචන නිසා අදහා, ස්ත්‍රියට කථා කොට: 42අප දැන් අදහන්නේ නුඹේ කීම නිසා නොවේ. මක්නිසාද අපම අසා, සැබැවින්ම එතුමා ක්‍රිස්තුස් නම් ලෝ ගැලවුම්කාරයාණන් බව දනිමු යයි කීවෝය.**

## ඔබ කළ යුතු දෙය

**අ.** බයිබල් කතාවෙන් පිළිතුරු ලියන්න.

01. යේසු සැබවින්ම මිනිසෙකු බවද පෙන්වීමට එතුමා තුළ තිබූ හැඟීම් මොනවාද? (6 පදය).................................................................................

02. සාමාරියේ ස්ත්‍රීයට යේසු මොනවද කීවේ? (7 පදය) .........................................

03. යේසු ඇයට කතා කළ විට ඇයි ඇය පුදුමයට පත් වුනේ (9)....................
..............................................................................................................හෙයිනි.
[සාමාරියයන් නම්, යුදෙව්වන් හා අන්‍යජාතීන් අතර විවාහවලින් පැවතෙන පරම්පාරාවකි. ඔවුන් ඉශ්‍රායලයේ දෙවියන්ට පමණක් නොව, මිථ්‍යා දෙවිවරුන්ටද නමස්කාර කළා. යුදේව්වන් යෙරුසලමේ දේව මාළිගාව ගොඩනගන විට එම සාමාරියයන්ගෙන් උදව් උපකාර ගත්තේ නැහැ. නමුත් යේසු සියල්ලන්ටම ආදරෙයි. එනිසා සමාරියයන් සමග කතා කිරීම යුදෙව් සිරිත් වලට පටහැනි වුවද. යේසුස් මිනිසාට එක හා සමානව ආදරේ නිසා සියලුදෙනගේම වුවමනාවන් ගැන එතුමා එක හා සමානව සැළකිලිමත් වෙනවා.]

04. ඇය ඉල්ලිය යුතු දෙය ඇය දැන සිටියා නම්, යේසු ඇයට දෙන්නේ මොනවද? (10) ................................ ........................................

05. යේසු දෙන වතුර හා ළිදෙන් වතුර බීමේ වෙනස කුමක්ද? (13,14)
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

06. යේසු මෙම ස්ත්‍රිය ගැන දැන සිටියේ මොනවද? (18) ..........................................

.............................................................................................................................................

..................................................................................... [අපේ සියලුම රහස් පාප යේසු දනියි]

07. ඇයගේ පාපය යේසු පෙන්වා දුන් විට, මොනවද ඇය කීවේ (20) මිනිසුන් .......................................කරන සථානය ගැන.

[සමාරියයන් නමස්කාර කළේ, ගෙරිසිම් කන්දේ පිහිටි ඔවුන්ගේම දේව මාළිගාවේය. ඔවුන් විශ්වාස කළේද, පරණ තෙස්තමේන්තුවේ ඇති පළමු පොත් පහ පමණය. ඔබේ සතුට දෙවියන් සමග හරිගැස්සී එතුමා හා සාමයෙන් සිටීමද නැතහොත් ආගම ගැන කතා කිරීමද?]

08. සැබෑ නමස්කාරකම් කරන්නන් පියාණනට නමස්කාර කරන්නේ කෙසේද? (23) ..................................................................................................................

[දෙවිඳුව සැබෑ ලෙස නමස්කාර කිරීමට අප ආත්මිකව ඉපදී සිටිය යුතුය.]

09. එම ස්ත්‍රීය යේසු කවුරුද යත් දැනගත් පසු ඈ කළේ කුමක්ද? (28,29)......................... .............................................................................................................................................

10. ආහාර මෙන් යේසුව තෘප්තිමත් කළේ වෙන මොනවද? (34)............................... .............................................................................................................................................

11. යේසු කවුරු කියාද සාමාරියයන් විශ්වාස කළේ? (42)........................................................ ...........................................

**ආ.** මෙම පදය කටපාඩම් කරන්න: **යොහාන් 4:24**

# ඇදැහිල්ල කෙසේ වර්ධනය වෙයිද?

යේසු ඇයට දිගින් දිගටම කතා කළ නිසා එම සමාරිය ස්ත්‍රීය යේසු ගැන තවතවත් දැනගෙන, පැහැදී, එතුමව තදින් විශ්වාස කළා. 9 පදය බලන්න - පළමුව, කරුණාවන්ත යුදෙව්වෙකු ලෙස ඈ යේසුව අඳුනාගත්තා. 11 පදය බලන්න - යේසුට ඇයගේ ගෞරවය වැඩී වී "සවාමිනී" කියා යේසුව ඇමතුවා. 19 පදය බලන්න - යේසු ඇය ගැන බොහෝ දේ දන්නා නිසා, යේසු අනාගතවක්තෘ කෙනෙක් යයි ඈ සිතුවා. 29 පදය බලන්න - යේසු, ක්‍රිස්තුස් නම් පොරොන්දු වු මෙසියස් බව දැන් ඇය විශ්වාස කරයි.

බයිබලය තුළින් වඩවඩාත් යේසුට කතා කිරීමට ඉඩදුන් විට, අපේ ඇදැහිල්ලද බෙහෙවින් වර්ධනය වෙයි. රෝම 10:17 "ඇදහීම ඇසීමෙන් එන්නේය, එසේය. දේව වචනය ඇසීමෙන්ය"

# ජීවන පැන් නම් මොනවාද?

අඩි 90 පමණ ගැඹුරු මෙම යාකොබ්ගේ ළිඳෙන් නැවත වතුර නොඇද සිටීම කොපමණ යහපතක්දැයි ඇයට සිතෙන්න ඇති. ඇත්තෙන්ම, මෙතනදී යේසු කතා කළේ භෞතික වතුර ගැන නොවෙයි, නමුත් පාපයට ඇති ඇයගේ ආසාවන් නිසා, හිස්ව පාලුවට ගිය ඇයගේ ආත්මයට පාපයෙන් ගැළවීම, සැනසීම හා තෘප්තිය ගෙන ඒම ගැනයි. ජීවනයේ පැන් නම් සදාකාල ජීවනයයි - යේසුගේම ජීවනය. එතුමගේ ශුද්ධාත්මයෙන් අප පූර්ණ වූ විට, අප තුළ අත්දකින සාමය සතුට හරියට උල්පතකින් ගලා බසින විනිවිද පෙනෙන පිරිසිදු ජලය වැනිය. එතුමා අපට දෙන මෙම සාමට සතුට ලෝ ඇති සියල්ල අභිබවා අපට පිරිපුන් ජීවනයක් ගෙන දෙයි.

සමාරියේ ස්ත්‍රීයට ඕනා වුනේ වතුරයි. නමුත් යේසුට ඕනා වුනේ පළමුව, ඇගේ හෘදසාක්ෂියට කතා කිරීමයි. යේසුගේ මෙම ජීවන පැන් ලබාගැනීමට පෙර, ඇය ඇයගේ පාපයට පසුතැවිලි වී ඒවා කියා දී සමාව ලැබ, ඒවා මුළුමනින්ම අත්හැරීමට කැමති විය යුතුය.

# මෙම කතාන්දරය දෙවියන්ට සේවය කිරීම ගැන කියනා දෙය

01. පාපයෙන් ගැලවීම සඳහා අප සියලුදෙනාම යේසුස් ක්‍රිස්තුස්ව විශ්වාස කළ යුතුයි. කිසි කෙනෙකුව අනියම් ලෙස හෝ තරාතිරම් තුළ හෝ අප සැළකිය නොයුතුයි. යේසු එසේ කළේ නැහැ.

02. අස්වනු නෙළීම සඳහා අද ලෝ "ආත්මික" කෙත් සූදානම්ව ඇත. අප වටා සිටින කීදෙනෙක් සැබෑව සොයා එය පිළිගැනීමට සූදානම්ද යත් අප සොයා බැලිය යුතුය.

03. එක් අයෙක් වැපිරීමට පුළුවන (අන් අයට යේසු ගැන කියා දීම, පත්‍රිකා බෙදීම, දේව වචනය ඉගැන්වීම යනාදිය), නමුත් තව අයෙකු අස්වැනු නෙළීමට පුළුවන (යේසු වෙත කෙනෙකුව ගෙන ඒම). වැපිරීම හා නෙළීම යන දෙකම අපට මහත් ප්‍රීතියක් ගෙන දෙන හෙයින්, ඉන් කොයි එකක් වුනත් කිරීමට අප සූදානමින සිටිය යුතුය.

04. දේව කැමැත්ත තුළ අප දෛනික සේවය අවසන් කළාම, අප ගන්නා අහාරයට වඩා තෘප්තියක් එය අපට ගෙන දෙයි.

05. අප මිතුරන්ට යේසු ගැන කියා දීම වැදගත්ය. එයින් නොනැවතී එතුමව පුද්ගලික හඳුනාගැනීම පිණිස අප ඔවුන්ව යේසු වෙත ගෙන ආ යුතය.

# 8 ඇමතියෙකුගේ පුතෙකුව යේසු සුව කිරයි



යොහන් 4: 46-53

46එවිට එතුමා විසින් වතුරෙන් මුද්‍රිකපානය සැදු ගලීලයේ කානා නුවරට නැවත පැමිණියේය. කපර්ණවුමෙහි රෝගී වු පුතෙකු ඇති එක්තරා ඇමතියෙක් විය. 47යේසු යුදේය සිට ගලීලයට ආ බව ඔහු අසා එතුමා ළගට ගොස් සිය පුතු සුවකරන ලෙසට එතුමාගෙන් ඉල්ලීය. මක්නිසාද ඔහු මරණාසන්නව සිටියේය.
48යේසු ඔහුට කතා කර: ඔබලා ලකුණුද, පුදුමද නුදුටුවොත්, ඔබලා කිසිසේත් විශ්වාස කරන්නේ නැතැයි ඔහුට කීය.
49ස්වාමිනී, මගේ දරුවා නසින්ට පළමුව ආ මැනවයි ඇමති කීය. 50යේසුද: යන්න, ඔබේ පුතා ජීවත්ව සිටියි ඔහුට කීය. ඒ මිනිසා තමාට යේසු කී වචන විශ්වාස කරමින් ගියේය. 51ඔහු යන කළ ඔහුගේ දාසයෝ ඔහු පෙරමගට ඇවිත්, ඔහුගේ පුතා ජීවත්ව සිටින බව ඔහුට කීහ. 52ඒවිට ඔහු, සුවවීම පටන්ගත්තේ මොන පැයේදීද වුන්ගෙන් ඇසීය. 7යේ සත්වන පැයේදී උණ බැස්සේ යැයි ඔවුහු ඔහුට කීහ. 53ඔබේ පුතා ජීවත්ව සිටියි යේසු තමාට කී පැය එයම බව පියා දැන, ඔහුද ඔහුගේ නිවසේ සියල්ලෝද අදහාගත්හ.

## දේව වචනයේ බලාපරාක්‍රමය

දෙවිඳු යමක් කී විට එය එසේම සිදුවෙනවා. අපට පෙනෙන නොපෙනෙන සියල්ලන් හා සියල්ල සිය වචනය තුළින් මැවු එකම සැබෑවු ජීවමාන දෙවියන් එම ඇමතිට "යන්න ඔබේ පුතා ජීවත්ව සිටියි" කියා කීවා. එය එසේම සිදුවුවා.

බයිබලයේ සියලු පොරොන්දු එලෙසින්ම සිදුවන බව යේසු කියයි. (මතෙව් 5:18 අහසත් පොළාවත් පහව යන තෙක් සියල්ල සිදුවන තුරු ව්‍යවස්ථාවේ එක් අකුරක්වත්, බිඳක්වත් කිසිසේත් පහව නොයයි). ඔබ දේව වචනය විශ්වාස කරනවාද? මෙම කාතාවේ ඒ මිනිසා මෙන් ඔබද, විශ්වාසය අනුව ක්‍රියා කරනවද?

යේසුස් ක්‍රිස්තුස් අප හදවත් තුළ ජීවමානව සිටී නම්, අපේ වචනයේ ද බලය තියෙනවා. මාර්ක් 11:22-23 යේසු එතුමගේ ගොළයන්ට මෙසේ කීවා: "දෙවියන් කෙරෙහි ඇදහිල්ල ඇතිව සිටින්න, සැබවින්ම ඔබලාට කියමි, කවරෙක් නමුත් මෙම කන්දට කතා

කර, ඉදිරියේ මුහුදේ වැටෙන්න කියා තම සිතින් සැක නොකොට, තමා කී දෙය සිදුවන බව අදහන්නේ නම්, එයම ඔහුට සිදුවෙයි." දෙවියන් තුළ නිසැක ඇදහිල්ලෙන් අප කතා කරන වචන ඇත්තෙන්ම බලවත්ය. ඔබ කතා කරන වචන මොනවාද? දිරිගන්වන, සැනසීමේ, විශ්වාස හා ආදර කාරුණික වචනද?

## යාඥාව ගැන මෙම කතාන්දරය අපට උගන්වන දෙය

අප ඉල්ලීම්වලට යේසු පිළිතුරු දෙනවද? "යේසු, ඊයෙත්, අදත්, සැමදත් එක බව" හෙබ්‍රෙව් 13:8 අපට උගන්වයි. අප ඉල්ලීම් හෝ කන්නලව් සමඟ එතුමා වෙත අප ආ යුතු බව අප දන්නා දෙයකි. යේසුඃ "මා ළඟට එන තැනැත්තා මම කිසිසේත් අහක දමන්නේ නැත" - යොහන් 6ඃ 37[ආ] යේසු මෙසේද කියයිඃ "ඉල්ලන්න, එවිට ඔබට දෙනු ලැබේ; සොයන්න, එවිට ඔබට හමුවෙයි; තට්ටු කරන්න, එවිට ඔබට දොර අරිනු ලැබේ." - මතෙව් 7:7

එතුමා අපට පිළිතුරු දෙන බව අප විශ්වාසය කළ යුතුය. "ඇදැහිල්ල නැතිව එතුමව ප්‍රසන්න කිරීමට නුපුළුවන. මක්නිසාද දෙවියන් වෙත ළඟාවෙන්නා, එතුමා විද්‍යාමාන බවත්, එතුමව උත්සහවන්තව සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කළ යුතුය" - හෙබ්‍රෙව් 11ඃ 6

යේසු දෙන කුමන පිළිතුරක් වුවත් අප පිළිගෙන එයින් අප සෑහීමකට පත්විය යුතුය. එම ඇමති සිය නිවසට එන ලෙස යේසුට ඇරයුම් කළත්, යේසු එහි නොගොස් "යන්න, ඔබ පුතා සුව වී සිටියි" බව පමණක් කීවා. එතුමන් පිළිතුර ඔබගේ ක්‍රමය අනුව නොවීමට පුළුවන්, නමුත් එතුමගේ නිමල වචනය අනුව, හැමවේලේම එතුමා ඔබට උපරිමව ඒකාන්තයෙන්ම පිහිට වෙනවා.

ඇදහිල්ල හැමවේලේම යම් පොරොන්දුවක් හෝ බලාපොරොත්තුවක් ඉටු නොකරන්න පුළුවන්, එහෙත් ඔබට වුවමනා මඟ පෙන්වීම හා සාමය නිට්ටාවටම ගෙන දෙනවා. "කිසිවක් ගැන ඔබලා කණගාටු නොවී, සියල්ලේදී ස්තුති දීම සමඟ යාඥාවෙන්ද, කන්නලව්වෙන්ද ඔබ ඉල්ලීම්ද දෙවියන්ට දන්වන්න. එවිට කිසි නැණනුවණකින් දැනගත නොහැකි වූ දෙවිඳුගේ සාමය ක්‍රිස්තුස් යේසුස් තුළ ඔබ සිත්ද, සිතුවිලිද රැකදෙනවා ඇත" - පිලිප්පි 4ඃ 6,7

ඔබ දෙවියන් විශ්වාස කරනා විට, බලයෙන් යුතුව එතුමා ඔබ තුළ ක්‍රියා කිරීමට පටන්ගනී. එවිට ඔබගේ ඇදහිල්ල තවතවත් ශක්තිමත්ව වර්ධනය වෙයි. එම ඇමතිගේ සියලුම නිවැසියෝ එකහෙලාම යේසුව විශ්වාස කළ සේම, ඔබගේ පවුලේ අයගේ ඇදහිල්ලද එලෙසම යේසුව විශ්වාස කිරීමට පටන්ගනී.

# 9 යේසු කොරෙකුව සුව කරයි



යොහාන් 5: 1-9, 14-18

[1]ඉන්පසු යුදෙව්වරුන්ගේ මංගල්‍යයක්
විය; යේසුද යෙරුසලමට ගියසේක.
[2]යෙරුසලමෙහි බැටළුදොර ළඟ හෙබ්‍රෙව්
භාෂාවෙන් බෙතෙස්දා නම්වූ මණ්ඩප
පහක් ඇති පොකුණක් තිබේ. [3]ඒවායේ
අන්ධයෝය, කොරුය, වියළි අවයව
ඇත්තෝය යන රෝගීන් සමූහයක් ඔත්
පළව උන්නෝය.* [5]තිස්අට අවුරුද්දක්
දුර්වලකමෙන් පීඩිතවූ එක්තරා මිනිසෙක්
එහි සිටියේය. [6]ඔහු ඔත්පලව ඉන්නවා
යේසු දැක, ඔහු දැනට බොහෝ කලක
සිටි ඒ ආකාරව සිටි බව දැන: ඔබ
සුවය ලබන්නට කැමැතිදැයි ඔහුගෙන්
ඇසූසේක. [7]රෝගියා එතුමට උත්තර
දෙමින්: සවාමිනී, වතුර කැලඹෙන කල
මා පොකුණට බස්වන්ට කිසිවෙක් මට
නැත. මා යන කළ වෙන කෙනෙක් මට
පළමුවෙන් බසින්නේ යයි කීවේය. [8]නැගිට
ඔබේ යහන රැගෙන යන්නැයි එතුමා ඔහුට
කීසේක. [9]එකෙණෙහිම ඒ මිනිසා සුවවී,
තමාගේ යහන රැගෙන ගියේය.

[14]ඒ දවස සබත් දවසය. ඉන්පසු
යේසු දේවමාළිගාවේදී ඔහු දැක: බලන්න,
ඔබ සුවය ලැබුවේය. ඔබට මීට වඩා
නරකක් සිදුනොවන පිණිස, තවත් පව්
නොකරන්නැයි ඔහුට කීසේක. [15]ඒ මිනිසා
ගොස් යේසු විසින් තමා සුවකල බව
යුදෙව්වරුන්ට දැන්විය. [16]යේසු මේ දේ
සබත් දවසේදී කළ නිසා යුදෙව්වරු
එතුමට පීඩා කළෝය. [17]නමුත් යේසු
ඔවුන්ට උත්තරදෙමින්: මාගේ පියාණන්
මේ දක්වාම ක්‍රියා කරනසේක. මමත් ක්‍රියා
කරමියි කීසේක. [18]එබැවින් එතුමා සබත්
කඩ කළා පමණක් නොව, දෙවියන්
තමන්ගේම පියාණන් යයි කියමින්, තමන්
දෙවියන් හා සමාන කරගත් නිසා
යුදෙව්වරු එතුමා මරන්නට වඩ වඩා
සෙවූහ.

*දේවදූතයෙක් බැස පොකුණේ වතුර කැළඹීමක්
ගැන 4 වැනි පදයක් පුරාණ පිටපත් කීපයක පෙනේ.

# ඔබ කළ යුතු දෙය

වාක්‍යය සම්පූර්ණ කරන්න.

01. බෙතෙස්දා පොකුණ අසළ සිටි එක් මිනිසෙක්.................................................. අවුරුද්දක් සිටම දුර්වලකමින් පීඩිතව සිටියා. (5)

02. ඔබ...........................................................................ලබන්න කැමැතද, යන ඉතා වැදගත් ප්‍රශ්නය යේසු ඔහුගෙන් ඇසුවා. (6)

03. ............................................. ඔබේ යහන රැගෙන...................කියා යේසු ඔහුට කීවේ, ඔහුට කළ නොහැකි දෙයමයි. (8)

04. පසුව, යේසුට ඔහුව දේවමාළිගාවේදී හමුවී, "බලන්න, ඔබ සුවවී ඇත" මීට වඩා නරකක් ඔබට සිදුනොවන පිණිස.........................................................යේසු ඔහුට කීවා.

05. කරුණු දෙකක් මත එකල යුදෙව්වන් යේසුට පීඩා කළා. **අ.** එතුමා...................... .........................................කළ නිසාත් (18) [යේසු සුව කළේ සබත් දිනයේදීය. එදින මක යුදෙව්වන් වැඩ නොකර විවේකව සිටින දිනන දිනයයි] **ආ.** දෙවියන් සිය පියාණන් කියමින් තමන්.......................හා.........................කරගත් නිසාත්ය. (18)

# සුවවීමට ඔබ සතුටුද

කුමකින් සුවවීමට ඔබ සතුටුද? ශාරීරිකව, මානසිකව හෝ ආත්මිකවද? එසේත් නැත්නම් දෙවිපියාණන්ට ඔබේ සේවය වළක්වන යම් නරක පුරුද්දකින්ද? එහෙමත් නැතිනම් ඔබ තුළ පවතින අනුන්ට දොස් පවරන අනුන්ව නුරුස්සන හෝ පිළිකුල් කරන ආත්මයෙන්ද?

කුමක් හෝ වේවා ඔබගේ උවමනාව යේසුට පෙනෙනවා. ඔබට ආදරේ යේසු මෙසේ කියයි: "**සුවය ලබන්න කැමතිද?**" ඔබගේ ඔය තත්වයට නිදහසට කරුණුවලින් පලක් වන්නේ නැහැ. සමහරවිට නිවසේ හෝ පාසලේ හෝ ඉන්නා එකම ක්‍රිස්තියානි අය ඔබ විය හැක. ජීවිතේ විවිධ දෙය ඔබට හරස්වන නිසා ඔබගේ ඔය වර්තමාන තත්වය ඇති වුනා කියා ඔබ සිතෙන්නට පුළුවන්. ඔබ මොනවා සිතුවත් කම්නැහැ, යේසුට පුළුවන් මෙදැන් ඔබව සුව කරන්න. ඉහත සඳහන් කොරාට කළ නොහැකි දෙය කිරීමට යේසු අණ කළ සැනින් ඔහු එම දේම කළා. එතුමා ඔබටත් එවැනිම දෙයක් කීමට ඉඩ තියෙනවා. ඔබ කුමක් වුවත්, දේව වචනයට ඔබ කීකරු වන විට, ඔබට වුවමනා බලය යේසු ඔබට දී, ඔබව සම්පූර්ණයෙන් සුව කරයි! එතැන් පටන්, ජයමත්, පිරිපුන්, සාමලත් දිවියකට යේසු ඔබට මග පෙන්වයි!

# 10 නැවත නැගිටීම් දෙකක්

**යොහාන් 5:24-29**

**24 සැබවක්, සැබවක් ඔබලට මම**
**කියමි: මගේ වචනය අසා මා එවූ**
**තැනැත්තාව අදහන්නාට සදාකාල ජීවනය**
**තිබේ, ඔහු විනිශ්චයට පත් නොවී, මරණය**
**කෙරෙන් ජීවනයට පැමිණ සිටී. 25 සැබවක්,**
**සැබවක් ඔබලට කියමි: දෙවියන්ගේ**
**පුතුනුවන්ගේ හඬ මළවුන්ට ඇසෙන පැය**
**පැමිණෙන්නේය, දැනුත් පැමිණ තිබේ;**
**අසන අය ජීවත් වෙති. 26 මක්නිසාද,**
**පියාණන් තමන් තුළම ජීවනය ඇතිව**
**සිටිනා මෙන්, පුතුනුවන්ටද තමන් තුළම**
**ජීවනය ඇතිව සිටින්නට එතුමා වරය**
**දුන්නේය. 27 ඔහු මනුෂ්‍ය පුත්‍රයා බැවින්**
**විනිශ්චය කිරීමේ බලයද දුන්නේය.**
**28 මෙය ගැන මවිත නොවෙන්න. මක්නිසාද,**
**සොහොන් ගෙවල්වල සිටින සියල්ලන්ට**
**ඔහුගේ හඬ අසන පැය පැමිණ, 29 යහපත**
**කළ අය, ජීවනයේ නැවත නැගිටීමටත්**
**නපුර කළ අයවලුන්, විනිශ්චයේ නැවත**
**නැගිටීමටත් පිටත්ව එති.**

## කල්පනා කිරීමට යමක්

යේසු අප හදවත නැමැති දොරට තට්ටු කළ විට, විශ්වාසයෙන් යුතුව, අප ජීවිත තුළට එතුමට එන්න ඉඩදීම කොපමණ යහපත්ද! එසේ වූ විට, සදාකාල ජීවනය අපට ලැබී ඇති බවටද, අපව විනිශ්චයට ලක් නොවී, දැනටමත් අප මරණයෙන් ජීවනයට පත්ව ඇති බවටද අප තුළ මහත් විශ්වාසයක් ඇතිවෙයි. මෙය කෙසේ සිදුවේද යත් ඔබ දන්නවාද? ඒ, යේසු තුළම ජීවනය තිබෙන නිසාය (26 පදය). කිසිවෙකු තුළ යේසු නැත්නම්, දෙවිඳුව ප්‍රසන්න කිරීමට කිසිවෙකුට නුපුළුවන. (රෝම 8:8) එවිට ඔවුන්ව මරණින් නැවත නැගිට්ටෙව්ව පසු, ලැබෙන්නේ විනිශ්චය හා දෙවියන්ගෙන් සදාකාල වෙන්වීම පමණයි. (සදාකාල අපාය)

## ඔබ කළ යුතු දෙය

ඔබේ ගැළවීම කුමක්ද යත් දැනගැනීම තහවුරු කරගැනීම පිණිස යොහන් 5:24 කටපාඩම් කරගන්න. ඔබ දේව වචනය අසමින්, එතුමව විශ්වාස කරන විට (කීකරුකම එතුමව විශ්වාස කිරීමය) අවිශ්වාසය හා සැකය ගෙනෙන සාතන්ට විරුද්ධව සිටින්න. ඔබ එතුමටම සතු බව එතුමා ඔබට කියයි. දෙවිඳු හා ඔබ අතරට අයහපත ආ කළ, පැහැදිලිවම දෙවිඳු එය ඔබට පෙන්වා දෙනවා. එවන් සහමුලින්ම අත්හරින්න. දෙවියන් සියල්ල ප්‍රකෘතිමත් කරයි. සාතන් සියල්ලේදී චෝදනා කරයි.

# 11 ජීවනයේ ආහාර යේසුය

යොහන් 6:5-14, 35, 47-51, 53-56, 63

5යේසු ඇස් ඔසවා තමන් ළගට
මහත් සමූහයක් එන බව දැක: මොවුන්ට
කන්ට දෙන්ට අපි කොතැනින් රොටි
මිලේට ගනිමුදැයි පිලිප්ගෙන් ඇසුසේක.
6තමන් කරන්නට යන්නේ කිමෙක්ද කියා
තමන්ම දැනගෙන, ඔහු සෝදිසිකරන
පිණිස මෙසේ කීසේක. 7පිලිප් එතුමට
උත්තර දෙමින්: එකිනෙකාට ටික ටිකවත්
ලැබෙන පිණිස මසු දෙසියක රොටිත්
ඔවුන්ට මදියයි කීවේය. 8එතුමගේ
ගෝලයන්ගෙන් එක් කෙනෙක්වූ
සීමොන් පේත්‍රුස්ගේ සහෝදරවූ අන්ද්‍රෑ
එතුමට කථා කොට: 9යව රොටි පහක්ද
කුඩා මසුන් දෙදෙනෙක්ද ඇති ළමයෙක්
මෙහි සිටියි. නමුත් මෙපමණ දෙනෙකුට
ඒවා මෙකක්දැයි කීවේය. 10මනුෂ්‍යන්
හිඳවන්න යේසු කීසේක. එතැන බොහෝ
තණකොළ තිබුණේය. මෙසේ ගණන්
වශයෙන් පන් දහසක් පමණ පුරුෂයෝ
හිඳගත්තෝය. 11එවිට යේසු රොටි ගෙන,
ස්තුතිකර, ඉඳගෙන සිටි අයට බෙදා
දුන්සේක; එසේම මසුන්ගෙන්ද ඔවුන්ට
කැමති පමණ දුන්සේක. 12ඔවුන් තෘප්තියට
පැමිණි කළ: කිසිවක් නැති නොවන පිණිස
ඉතිරිවූ කැබෙලි එකතු කරන්න යයි එතුමා
සිය ගෝලයන්ට කීසේක. 13මෙසේ
මනුෂ්‍යයන් කාලා යව රොටි පහෙන්
ඉතිරිවූ කැබෙලි එකතුකොට පැස්
දොළොසක් පුරවා ගත්තෝය. 14එබැවින්
ඒ මනුෂ්‍යයෝ එතුමා විසින් කළාවූ මේ
හාස්කම දැක: සැබවින්ම මෙතුමා
ලෝකයට එන්නාවූ අනාගතවක්තෘමයි
කීවෝය.

35යේසු ඔවුන්ට කියනසේක්:
ජීවනදායක කෑම නම් මමය. මා ළගට
එන්නාට බඩගිනි නොවන්නේය, මා
කෙරෙහි අදහන්නාට කිසිකලකත් පිපාස
නොවන්නේය.

47සැබවක් සැබවක් ඔබලට කියමි.
අදහන්නාට සදාකාල ජීවනය ඇත්තේය.
48ජීවනදායක කෑම මමය. 49ඔබලගේ
පියවරු වනයේදී මන්නා කැවෝය, නුමුත්
ඔවුහු මළෝය. 50මේ කෑම නම්, එයින්
කන කවුරු නමුත් නොමැරෙන පිණිස
සවර්ගයෙන් බැස එන කෑමය.
51සවර්ගයෙන් බැස ආ ජීවනදායක කෑම
මමය. යමෙක් මේ කැමෙන් කැවොත් ඔහු



**සදාකල් ජීවත් වන්නේය. එසේය, ලෝකයාගේ ජීවනය පිණිස මා විසින් දෙන්නාවූ කෑම නම් මාගේ මාංසය යයි කීසේක.**

**[53]ඒ නිසා යේසු ඔවුන්ට කියනසේක්: සැබවක් සැබවක් ඔබලට කියමි: ඔබලා මනුෂ්‍ය පුත්‍රයාගේ මාංස නොකනවා නම්, ඔහුගේ ලේ නොබනවා නම්, ඔබලා තුළ ජීවනය නැත. [54]මාගේ මංසය කන්නාවූ මාගේ ලේ බොන්නාවූ අයට සදාකාල ජීවනය ඇත; මම අන්තිම දවසේදී ඔහු නැගුටුවන්නෙමි. [55]මක්නිසාසද මාගේ මාංසය සැබැවු කෑමය, මාගේ ලේ සැබැවු බීමය. [56]මාගේ මාංසය කන්නාවූ මාගේ ලේ බොන්නාවූ තැනැත්තේ මා තුළ පවතියි, මමද ඔහු තුළ පවතිමි.**

## ඔබ කළ යුතු දෙය

මෙම පද කටපාඩම් කරගන්න. **යොහන් 6: 35 සහ 63**

## මෙම කතාන්දරය අපට උගන්වන දෙය

01. අපේ සියලුම වුවමනාවන් ගැන යේසු සැළකිලිමත් වෙන අතර, ඒ සියල්ල සපුරාලීමට දැනටමත් එතුමා සැළසුම් කර ඇත. නමුත් පළමුව, එතුමා තුළ අප ඇදැහිල්ල පරීක්ෂාකර බැලීමට යේසු කැමතිය. ඉතින් අපේ වුවමනාවන් ඉටුකර ගැනීමට යේසු වෙත ඒම හා එතුමා තුළ පමණක්ම රැඳී සිටීම එතුමගේ බලවත් කැමැත්තය.

02. පොඩි දෙයකට වුනත් යේසු ස්තුති කළා. දෙවිඳු මෙසේ කියයි: "සියල්ලේදී ස්තුති කරන්න. මක්නිසාද, ක්‍රිස්තුස් යේසුස් තුළ ඔබලා ගැන දේව කැමැත්ත එය වේ" - 1 තෙසලෝනික 5:18

03. ඔබේ සියලුම ප්‍රශ්නගැටළු විසඳා, සියලුම වුවමනාවන් බහුලත්වයෙන් සපුරාලීමට යේසුට පුළුවන. "අප තුළ ක්‍රියා කරන බලය හැටියට, අප ඉල්ලන හෝ සිතන සැමදෙයම බහුලත්වයෙන් දීමට එතුමට බලය ඇත" - එපීස 3: 20

04. නාස්තියට දෙවිඳු විරුද්ධය. අපට දෙන "කිසිම දෙයක් නැති නොවන" අයුරින් පරිහරණය කිරීම දේව කැමැත්තය.

අපගේ කාලය අපතේ නොහැර, එය සුදුසු ලෙස පාවිච්චි කිරීම දේව කැමැත්තය. "දවස නපුරු බැවින්, කාලය හොඳින් අල්ලාගන්න. මෙනිසා ඔබලා අඥානයෝ නොවී සවාමින්ගේ කැමැත්ත කුමක්ද කියා දැනගන්න" - එපීස 5:16,17

අපගේ *හැකියාවන්* හා *තලෙන්තු* සුදුසු ලෙස පාවිච්චි කිරීම දේව කැමැත්තය.

"ඔහුගේ ස්වාමියා ඔහුට කතා කරः යහපත් වූ, විශ්වාස වූ දාසය, ස්වල්ප දෙය ගැන ඔබ විශ්වාස විය. බොහෝ දේ ගැන මම ඔබ අධිපති කරමි. ඔබේ සවාමියාගේ ප්‍රීතියට ඇතුල්වෙන්නැයි ඔහුට කීවේය" - මතෙව් 25: 21

මුදල් පරිහරනයද සුදුසු ලෙස කිරීම දේව කැමැත්ය. "පොළොවේ ඔබලට වස්තු රැස්කර නොතබන්න. එහිදී කාවෝද මළකඩද එවා නාස්ති කරති. සොරුද උමං කැන සොරා ගනිති. නමුත් සවර්ගයෙහි ඔබලට වස්තු රැස්කර තබාගන්න. එහිදී කාවෝවත්, මළකඩවත් ඒවා නාස්ති නොකරති, සොරුද උමං කැන සොරා නොගනිති. මක්නිසාද ඔබේ වස්තුව යම් තැනකද, ඔබේ සිතද එතැනමය" - මතෙව් 6:19-21

05. යේසුගෙන් ලබාගත් ආහාර එතුමගේ ගොළුයෝ, එහි කුසගින්නේ සිටි අයට බෙදුවා. යේසුගෙන් දිනපතා අපට ලැබෙන ආහාරද "ජීවනයේ ආහාරය" වුවමනා සියල්ලන් සමඟ එලෙසම අප බෙදාගත යුතුය.

## ආහාර වර්ග දෙකක්

බඩගින්නේ සිටි සෙනඟට කෑම ලැබීම මොන සතුටක්ද! නැවතත් ආහාර වෙනුවෙන් වෙහෙසමහන්සි වී වැඩ නොකර සිටීමට අදහස් කළ ඔවුන්, යේසුව ඔවුන්ගේ රජු කරගැනීමට කැමති වුනා. නමුත් මෙතනදී, ඔවුන්ගේ මුතුන් මිත්තන්ට වූ දෙය යේසු ඔවුන්ට මතක්කර දුන්නා. දෙවිඳු පොරොන්දු වූ දේසයට ඉශ්‍රායෙල්වරු ඊජිප්තුවේ සිට යමින් සිටිනා විට, ඒ මහත් සෙනඟට බෙහෙවින් බඩගිනි ඇති වුනා. එබැවින් ඔවුන්ගේ බඩගින්න නිවාලන පිණිස, වරුසාවක් මෙන් අහසින් ඔවුන්ට දෙවිඳු කෑම එව්වා. ඇත්තෙන්ම එය මහත් හාස්කමක්! (නික්මයාම 16:14-35) ඒ සෙනඟ දැන සිටියේ නැහැ මොනවද ඒ ආහාර කියා. එමනිසා ඒවට ඔවුන් "මන්නා" කියා කිව්වා. එහි තේරුම "මේ මොනවද" යනුයි.

දෙවිඳු එසේ කළේ ඇයිද කියා එතුමාම ඒ සෙනඟට කියා දුන්නා. මෝසෙස් මෙසේ කීවාः "ඔබේ දෙවි වූ සවාමින් ඔබව යටහත් කර, ඔබව සෝදිසි කර එතුමගේ පනත් ඔබ පිළිපදිනවද නැද්දැයි ඔබේ සිතේ තියෙන දෙය දැනගන්නා පිණිස මෙම හතළිස් අවුරුද්දේ දී කාන්තාරයෙහි ඔබ ගෙන ගිය මුළු මග සිහිකරන්න. එතුමා ඔබ යටහත් කර, ඔබ බඩගින්නට පැමිණීමට ඉඩහැර, මිනිසා ජීවත්වන්නේ රොටිවලින් පමණක් නොවන බවත්, සවාමින්ගේ කටින් පිටත්වෙන සියල්ලෙන් මිනිසා ජීවත්වෙන බවත් ඔබලට දන්වන පිණිස, ඔබ නොදැන සිටියවුද, ඔබේ පියවරු නොදැන සිටියවුද මන්නාවලින් ඔබලව පෝෂණය කළෙමි". - විතීය 8:2,3



මෙසේ අවුරුදු ගණනාවක් දෙවිඳු ඔවුන්ට මන්නාවලින් පොෂණය කළා. නමුත් එය ශාරීරික ආහාරයක් පමණි. ඒවා කෑ සියල්ලන්ද අප මෙන් මහලු වුනා, මරණයට පත්වුනා. එලෙසෙම එදා යේසු දුන් ආහාරයද ශරීරය පෝෂණය කිරීමට පමණි. ඔවුන් ඒවා කෑවා, සෑහීමකට පත්වුවා; නමුත් ඔවුන්ද මහළු වුනා, මරණය දුටුවා.

නමුත් යේසු ඉතා වැදගත් දෙයක් ප්‍රකාශ කළා. එනම් එතුමා, දෙන අලුත් ආහාරයක් ගැන; තවද, එය කෑ කිසිවෙක් කිසි කලෙක නොමැරෙන බව. සියල්ලන්ගේ මාංසික ශරීර යම් දිනක මරණයට පත්වුවත් ඔවුන්ගේ ආත්මික ශරීර මැරෙන්නේ නැත. ඒ අන්තිම දවසේ දී යේසු නැවත එන විට, එම ශරීර එතුමා නැවත නැගිටුවනවා ඇත. තමා "කෑමට" සුදුසු ආහාරයක් බව යේසු ප්‍රකාශ කළේ, ඔවුන්ගේ ආත්මවලට එතුමා "ජීවමාන" ප්‍රාණයක් නිසාය. සවර්ගයෙන් මන්නා ආයේ කෙසේද, යේසුද එලෙසම අප වෙත සවර්ගයෙන් පැමිණියා. එතුමා ලෝ ආවේ, පාපී ලෝකයා වෙනුවෙන් සිය දිවි පුදා, ඔවුන්ව ගළවාගැනීමටයි. කවුරු හෝ සිය ජීවිතයට යේසු සම්දුව එකහෙලා පිළිගන්නේනම්, ඔහු තුළ යේසුගේ ජීවනය කිසිසේත් කිසිදාක මැරෙන්නේ නැත!

ජීවනයේ ආහාරය යේසුයි! අපි එය " කන්නේ " කෙසේද? කොහොමද අපි එතුමගේ ලෙය බොන්නේ? අප පාප සිය ලෙයින් සෝදාහැර, අපව පිවිතුරු කරන්නාවූ බැටළුපැටුවා යේසුය. එමනිසා, පාපයෙන් හා සාපයෙන් අපව ගළවාගැනීම පිණිස එතුමා අප වෙනුවෙන් සිය ජීවිතය රුදු කුරුසියක් මත පුද කළ බව විශ්වාස කර, පිළිගත යුතුය. අපට ජීවනය දෙන එතුමගේ නොවෙනස් ජීවමාන වචනය (බයිබලය) අප ඉගෙනගත යුතුයි; එයට කීකරුව ජීවත් විය යුතුයි. දිනපතා අප කෑම ගන්නා ලෙසම, දිනපතා අප එතුමගේ ජීවනය අප තුළට ගත යුතුයි. යේසුගේ මාංසය "කෑම" යේසුගේ ලෙය "බීම" ඇත්තෙන්ම ආත්මිකව කෙරෙන දේවල්ය.

01. දිනපතා දේව වචනයේ ආලෝකයෙන් පූර්ණ වෙන්න. පාපයක්

සිදුවුනාද, එවලේම එය පිළිගෙන, පසුතැවිලිව, දෙවිඳුට එය කියා දී, සමාව ලබාගන්න. ඔබට සමාවන යේසු, එතුමගේ ලෙයින් ඔබව සෝදා පවිත්‍ර කරයි. පෙර මෙන් එතුමා හා සබඳතා තියාගන්න. ඔබට නැවත ඉඩ ලැබෙයි. - (1 යොහන් 1: 7,9)

02. ඔබව ශුද්ධාත්මයෙන් පූර්ණ කරන්න කියා දිනපතා යේසුගෙන් ඉල්ලන්න. ඔබගේ ශක්තිය හා ක්‍රියා ශුද්ධාත්ම බලය විය යුතුයි. ඒ සියල්ලට එතුමව විශ්වාස කරන්න. ශුද්ධ බයිබලය තුළින් එතුමගෙන් උපදෙස් ඉල්ලන්න. ඇත්තෙන්ම, දේව වචනය අපට ආලෝකයක් පමණක් නොව, එය අපට ජීවනයක්ද වෙයි. යාඥාවට හුරුවෙන්න. ඉවසීමෙන් හා ඇදහිල්ලෙන් දිනපතා එතුමට යාඥා කරන්න. යේසු දෙවිඳු ගැන සිතන්න. හැමදින, හැමවෙලේ ඔබේ ප්‍රශ්නගැටළු හා වෙනත් දෑ ගැනද එතුමට සිතින් කියන්න; මෙලෙස එතුමා හා දිනපතා කතා කරන්න. එවිට ඔබට පුළුවන් නිමල දේව ගතිගුණාංගවලින් ඔබ ජීවිතය සරසවන්න.

ඔබ එවන් කරයි නම්, එහෙනම් මෙම වටිනා දේව පොරොන්දු ඔබට ඇත. "එකල සවාමින් කෙරෙහි බය ඇති අය එකිනෙකා සමග කතා කරගත්හ. සවාමින්ද කන්දී ඇසීය; එවිට සවාමින් කෙරෙහි බය ඇති, එතුමගේ නාමය සැලකූ අය ගැන, එතුමා ඉදිරියේ සිහිවීමේ පොතක් ලියන ලදී. ඔවුහු වනාහි මා විසින් පමුණුවන දවසේදී, මගේම සම්පතක් වන්නේය. මමද, මිනිසෙක් තමාට සේවය කරන තමාගේ පුතුට කරුණා කරනා සේ ඔවුන්ට කරුණා කරමියි සේනාවල ස්වාමින් කියයි" - මාලකී 3: 16,17

# දේව වචනය ඔබ ආත්මයට ආහාරයකි

යෝබ්: "මම එතුමගේ තොල්වල ආඥාවෙන් අහක්ව නොගොස්, මාගේ වුවමනා ආහාරයට වඩා එතුමගේ මුඛයේ වචන අගය කර තබාගතිමි" - යෝබ් 23: 12


යෙරෙමියා: "ඔබගේ වචනය හමුවූ විට, මම ඒවා කෑවෙමි; ඔබගේ වචන මට ප්‍රීතියක් හා සිතට සතුටක් විය. මක්නිසාද සේනාවල දෙවි වූ සවාමින්, ඔබගේ නාමය මා කෙරෙහි කියනු ලැබේ" - යෙරමියා 15: 16

ගීතිකාකරු: "ඔබගේ වචන මාගේ දිවට කොපමණ මිහිරිද? එසේම ඒවා මාගේ කටට පැණිවලට වඩා මිහිරිය" - ගීතාවලිය 119: 103

පේත්‍රුස්: "ස්වාමින් යහපත් බව ඔබලා රසබලා දැනගත්තා නම්, ආත්මික හා අමිශ්‍ර කිරිවලින් ඔබලා ගැළවීම සඳහා වර්ධනය පිණිස, අලුත උපන් බිළිඳුන් මෙන් එයට බොහෝ ආසා වෙන්න" - 1 පේත්‍රුස් 2: 2,3

දිනපතා අප ආහාරය "දේව වචනය" කරගමු.

# 12 යේසු වතුර මත ඇවිදියි



යොහාන් 6 :16 -21

[16]හවස් වූ විට එතුමගේ ගොළයෝ මුහුද ළඟට ගියහ. [17]ඔවුහු ඔරුවකට නැඟී මුහුදෙන් එගොඩව කපණීවුමට යන පිණිස ගියහ; එවිට අන්ධකාර වී තිබුණේය. ඒතාක් යේසුස් ඔවුන් ළඟට පැමිණ සිටියේ නැත. [18]තද කුණාටුවක් හමා ආ බැවින්, මුහුද බොහෝ සේ කැළඹී තිබුණේය. [19]ඔවුහු පරලොම් විසිපහක් හෝ තිහක් පමණ පැද ගිය විට, යේසු ඔරුව වෙත මුහුද මත පයින් එනවා දැක බය වූහ. [20]මමය, බිය නොවන්න, එතුමා කීය. [21]එබැවින් ඔවුහු ඉතා කැමැත්තෙන්ම එතුමාව ඔරුවට ගත්හ. ඔරුව ඔවුන් යා යුතු තැනට එකෙනෙහිම පැමිණුනේය.

## කල්පනා කිරීමට යමක්

ඔබ අද ජීවත් වෙන්නේ කුණාටුවක් මැදද? ජීවිතය අඳුරු වීද? යේසු ඔබෙන් ඈත්ව සිටින බවක් පෙනෙනවද? ඔබ හා ඔබ අවට සිටින අය ඔබලාගේම දුර්වල ශක්තියෙන් මෙම කුණාටුවෙන් මිදෙන්නටද වෑයම් කරත්ද? එසේනම් මෙය පිළිගන්න, එනම්, යේසු ඔබ ගැන බෙහෙවින් සැළකිලිමත්ව සිටින බව. එතුමා සියල්ල දනියි. එතුමට සියල්ල පෙනෙයි. ඔබගේ මෙම දුෂ්කර, දුර්වල පොර බැදීමේදී එතුමා ඔබ වෙත එනවාමයි. බය නොවන්න. ඔබගේ තත්වය කුමක් වුවත්, එතැනට යේසුව පිළිගන්න. ඒ තත්වයේ පාලනය එතුමටම බාරදෙන්න. එවිට එතුමා ඒ රළු සැඩ දිය පාර නිශ්චල කර, ඔබව ප්‍රවේසමෙන් යහ පැත්තට ගෙන යයි.

"එසේය, මරණ සෙවණේ මිටියාවත මැදින් යන්නෙම් නමුත්, කිසි උපද්‍රවයකට බය නොවෙමි; මක්නිසාද ඔබ මා සමඟය" - ගීතාවලිය 23: 4[අ]

# 13 යේසු නිදහස ගැන කතා කරයි

යොහන් 8:31-37, 42, 47

[31]එබැවින් යේසු තමන්ව අදහගත් යුදෙව්වරුනට මෙසේ කීය: ඔබලා මාගේ වචනයේ පවතිනවා නම් සැබවින්ම ඔබලා මාගේ ගෝළයන්ය. [32]ඔබලා සැබෑව දැනගන්නවා ඇත. සැබෑව ඔබලව නිදහස් කරනවා ඇත. [33]ඔවුහු එතුමට උත්තර දෙමින්: අපි ආබ්‍රහම්ගේ වංසයේය, කිසි

කලෙක අපි කිසිවෙකුට වහල් නුනෙමුව. ඔබලා නිදහස් වන්නේ යයි ඔබ කියන්නේ කොහොමදැයි කීහ. [34]යේසු ඔවුන්ට උත්තර දෙමින්: සැබවක් සැබවක් ඔබලට කියමි - පව් කරන සියල්ලෝම පාපයේ වහල්ලුය. වහලා නිතරම නිවසේ නැවතී නොසිටියි. පුත්‍රයා නිතරම නැවතී සිටියි. [36]එහෙයින් පුත්‍රයා ඔබලා නිදහස් කරන්නේ නම්, සැබවින්ම ඔබලා නිදහස් වෙති. [37]ඔබලා ආබ්‍රහම්ගේ වංසයේ බව දනිමි; එහෙත් ඔබලා තුල නිදහස් ලෙස ක්‍රියා කරන්නට මාගේ වචනය ඉඩ නැති බැවින් මා මැරීමට සොයන්නහුය.

[42]යේසු ඔවුන්ට මෙසේ කීය: දෙවියන් ඔබලාගේ පියාණන් නම් ඔබලා මට ආදරය කරති. මක්නිසාද මම දෙවියන් වෙතින් නික්ම ඇවිත් සිටිමි. මගේම කැමැත්තෙන් මා ආවා නොව, එතුමා මා එවීය. [47]දෙවියන්ගෙන් වූ තැනැත්තා, දේව වචනය අසයි. ඔබලා දෙවියන්ගෙන් නොවන නිසා ඒවා අසන්නේ නැත.

### යොහන් 7:17

[17]යමෙක් එතුමගේ කැමැත්ත කරන්න කැමැති නම් ඒ ඉගැන්වීම දෙවියන්ගෙන් වූ ඉගැන්වීමක්ද නැතහොත් මා විසින් උපදවා කියනවාදැයි ඔහු දැනගන්නේය.

## ඔබ කළ යුතු දෙය

හිස් තැන් පුරවන්න.

01. යේසු මෙසේ කීවා: ඔබලා මගේ වචනයේ.......................................සැබවින්ම ඔබලා මාගේ.......................................................(31)
02. ..........................................................ඔබලව නිදහස් කරනවා ඇත (32)
03. පව්කරන සියල්ලෝම පාපයේ....................................................(34)
04. එබැවින්..................................................ඔබලා නිදහස් කරන්නේ නම් (පාපයෙන්) සැබවින්ම ඔබලා නිදහස් වෙති. (36)
05. යේසු ඔවුන්ට මෙසේ කීවා: දෙවියන් ඔබලාගේ පියාණන් නම් ඔබලා මට ..........................................................කරති. (42)
06. ..........................................................වූ තැනැත්තා දේව වචනය අසති. (47)
07. යමෙක් දෙවියන්ගේ..............................................කරන්න කැමැතිනම් ඔහු ඒ ඉගැන්වීම දෙවියන්ගෙන්ද නැතහොත් මා විසින් උපදවා කියනවාදැයි.......................................(7:17)

# 14 ලොකයේ ආලෝකය යේසුය



යොහන් 8:12

12එබැවින් යේසු ඔවුන්ට නැවත කතා
කරමින්: මම ලෝකයේ ආලෝකයය. මා
අනුව එන්නා අඳුරේ නොහැසිර ජීවනයේ
ආලෝකය ලබන්නේ යයි කීසේක.

යොහාන් 9:1-9, 13-25, 33-38

1උන්වහන්සේ යද්දී, උපන්දා පටන්
අන්ධවූ මනුෂ්‍යයෙකු දුටුසේක. එතුමගේ
ගෝලයෝ: 2රබ්බි, මොහු අන්ධව ඉපදීමට
පව් කළේ කව්ද? මොහුද මොහුගේ
මවුපියෝදැයි ඇසුවෝය. 3එතුමා උත්තර
දෙමින්: දෙවියන්ගේ ක්‍රියා මොහු කෙරෙහි
ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ
මව්පියන්වත් පව් කල නිසා නොවේ.
4දහවල්ව තිබියදී මා එවූ තැනන්වහන්සේගේ
වැඩ අප විසින් කටයුතුය. රාත්‍රිය පැමිණේය,
එවිට කිසිවෙකුට වැඩ කරනන්ට නුපුළුවන,
5මා ලෝකයෙහි සිටින කල මම ලෝකයේ
ආලෝකයව සිටිමියි කීසේක. 6එතුමා මෙසේ
කියා බිමට කෙළ ගසා, එයින් මඩ සාදා
ඒවා ඔහුගේ ඇස්වල ගා: 7ඔබ ගොස්
සිලෝවම් පොකුණෙන් සෝදා ගන්න යයි
ඔහුට කීසේක. (සිලෝවම් යන වචනයේ
අර්ථය එවන ලද්දේය යනුයි) එවිට ඔහු
ගොස් සෝදාගෙන පෙනීම ලැබ ආවේය.
8එබැවින් අසල්වැසියෝද ඔහු
සිඟන්නෙක්ව සිටි බව පෙර දුටු අයද කථා
කොට: ඉඳගෙන සිඟමන් ඉල්ලූ තැනැත්තා
මොහු නොවේදැයි කීහ.. 9සමහරෙක්: මේ
ඔහු යයි කීහ. තවත් අය: නැත, නමුත්
මොහු ඔහු වාගේ යයි කීහ. ඒ මම යයි
ඔහු කීවේය.

13පළමු අන්ධව සිටි තැනැත්තාව ඔවුහු
ඵරිසිවරුන් ළඟට ගෙන ගියෝය. 14යේසු
මඩ සාදා ඔහුගේ ඇස් පෑදූ දවස වනාහි
සබත් දවසය. 15එබැවින් ඵරිසිවරු ඔහුට
පෙනීම ලැබුනේ කොහොමදැයි ඔහුගෙන්
නැවත ඇසුවෝය. ඔහුද: එතුමා මාගේ
ඇස්වල මඩ ගෑවේය, මම සෝදාගෙන
පෙනීම ලැබ සිටිමියි ඔවුන්ට කීවේය.
16එබැවින් ඵරිසිවරුන්ගෙන් සමහරෙක්: ඒ
මනුෂ්‍යයා සබත් දවස නොපවත්වන බැවින්
ඔහු දෙවියන් වෙතින් ආ කෙනෙක් නොවේ
යයි කීවෝය. නමුත් අන් සමහරෙක්:
පව්කාරවූ මනුෂ්‍යයෙකුට මෙබඳු හාස්කම්
කරන්ට පුළුවන් කොහොමදැයි කීවෝය.
මෙසේ ඔවුන් අතරේ භේදයක් විය.
17එබැවින් ඔවුහු නැවත අන්ධයාට කථා
කොට: ඔහු ඔබේ ඇස් පෑදූ නිසා, ඔහු
ගැන නුඹ කියන්නේ කුමක්දැයි ඇසුවෝය.
එතුමා අනාගතවක්තෘ කෙනෙකැයි ඔහු
කීවේය. 18එබැවින් යුදෙව්වරු පෙනීම ලැබූ
ඒ අයගේ මවුපියන් කැඳවන තුරු ඔහු
අන්ධව සිට පෙනීම ලැබූ බව විශ්වාස

යුදෙව්වරු පෙනීම ලැබූ ඒ අයගේ මවුපියන් කැඳවන තුරු ඔහු අන්ධව සිට පෙනීම ලැබූ බව විශ්වාස නොකොට: අන්ධව උපන්නේ යයි ඔබලා කියන ඔබලාගේ පුත්‍රයා මොහුද? එසේ නම් දැන් ඔහුට පෙනෙන්නේ කොහොමදැයි ඔවුන්ගෙන් ඇසුවෝය. [20]ඔහුගේ මව්පියයෝ ඔවුන්ට උත්තර දෙමින්: මොහු අපගේ පුත්‍රයා බවද අන්ධව උපන් බවද අපි දනිමුව. [21]නුමුත් දැන් ඔහුට පෙනෙන්නේ කොහොමදැයි නොදනිමුව; ඔහුගේ ඇස් පෑදුවේ කවුද කියාත් අපි නොදනිමුව, ඔහුගෙන් අසන්න; ඔහුට වයස් ඇත්තේය; ඔහුම තමා ගැන කියනවා ඇතැයි කීවෝය. [22]ඔහුගේ මවුපියන් මෙසේ කීවේ යුදෙව්වරුන්ට භයව සිටි නිසාය. මක්නිසාද යමෙක් එතුමා ක්‍රිස්තුස් යයි ඊත්තුගහොත් ඔහු සිනගෝගයෙන් අහක්කරනු ලබන්නේ යයි යුදෙව්වරුන් නියම කරගෙන තිබුණේය. [23]ඒ නිසා ඔහුගේ මවුපියෝ: ඔහුට වයස් ඇත්තේය, ඔහුගෙන් අසන්න යයි කීවෝය. [24]එවිට ඔව්හු අන්ධව සිටි මනුෂ්‍යයා දෙවෙනි වර කැඳවා: දෙවියන්ට ගෞරව දෙන්න. මේ මිනිසා පව්කාරයෙක් බව අපි දනිමු යයි ඔහුට කීවෝය. [25]එබැවින් ඔහු උත්තර දෙමින්: ඔහු පව්කාරයෙක්ද නැද්දැයි මම නොදනිමි. එකක් දනිමි - මම අන්ධව සිටියෙමි, දැන් මට පෙනීම ඇතැයි කීවේය.

[33]ඔහු දෙවියන්ගෙන් නොආවේ නම් කිසි දෙයක් කරන්ට ඔහුට නුපුළුවනැයි කීවේය. [34]ඔවුහු උත්තර දෙමින්: සියලු ආකාරයේ පාපවල උපන් ඔබ අපට උගන්වනවා දැයි කියා ඔහු අහක් කළෝය.

[35]ඔවුන් ඔහු අහක් කළ බව එතුමට ආරංචි විය; එතුමට ඔහු සම්භව: ඔබ දෙවියන්ගේ පුත්‍රයා කෙරෙහි අදහනවා දැයි ඇසුසේක. [36]ඔහු උත්තර දෙමින්: ස්වාමිනී, එතුමා කෙරෙහි මා අදහන පිණිස එතුමා කවුදැයි ඇසීය. [37]යේසුස් ඔහුට කියනසේක්: ඔබ එතුමා දුටුවෙහිය, ඔබ සමග කථා කරන්නෙත් එතුමා යයි කීසේක. [38]ස්වාමිනී, මම අදහමියි කියා ඔහු එතුමට නමස්කාර කෙළේය.

## කවුද මෙසේ කීවේ

01. රාත්‍රිය පැමිණෙයි, එවිට කිසිවෙකුට වැඩ කරන්න නුපුළුවන :.................................(4)
02. ඉඳගෙන හිඟමන් ඉල්ලූ තැනැත්තා මොහු නොවේද?.............................................(8)
03. ඔහු දෙවියන් වෙතින් ආ කෙනෙක් නොවේ :.................................................(16)
[ඵරිසිවරු නම් යුදෙව් ආගම් ගෝත්‍රයකි. ඔවුහු මෝසෙස්ගේ නීතිය හා චාරිත්‍ර අකුරටම මෙන් පිළිපැදි අය වෙති].

04. ඔහුගෙන්ම අසන්න. ඔහුට වයස ඇත. ඔහුගේ.......................................මෙසේ කීවේ යුදෙව්වරුන්ට බයව සිටි නිසාය. (21:23)

[සිනගෝගයෙන් පිටත දැමීම භයානක දෙයකි. එසේ වූ කලී "ලාදුරු" රෝගීන් මෙන් ඔවුන්ව සලකුනු ලබති].

05. එතුමා දෙවියන්ගෙන් නික්ම ආවේ නැත්නම් කිසිදෙයක් කරන්න එතුමට නුපුළුවන :...................................(33)

06. ඔබ දෙවියන්ගේ පුත්‍රයා කෙරෙහි අදහනවාද.................................................(35)

07. සවාමිනි මම අදහමි...........................................(38)

# යේසු ආලෝකය ගෙනෙයි

යේසු අන්ධ මිනිසාගේ ඇස් අරිය විට ඔහුගේ ජීවිතයට ආලෝකය ගෙන දුන්නා. එතුමා ලෝ ආවේ, අඳුරේ ජීවත්වන සියලු මිනිසාගේ ආත්මික ඇස් ඇරීමටය.

ලොවට ආලෝකය ගෙනන කෙනෙකු ලෝ එන බව එතුමගේ අනාගතවක්තෘන් තුළින් බොහෝ කල් සිටිම දෙවිඳු කියා සිටියා. එතුමා විස්තර කළේ යේසු ගැනයි. "[6]සවාමින් වන මම ධර්මිෂ්ඨකමින් ඔබව අඬගසා ගතිමි. මම ඔබේ අත අල්ලාගෙන, ඔබව ආරක්ෂාකර, සෙනඟගේ ගිවිසුමක් හා ජාතීන්ගේ ආලෝකයක්ද කර නියම කරමි. [7]එසේ කරන්නේ අන්ධ ඇස් අරින්නටත්, හිරකාරයන් හිරගෙයින්ද, අඳුරේ ඉන්නන් ඇඳිරි ගෙයින්ද පිටත ගෙන ඒමටත්ය" - යෙසායා 42: 6,7. යෙසායා යේසුගේ දවස දිටීය - "අඳුරේ ඇවිදි සෙනඟ මහත් අලෝකයක් දුටුහ. මරණ සෙවණ ඇති දේසයේ විසූ අය කෙරෙහි ආලෝකයක් බැබළුනේය" - යෙසායා 9:2

තමා ලෝකයේ ආලෝකය යයි යේසු කී විට, ඔහු දෙවියන් යයි ප්‍රකාශ කරන බව යුදෙව්වන්ට වැටහී ගියේ දෙවියන් ආලෝකය නිසයි. "සවාමින් මාගේ ආලෝකයත් ගැළවීමත්ය" - ගීතාවලිය 27:1 "මම අඳුරේ සිටින කළ සවාමින් මට ආලෝකයක්ව සිටියි" - මීකා 7:8[අ] දෙවිඳුට ස්තුති කරමින් දාවිත් මෙසේ කීවා: "මක්නිසාද, සවාමින් ඔබ මාගේ පහනය. සවාමින් මාගේ අඳුර ආලෝකය කරන්නේය" - 2 සැමුවෙල් 22:29

අපි යේසුව අඳුනනවානම්, එහෙනම් අපි දෙවිඳුවද අඳුනනවා. යේසු: "ඔබලා මා ඇඳිනගත්තා නම් මාගේ පියාණන්වද අඳුනනවා ඇත" - යොහන් 14:7[අ] "එසේය, යේසුස් ක්‍රිස්තුස්ගේ මුහුණෙහි දෙවියන්ගේ තේජස දැනගැන්ම නැමති ආලෝකය බැබළෙන පිණිස, අපගේ සිත්වල බැබළුවේ අන්ධකාරයෙන් ආලෝකය බැබළෙන්ට කියූ දෙවියන්ය" - 2 කොරින්ති 4:6. *මෙම ආලෝකය ඔබ ලබා ඇත්ද?*

# ආලෝකය තුළ හැසිරීම

යේසුගේ අනුගාමිකයන් තවත් අඳුරේ නොහැසිර ආලෝකයේම හැසිරෙති. "මක්නිසාද, වරක් ඔබලා අඳුරේ සිටිය මුත්, දැන් සවාමින් තුළ ආලෝකයව සිටිති. ආලෝකයේම දරුවන් සේ හැසිරෙන්න" - එපීස 5:8

"දුෂ්ඨයන්ගේ මග අඳුර මෙන්ය. ඔවුහු කුමකින් පැකිලෙද්දැයි ඔවුහුම නොදනිති" - හිතෝපදේශය 4:19. " නමුත් ධර්මිෂ්ඨයන්ගේ මාවත, ඉර මුදුන් වේලාව දක්වා, වඩවඩාත් ආලෝකමත් වන අලුයම මෙන්ය" - හිතෝපදේශය 4:18.

දේව වචනය ආලෝකයයි. "ඔබගේ වචන මාගේ පාදයන්ට පහනක්ය. මාගේ මාවතට ආලෝකයක්ය" - ගීතාවලිය 119:105. "ඔබගේ වචන එළිදරව් වීමෙන් ආලෝකය ලැබේ" - ගීතාවලිය 119:130. සැමදා දේව වචනය කියවන්න. එම සදාකාල වචනයට ගෞරවයෙන් හා සම්පූර්ණයෙන් කීකරුවෙන්න. "ආලෝකය තුළ හැසිරීම" නම් එයයි. ඇත්තෙන්ම, දේව වචනය ක්‍රියාවට දැමීම "ආලෝකය තුළ හැසිරීමයි". අප එකිනෙකාට ආදරය විය යුතු යන යේසුගේ පනත මතකද? "නමුත් සිය සොයුරාට වෛරවෙන්නා අඳුරේ සිටියි; අඳුරේ හැසිරෙයි. අඳුර ඔහුගේ නෙත් අන්ධ කළ නිසා, ඔහු කොහේ යන්නේද යත් ඔහුම නොදනියි" - 1 යොහාන් 2:11.

සැමවිට අඳුරේ හැසිරීම අන්ධවීමට ඇති කෙටිම මගයි. අඟුරු ආකර ගැඹුරුය, අඳුරුය. මේවාහි වැඩට යොදවන්නේ කොටළුවන්ය. දිගින් දිගට එවුන් එම අඳුරු ආකරවල සිටීමෙන් සම්පූර්ණයෙන්ම අන්ධ වන නිසා සතියකට වරක් හෝ එවුන්ව ආලෝකය සඳහා උඩට ගනු ලැබේ. අඳුර මෙලෙසම අපටද බලපායි. එමනිසා අප හැමවෙලේම ආලෝකයේම සිටිය යුතුයි. එසේ නොවුනොත්, බොරුවේ පියා වන සාතන්, අපව රවටා, නොමඟ යවා, අපගේ ආත්මික නෙත් හා මනස සම්පූර්ණයෙන්ම අන්ධ කරයි.

# අප ලෝකයේ ආලෝකයන්ය

"වංක වූ, හිතුවක්කාර පරම්පරාවක් අතරේ ඔබලා නිදොස්ව, අහිංසකව, දෙවිඳුගේ නිර්දෝෂ දරුවන්ව සිටින පිණිස, කෙඳිරීම්ද, විවාදද, නැතිව සියල්ල කරන්න. ඔබලා ඔවුන් අතරේ ජීවනයේ වචනය පාමින්, ආලෝකවල් මෙන් ලෝකයේ දක්නා ලබන්නාහුය" - පිලිප්පි 2:14,15. "නමුත් අන්ධකාරයෙන් තමන්ගේ විශ්මපත් ආලෝකයට ඔබලා කැඳවාගත් තැනැත්තාට ප්‍රසංසාවත්, ගෞරවයත් දක්වන පිණිසය" - 1 පේත්‍රුස් 2:9 ඔබ වටා ඉන්නා අයට ඔබගේ ජීවනය ආලෝකයද ? එසේ නැත්නම් අපෝස්තුළු පාවුල් මෙසේ අපට කියයි: "අඳුරු ක්‍රියා අහක දමා, ආලෝකයේ ආයුධ පැළඳගන්න" -රෝම 13:12

සවාමි වූ යේසුස්ගේ දෙවන ඒම ඉතාමත් ආසන්නය. එමනිසා අප එයට පිවිතුරුව සූදානම්ව සිටිය යුතුයි. අවදිව අප, ආලෝකයේම හැසිරෙමු නම්, එම ශුද්ධ ඒටමට අප සූදානම්ව ඇත. "කුමක් හෙයින්ද, ඔබලා සියල්ලන්ම, ආලෝකයේද, දවාලේද පුතුනුවන්ය. රාත්‍රියටත්, අඳුරටත්, අප අයිති නැත. එබැවින් වෙන අය මෙන් අපි නිදානොගෙන, අවදිව, සිහි ඇතිව සිටිමුව" - 1 තෙසලෝනික 5:5,6

අලුත් සවර්ගය හා පොළොව ගැන යේසු සඳහන් කළා. තවද එතුමා, එයට අලුත් යෙරුසලම කියාද සඳහන් කළා. එහි සවභාවය ගැන යේසු මෙසේ කියයි: "දෙවිඳුගේ තේජසින් නුවර ආලෝකවත්ව, බැටළුපැටවා (යේසු) එහි පහන වන නිසා, එහි බැබළීමට ඉරවත්, සඳවත් ඕනෑ නැත" - එළිදරව් 21:23 අප සදාකාල ආලෝකය යේසුම වීම කොපමණ චමත්කාරද !

## ආලෝකය තිබෙන තුරු එහි සේවය කිරීම

මෙම ලොව භීතිකය, අඳුරුය. නමුත් මෙම දරුණු අඳුරු ලොවට බිය නොවී, යේසු නැවත එන තුරු, එතුමගේම ආලෝකයේ රැඳී, අප එතුමට සේවය කළ යුතුයි. දිනක මෙම අඳුරු ලොව සඳහටම විනාශ කරනු ලබයි - මතෙව් 5:18. කවුරු හෝ මෙම ආලෝකය තුළට ඇවිත් නැද්ද, මෙම අඳුරු, පාපි ලොව සමඟ ඔවුන්වද සදාකාල අඳුරට (අපායට) හෙලනු ලැබේ - මතෙව් 22:13. එමනිසා, අප වෙහෙසට පත් නොවී, "ඔවුන්ගේ පාපවලට සමාව ලැබෙන පිණිස, ඔවුන්ව අඳුරෙන් ආලෝකයටද, සාතන්ගේ බලයෙන් දෙවියන් වෙතටද හැරෙන පිණිස....." අප සේවය කරමු - ක්‍රියා 26:17,18.

එදා යුදෙව්වරුන් යේසුගෙන් මෙසේ ඇසුවා: "දෙවියන්ගේ ක්‍රියා ඉටුකරන පිණිස අප කුමක් කළ යුතුද?" එවිට යේසු: "දෙවියන්ගේ ක්‍රියා නම් එතුමා එවූ තැනැත්තා කෙරෙහි විශ්වාස කිරීමය, අදහාගැනීමය - යොහන් 6:28,29. ඔබලා විශ්වාස නොකරන්නේනම්, ඔබලාගේම පාපයේ ඔබලා මැරෙනවා ඇත" - යොහන් 8:24.

සදාකාල ජීවනය පිණිස අප ආලෝකයට පැමිණ තිබේද යත්, පළමුව අප තහවුරු කරගත යුතුයි. ඉන්පසු අන් අයව මෙම සදාකාල ආලෝකයට ගෙන ඒම පිණිස යේසු සමඟ අප සේවය කළ යුතුය. "නැති වී යන කෑම පිණිස වැඩ නොකරන්න" යේසු කීය. "නමුත් මනුෂ්‍ය පුත්‍රයා දෙන සදාකාල කෑම පිණිස වැඩ කරන්න" - යොහන් 6:27.

මෙම කතාන්තරයේ එන අන්ධ මිනිසව මතකද? සියලු බිය සැකයෙන් තොරව, ඔහුට යේසු කළ මහත් භාස්කම ගැන අන් අයට පැවසුවා. ආත්මිකව අන්ධව සිටි අය ඔහුව නොසලකා, පිටුදක්කා. නමුත් යේසු ඔහුට බෙහෙවින් සලකා, එතුමා ගැන තවත් එළිදරව් කරන පිණිස ඔහු වෙත ආවා.

# 15 යේසු යහපත් බැටළුඑඬේරාය



යොහන් 10:1-16 ; 27-33

1සැබවක් සැබවක් ඔබලට කියමි -
දොරකඩින් බැටළුගාලට ඇතුල් නොවී
වෙන මඟකින් නැගී එන්නා සොරෙක්ද
කොල්ලකන්නෙක්ද වේ. 2නුමුත් දොරකඩින්
ඇතුලුවෙන්නා බැටළුවන්ගේ එඬේරාය.
3ඔහුට දොරටු පාලකයා දොර හරියි;
බැටළුවෝ ඔහුගේ හඬ අසති. ඔහු
තමාගේම බැටළුවන්ගේ නම් කියා අඬගසා
එවුන් පිටපත ගෙන යයි. 4ඔහු සිය සියලු
බැටළුවන් පිටතට ඇරියාම ඔහු එවුන්ට
පෙරටුව යයි. බැටළුවෝද ඔහුගේ හඬ
අඳුනන බැවින් ඔහු පස්සේ යති. 5එවුන්
අන්‍යයෙකු පස්සේ නොගොස් ඔහු වෙතින්
පලායන්නේ යයි කීසේක. 6යේසුස් ක්‍රිස්තුස්
මේ උපහාරය ඔවුන්ට කී නුමුත් එතුමා
විසින් කියන ලද කාරණා මොනවාදැයි
ඔවුන් තේරුම් ගත්තේ නැත. 7එනිසා යේසුස්
නැවත ඔවුන්ට කියනසේක්: සැබවක්
සැබවක් ඔබලට කියමි - බැටළුවන්ගේ
දොරකඩ මමය. 8මට පළමු ආ සියල්ලෝම
සොරු සහ කොල්ලකරුවන්ය. නමුත්
බැටළුවෝ ඔවුන්ට ඇහුම්කන් නුදුන්නෝය.
9දොරකඩ නම් මමය. යමෙක් මා තුළින්
ඇතුල්වේද, ඔහු ආරක්‍ෂාකරනු ලැබ
ඇතුලට සහ පිටතට ගොස් ගොදුරු
ලබන්නේය. 10සොරා එන්නෙ සොරකම්
කරන්ටත්, මරන්ටත්, විනාශ කරන්ටත්
පමණක්ය. මා අවේ ඔවුන්ට ජීවනය
ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන
පිණිසත්ය. 11මම යහපත් බැටළු එඬේරාය.
යහපත් බැටළු එඬේරා තමාගේ ජීවිතය
බැටළුවන් උදෙසා දෙන්නේය. 12එඬේරෙක්
නොවූ, බැටළුවන්ගේ අයිතිකාරයා නොවන
කුලීකාරයා, වෘකයා එනවා දැක බැටළුවන්
අතහැර පලා යයි. වෘකයා එවුන් අල්ලමින්
විසරුවා දමයි. 13ඔහු පලායන්නේ ඔහු
කුලීකාරයෙකු නිසාත් බැටළුවන් ගැන
නොසලකන නිසාත්ය. 14මම යහපත් බැටළු
එඬේරාය; පියාණන් මා අඳුනන්නා සේම,
මා පියාණන්වද අඳුනන්නා සේම, මම මාගේ
බැටළුවන් අඳුනමි. 15මාගේ බැටළුවෝද මා
අඳුනති; බැටළුවන් උදෙසා මාගේ ප්‍රාණය
දෙමි. 16තවද මේ ගාලට අයිති නොවූ
වෙනත් බැටළුවන්ද මට ඇත. ඔවුන්වද
මා විසින් ගෙනෙන්නට ඕනැය. ඔවුහු මගේ
හඬ අසති; එසේ එක රැළක්ද එක
එඬේරෙක්ද වෙයි.

27මාගේ බැටළුවෝ මාගේ හඬ අසති,
මමද ඔවුන් අඳුනමි, ඔවුහු මා පස්සේ එති.

**[28]මම ඔවුන්ට සදාකාල ජීවනය දෙමි; ඔව්හු
කිසි කලෙකත් විනාශ නොවෙති. [29]ඔවුන්
මට දුන්නාවූ මාගේ පියාණන් සියල්ලන්ටම
වඩා උතුම්ය; පියාණන්ගේ අතින් ඔවුන්ව
උදුරාගන්ට කිසිවෙකුටත් බැරිය. [30]මමද
පියාණන්ද එක් තැනැත්තා යයි කීසේක.
[31]යුදෙව්වරු එතුමට ගසන්ට නැවතත් ගල්
අතට ගත්තෝය. [32]යේසුස් ඔවුන්ට උත්තර
දෙමින්: පියාණන්ගෙන් බොහෝ යහපත්
ක්‍රියා ඔබලට දැක්වීමි; එයින් කොයි ක්‍රියාව
නිසා මට ගල්ගසන්නහු දැයි ඇසුසේක.
[33]යුදෙව්වරු එතුමට උත්තර දෙමින්: අප
ඔබට ගල් ගසන්නේ යහපත් ක්‍රියාවක් නිසා
නොව දේව අපහාසය නිසාය; මිනිසෙක්වූ
ඔබ දෙවියන් වෙන්ට හදන නිසා යයි
කීවෝය.**

# මෙම කතාන්තරයේ අපට ඇති පාඩම්

1. ගැළවීමට ඇති එකම මග යේසුය. අප එතුමගේම ආදර බැටළුවන් වන්නේ, එතුමගේ හඬ අසා, කීකරුව, එතුමා පසුපස ගිය විට පමණක්ය. ඔබගේම නමින් එතුමා ඔබට අඬගසයි; එතුමම ඔබට මඟපෙන්වයි. එතුමගේ නිල් ගොදුරු බිම්වල ඔබට ලගින්නට සළස්වයි; එතුමගේම ජීවනය ඔබට පිරිනමයි. “අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළාවී, එකිනෙකා තමතමාගේ මාර්ගයට හැරී ගියෙහ; සවාමින්ද, අප සියල්ලන්ගේ අයුතුකම් එතුමා පිට තැබුසේක” - යෙසායා 53:6. එතුමගේ මග යන පිණිස, ඔබගේ මඟ අත් හැරියද?

2. එකම සැබෑ බැටළු එඬේරා යේසුමය. “මක්නිසාද එතුමා අපේ දෙවියන්ය; අපි එතුමගේ ගොදුරු බිමේ සෙනඟය, එතුමගේ සුරතේ බැටළුවන්ය” - ගීතාවලිය 95:7[අ]. “සවාමින් දෙවියන් බව දැනගන්න, අපව මැව්වේ එතුමාය, අපම නොවේ. අපි එතුමගේ සෙනඟය; එතුමගේ ගොදුරු බිමේ බැටළුවන්ය” - ගීතාවලිය 100:103.

3. අප එතුමගේ බැටළුවන් නම් එතුමා අපව අඳුනයි, අපද එතුමව අඳුනයි. “එහෙත් සවාමින් ඔබ මා දනියි, ඔබ මා දකියි. මා සිත ඔබ කෙරෙහි තියෙන්නේ කෙසේද යත් ඔබ විභාග කරයි” - යෙරෙමියා 12:3[අ]. ඔබගේ එඬේරා යේසු බව ඔබ දන්නවාද? ඔබ එය තරයේ විශ්වාස කරනවා නම්, එහෙනම් යේසු පසුපස පමණක්ම ඔබ පියමැනිය යුතුය. ඒ උතුම් එඬේරා ඔබව අඳුනනවද? අප එකම සැබෑ එඬේරා එළිදරව් වු විට බොහෝ අය එතුමට මෙසේ කියති: ”සවාමිනි, සාවාමිනි, ඔබගේ නාමයෙන් අනාගතවාක්‍යය නොකියෙමුද? ඔබගේ නාමයෙන් යක්ෂයන් දුරු නොකෙළෙමුද? ඔබගේ නාමයෙන් නොයෙක් බලවත් ක්‍රියා නොකෙළෙමුද? එවිට යේසු මෙසේ ඔවුන්ට කියනවා ඇත: “කිසි කලෙකත් මම ඔබලා නැඳින්නෙමි. අධර්මිෂ්ඨකම් කරන්නෙනි, මා කෙරෙන් අහක්ව යත්වා කියා මම ඔවුන්ට කියමි” - මතෙව් 7:22,23. අපි ඒ එඬේරාට අයිතිය කියමින්, අපේම මංමාවත්වල යෑම

වංචාවකි. "ශුද්ධකම නැතිව, කිසිවෙක් සවාමින්ව දක්නනේ නැත" - හෙබ්‍රෙව් 12:14.

4. අප යේසුටම අයිති නම්, සදහටම අප ආරක්‍ෂා වී ඇත. එවිට කිසිවෙකුට බැහැ අපව එතුමගේ අතින් උදුරාගන්න. මෙම පොරොන්දුව දී තිබෙන්නේ සවාමි වු යේසුස් ක්‍රිස්තුස් නැමති සර්වබලපරාක්‍රම එඬේරා" පසුපස යන බැටළුවන්ටය.

5. යේසු අනුගාමිකයන් අමුත්තන්ගෙන් පලා යා යුතුයි. සොරකම් කරන්ටත්, මරන්ටත්, විනාශ කරන්ටත් එන සතුරෙකි සාතන්.

6. යේසු, දෙවියන් බව පවසයි. තමා යහපත් බැටළු එඬේරා බවද, තමා හා පියාණන් එක්කෙනෙක්ම බවද යේසු පැවසු විට, එතුමා දෙවියන් හා එකසමාන ලෙස අඟවන බව එකළ යුදෙව්වන්ට එත්තු ගියා. ඇත්තෙන්ම ඔවුන් දෙවියන්ගෙ සැබෑ අනුගාමිකයන් නම්, ඔවුන්ගේද එඬේරා යේසු බව ඔවුන්ට පිළිගැනීමට තිබුණා. එහෙත් එසේ සිදුවුනේ නැහැ. යෙසායා මෙසේ කීවා: "[10]බලන්න, සවාමි වු දෙවියන්.......එනසේක. [11]එඬේරෙකු සේ එතුමා, සිය රැළ පෝෂණය කරනසේක; බැටළු පැටවුන්වද සිය සුරතින් ගෙන සිය ළයේ දරමින්, කිරිදෙන බැටළුදෙනුන් සෙමින් ගෙනයනසේක" - යෙසායා 40:10,11.

# එඬේරාගේ ගීතිකාව

**ගීතාවලිය 23**

**[1]සවාමින් මාගේ එඬේරාය, මට හිඟයක් නොවන්නේය. [2]එතුමා මා නිල්ගොදුරු බිම්වල ලගින්ට සලස්වන්නේය. නිසල දිය අසළින් මා ගෙනයන්නේය. [3]එතුමා මා ආත්මය ප්‍රාණවත් කරන්නේය, සිය නාමය නිසා දැමිටු මාවත්වල මා ගෙනයන්නේය. [4]එසේය, මරණ සෙවනේ මිටියාවත මැදින් යන්නෙම් නමුත්, කිසි අනතුරකට බය නොවන්නෙමි. මක්නිසාද, ඔබ මා සමඟය. ඔබ ඔබගේ දණ්ඩෙන් හා සැරයටියෙන් මට සැනසීම ලැබෙන්නේය. [5]මාගේ සතුරන් ඉදිරියේ ඔබ මට කෑම මේසයක් පිළියෙල කරන්නේය; මාගේ හිස තෙලින් ආලේපනය කරන්නේය; මාගේ කුසලාන උතුරා යයි. [6]සැබවින්ම යහපත්කමත්, කරුණාවත්, මාගේ ජීවිතයේ සියළු දවස්වලම මා අනුව එන්නේය. සදාකල්හිම මම සවාමින්ගේ නිවසේ වාසය කරමි.**



# 16 නැවත නැගිටීමද, ජීවනයද යේසුය

යොහන් 11:1-7, 17-46

1මරියාගේද ඇගේ සහෝදරිවූ
මාර්තාගේද ගම වූ බෙතානියෙහි ලාසරුස්
නම් එක්තරා මිනිසෙක් රෝගීව සිටියේය.
2ඒ මරියා නම් සවාමීන්ට සුවඳ තෙල්
ආලේප කොට ඇගේ හිසකෙස්වලින්
එතුමගේ පාද පිස දැමූ තැනැත්තීය,
රෝගීව සිටි ලාසරුස් ඇගේ සහෝදරයාය.
3එබැවින් ඔහුගේ සහෝදරියෝ: සවාමිනී
ඔබ ආදරේව සිටින තැනැත්තා රෝගීව
සිටී යයි එතුමට කියා යැවූහ. 4නමුත්
යේසුස් ඒ අසා: ඒ රෝගය මරණය පිණිස
දෙවියනගේ පුත්‍රයා මහිමයට පමුණුවන
ලබන පිණිස දෙවියන්ගේ ගෞරවය සඳහා
යයි කීසේක.

5එතුමා මාර්තාටද ඇගේ සහෝදරියටද
ලාසරුස්ටද ප්‍රේම කළසේක. 6ඔහු රෝගීව
සිටින බව එතුමා ඇසූ කල්හි, තමන් සිටි
ස්ථානයේම තව දෙදවසක් නැවතුනේය..
7ඉන්පසු එතුමා: යුදයට නැවත යමු යයි
ගෝලයන්ට කීසේක.

17එසේ යේසුස් ආ කළ ඔහු සොහොන්
ගෙයි තබා එවකට සතර දිනක් වූ බව
දැනගත්සේක. 18බෙතානිය යෙරුසලමට
කිට්ටුව හැතැප්ම දෙකෙක් පමණ දුරව
තිබුණේය; 19යුදෙව්වරුන්ගෙන් බොහෝ
දෙනෙක්ද මාර්තා සහ මරියා ඔවුන්ගේ
සහෝදරයා ගැන සනසන පිණිස ඇවිත්
සිටියෝය. 20එබැවින් මාර්තා යේසුස් එන
බව ඇසූ විට එතුමා හමුවීමට ගියාය.
නුමුත් මරියා ගෙයි ඉඳගෙන උන්නාය.
21එසේ හෙයින් මාර්තා යේසුස්ට කියන්නී:
සවාමිනී, ඔබ මෙහි සිටිසේක් නම් මාගේ
සහෝදරයා නොමැරෙයි. 22දැනුත් ඔබ
දෙවියන්ගෙන් යමක් ඉල්ලයි නම්, එය
දෙවියන් ඔබට දෙන බව දනිමියි කීවාය.
23ඔබේ සහෝදරයා නැවත නැගිටින්නේ
යයි එතුමා ඈට කීසේක. 24අන්තිම දවසේ
නැවත නැගිටීමේදී ඔහු නැවත නැගිටින
බව දනිමියි මාර්තා එතුමට කීවාය. 25යේසුස්:
නැවත නැගිටීමද, ජීවනයද, මමය. මා
කෙරෙහි අදහන්නා මළ නුමුත් ජීවත්
වන්නේය. 26ජීවත්ව සිටින කවුරු නමුත්
මා කෙරෙහි අදහන්නේද, ඔහු කිසිකලෙකත්
නසින්නේ නැත. මේය විශ්වාස කරන්නේදැයි
ඈට කීසේක. 27ඈ: එසේය, සවාමිනී ඔබ
දෙවියන්ගේ පුත්‍රවූ ලෝකයට එන
තැනැත්තා වන ක්‍රිස්තුස් බව විශ්වාස
කරගෙන සිටිමියි එතුමට කීවාය.

28ඈ මෙසේ කියා ගොස් ඇගේ
සහෝදරිවූ මරියා රහසින් කැඳවා:
ආචාරීන් ඇවිත් ඔබට අඬගසතියි කීවාය.
29ඈ එය අසා වහාම නැගිට එතුමා ළඟට
ගියාය. 30(ඒ වන තුරු යේසුස් ගමට
නොපැමිණ මාර්තා එතුමට හමුවූ තැනම
සිටිසේක.) 31එවිට මරියා සනසමින් ඈ

සමග ගෙයි සිටි යුදෙව්වරු, ඈ වහාම නැගිට පිටතට යන බව දැක, සොහොන් ගේ ළඟදී අඬන පිණිස එහි යන්නී යයි සිතා, ඈ පස්සේ ගියෝය. 32එබැවින් මරියා යේසුස් සිටි තැනට ඇවිත්, එතුමා දැක, එතුමගේ පාමුල වැටී: සවාමිනී, ඔබ මෙහි සිටියේ නම්, මාගේ සහෝදරයා මැරෙන්නේ නැතැයි එතුමට කීවාය.

33යේසුස් ඈ අඬනවාත් ඈ සමග ආ යුදෙව්වරු අඬනවාත් දැක, ආත්මයෙන් සුසුම්ලා, කැලඹී: 34ඔහු කොතැන තැබුවේ දැයි ඇසුසේක. සවාමිනී, ඇවිත් බැලුව මැනවයි ඔවුහු එතුමට කීවෝය.

35යේසුස් ඇඬුසේක. 36එසේ හෙයින් යුදෙව්වරු කථා කොට, ඔහු මොහුට කොපමණ ආදරේ ඇත්ද බලන්න යයි කීවෝය. 37නුමුත් ඔවුන්ගෙන් සමහරෙක්: අන්ධයාගේ ඇස් පැහැදු ඔහුට මේ තැනැත්තා නොමැරී සිටින්ට සලස්වන්නට බැරිවුයේදැයි කීවෝය. 38එවිට එතුමා නැවත තමන් තුළ සුසුම්ලමින් සොහොන් ගේ ළඟට පැමිණිසේක. එය වනාහි ගුහාවක්ය, ඊට ගලක් හේත්තුකර තිබුණේය. 39ගල අහක්කරන්නැයි එතුමා කීසේක. මළ තැනැත්තාගේ සහෝදරීවු මාර්තා: සවාමිනී, ඔහු මැරී සතර දවසක් වන බැවින් දැන් ගඳ ඇතැයි කීවාය. 40යේසුස්: ඔබ විශ්වාස කළොත් දෙවියන්ගේ මහිමය දකින්නේය කියා මා කීවා නොවේදැයි ඈට කීසේක. 41එවිට ඔවුහු ගල අහක් කළෝය.

යේසු ඇස් ඔසවා: පියාණෙනි, ඔබ මාගේ වචන ඇසු නිසා ඔබට ස්තුති කරමි. 42ඔබ නිතරම මාගේ වචන අසන බව දැනගෙන සිටියෙමි. නුමුත් මා එසේ කීවේ ඔබ විසින් මා එවු බව අවට සිටින සමුහයා විශ්වාස කරන පිණිස ඔවුන් නිසා යයි කීසේක. 43එතුමා මෙසේ කියා: ලාසරුස් පිටතට එන්න කියා මහත් ශබ්දයකින් කීසේක. 44මැරී සිටි තැනැත්තා පිටතට අවේය; ඔහුගේ අත්පා වස්ත්‍රවලින් බැඳ මුහුණද රෙදිකඩකින් ඔතා තිබුණේය. මොහු මුදා යන්ට හරින්නැයි එතුමා ඔවුන්ට කීසේක. 45එබැවින් මරියා වෙතට ආ යුදෙව්වරුන්ගෙන් බොහෝ දෙනෙක් එතුමා කළ දෙය දැක එතුමා කෙරෙහි අදහා ගත්තෝය. 46නුමුත් ඔවුන්ගෙන් සමහරෙක් ඵරිසිවරුන් ළඟට ගොස් යේසුස් කළ දේවල් ඔවුන්ට කීවෝය.



# කල්පනා කිරීමට යමක්

සිය මිතුරන්ට යේසු බෙහෙවින් ආදරේ බව දැනගැනීම කොපමණ යහපත්ද? එතුමා කියන දෙය ඔබ කරනවා නම්, ඔබද එතුමගේම මිතුරෙකි - යොහන් 15:14. යේසුගේ මිතුරන් ඉතා දුක්බර තත්වයක සිටි බව මෙම කතාන්දරය අපට කියයි. ලාසරස් මැරී ඇත. පළමුව එතුමා ඒ ගැන තැකීමක්වත් කළේ නැති බව අපට පෙනෙයි. ඔබ යම් අසීරු තත්වයක සිටිනා විට, දෙවිඳු ඔබව එලෙස ගණන් නොගෙන ඉන්නා බව ඔබට හැඟී තියෙනවද? දෙවිපියාණන් කිසි කළෙක නෙත් පියගෙන නැහැ. ඔබ කෙරෙහි එතුමගේ නෙත් හැමවිට ඇරී තියෙනවා. එවගේම එතුමට හැමවේලේම සැලැස්මක් තියෙනවා. දෙවිපියාණන් වෙත සියලුම ගෞරවය, මහිමය හා ප්‍රසංසාව ගෙන එන පිණිස අපිද, හැමවේලේව අවදිව යේසුව විශ්වාස කළ යුතුයි.

ඔබ කෙරෙහි දෙවිඳුට සැලැස්මක් තියෙනවා. එතුමගේම පුත් යේසු මෙන් ඔබවද හදාගැනීම එතුමගේ සතුටයි. "තවද දෙවිඳුට ආදරය කරන්නන්ට, එනම් එතුමගේ අභිප්‍රාය ලෙස කැඳවූ අයට, සියලුදෙයම යහපත පිණිස එකට ක්‍රියා කරන බව අපි දනිමුව. මක්නිසාද එතුමා පූර්වයෙන් අඳුනාගත් අය එතුමගේ පුතුනුවන් බොහෝ සොයුරන් අතරේ කුලුඳුලා වන පිණිස ඒ පුතුනුවන්ගේ සවරූපයට සමානවෙන්ට පූර්වයෙන් නියම කළසේක" - රෝම 8:28,29. සමහරවිට අපට කරදරකාරී දවස් පැමිණෙන්නේ අන්න ඒ නිසායි: එසේ ශෝකයට පත්වන්නේ නාස්ති වී යන, එසේද වුවත් ගින්නෙන් සෝදිසි කරන පණට වඩා අගේව තිබෙන ඔබලගේ ඇදහිල්ල පරීක්‍ෂා කිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්ගේ එළිදරව්වීමේ දී ප්‍රසංසාවත්, මහිමයත්, ගෞරවයත් පැමිණෙන පිණිසය" - 1 පේත්‍රුස් 1:7.

මරියාට හා මාර්තාට මෙන් අපටද යේසු මෙහි උගන්වන පාඩම නම්, යේසු තුළ විශ්වාස කරන කවුරු නමුත් නොමැරෙන බවයි. යේසු තුළ ජීවත්වන අය මැරුණු විට "ශරීරයෙන් ඈත්වූ නමුදු සවාමින් සමඟ සිටිනවා ඇත" - 2 කොරින්ති 5:8

මරණයට පත් යම් අයෙකුගේ නම කීමෙන් පමණක්, ඒ අයව මරණින් නැවත ජීවනයට ගෙන ඒමට එතුමට හැකි බව මෙහිදී යේසු ඔප්පු කළා. (යේසු තමාට හඬගසන බව ලාසරස්ට ඇසී ඔහු ජීවත් වුනා). නැවත යේසු මෙහි එන විට: "දේව පුත්‍රයාගේ හඬ මළවුන්ට ඇසෙන පැය පැමිණෙන්නේය.... අසන අය ජීවත් වන්නේය" - යොහන් 5:25.


මෙදැනුත් දොරටුව නැමැති ඔබේ හදවතට යේසු තට්ටු කරමින් සිටියි. "යමෙක් මගේ හඬ අසා දොර අරියි නම්, මම ඔහු තුළට එන්නෙමි" - එළිදරව් 3:20. එතුමගේ

හඬ අසා දොර අරින්නන්, අළුත් මැවිල්ලක් බවට පත්වෙයි. "ඔබලා ඔබලාගේ වරද සහ පාප නිසා මැරී සිටි කළ එතුමා ඔබලව ජීවත් කළසේක" - එපීස 2:1. එලෙසම ඔබලත් පාපයට මැරී සිටින්නන් ලෙසද, යේසුස් ක්‍රිස්තුස් තුළ දෙවිඳුන්ට ජීවත්ව සිටින්නන් ලෙසද, සිතාගන්න. එබැවින් ඔබලා ඔබලගේ මරණීය වු ශරීරයේ තෘෂ්ණාවලට කීකරු වන ලෙස පාපය එහි අධිපතිකම් නොකෙරේවා. ඔබලගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධ කොට පාපයට භාර නොදී, ඔබලා මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවිඳුට භාර වී, ඔබලගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධ කර එතුමට භාර දෙන්න" - රෝම 6:11-13.

## එම භාස්කමට වුවමනා වුයේ කීකරුකම පමණි

භාස්කමින්ම විසඳිය යුතු යම් බලාපොරොත්තු රහිත තත්වයකට ඔබ මුහුණ පා තියෙනවාද? "දේව මහිමය සඳහා" ඔබ දිවියට විවිධ ගැටළු ඒමට සමහර අවස්ථාවල යේසු ඉඩ හරිනවා. නමුත් එතුමා මාර්තාට සහ මරියාට ආදරය කළ සේම ඔබටද ආදරේ බව අමතක කරන්න එපා. ඔබ කිසිදාක බලාපොරොත්තු නොවන ආකාරයේ භාස්කමක් දැනටමත් ඔබ වෙනුවෙන් යේසු සැලසුම් කරමින් සිටිනවා ඇත. මෙම නව ජීවනයේ භාස්කමට වුවමනා වෙන්නේ ඔබගේ යටහත් කීකරුකම පමණක් බව සිත් බැදගන්න. යේසු, "ගල පෙරලා දමන්න" කී විට සමහර විට එය මෝඩකමක් යයි ඔවුන්ට සිතෙන්නට ඇති, එහෙත් ඔවුන් එයට කීකරු වුනා. ලාසරස් නැගිට ආ පසු, "බැඳුම් ලිහා ඔහුට යන්න ඉඩ හරින්න" කියා යේසු කීවා.

දේව බලයේ අභිමානවත් තේජස් බලය දැකගැනීමට නම්, ශුද්ධාත්මයාණන් මග පෙන්වන ඉතා කුඩා දෙයකට වුවද අප සම්පුර්ණයෙන්ම කීකරු විය යුතුය. අප ඉතා සුළු වශයෙන් වැරදි වුනත්, යම් කෙනෙකුගෙන් සමාව ලැබගත යුතු නම්, අප එසේ කළ යුතුමයි. යේසු සමිඳුට භාස්කමක් කිරීමෙහිලා අනිත් අයගේ හදවතින් අරන් දැමීමට ඇති ගල සමහර විට එය වීමට බැරි නැත. එසේ යේසු භාස්කමක් කළ පසු ඔවුන්ගේ සම්පුර්ණ නිදහසට බාධා කරන සියල්ලෙන් ඔවුන්ව නිදහස් කරන පිණිස අපද ඔවුන්ට උපකාර විය යුතුයි. යේසුගේ භාස්කම් සඳහා එතුමගේ මිතුරන් ද එකතු කරගැනීම කොපමණ උතුම්ද ?



# 17 යේසුව මැරීමට මන්ත්‍රණ සභාව සැළසුම් කරයි

**යොහාන් 11:47-53**

**47එබැවින් නායක පූජකයෝද**
**ඵරිසිවරුන්ද මන්ත්‍රණ සභාවක් රැ**
**ස්කරවා: අපි කුමක් කරමුද? මේ මිනිසා**
**බොහෝ හාස්කම් කරයි. 48අපි ඔහුට**
**මෙසේ ඉඩ හරිමු නම් සියල්ලන් ඔහු**
**කෙරෙහි අදහා ගනිති. එවිට රෝමවරුන්**
**ඇවිත් අපේ ස්ථානයත් අපේ ජාතියත්**
**පැහැරගන්වා ඇතැයි කීවෝය. 49එවිට**
**ඔවුන්ගෙන් එක්කෙනෙක් වන ඒ අවුරුද්දට**
**උත්තම පූජකයා වූ කායාපස් ඔවුන්ට**
**මෙසේ කීවේය: 50ඔබලා කිසිවක් දන්නේ**
**නැත, මුළු ජාතිය විනාශ නොවන පිණිස**
**සෙනග උදෙසා එක මිනිසෙකුගේ මරණය**
**ඔබලට ප්‍රයෝජන ඇති බව ඔබලා**
**කල්පනා කරන්නේ නැතැයි කීවේය. 51ඔහු**
**ඒ කීම තමා විසින්ම උපදවා කීවා**
**නොවේය. ඔහු ඒ අවුරුද්දට උත්තම**
**පූජකයාව සිටි බැවින්, එතුමා ඒ ජාතිය**
**උදෙසා මැරෙන බවත්, 52ඒ ජාතිය උදෙසා**
**පමණක් නොව දෙවියන්ගේ විසිර ගිය**
**දරුවන් එකට රැස්කරන පිණිස මැරෙන**
**බවත් අනාගත වාක්‍යයෙන් කීවේය.**
**53මෙසේ එදා පටන් ඔවුහු එතුමා මරණ්ට**
**කුමන්ත්‍රණය කළෝය.**

## රජෙකුව ප්‍රතික්ෂේප කිරීම

යුදෙව් මන්ත්‍රණ සභාව යේසුගේ හාස්කම් දැක තියෙනවා. තවද, එතුමා පියාණන් හා එක සමාන බවත්, ආබ්‍රහම්ට ප්‍රථම සිටි බවත්, යේසු උගන්වන බවත් ඔවුන් අසා තියෙනවා - යොහාන් 8:58. මේ සියල්ල මෙපමණ පැහැදිලිව තිබියදීත් දෙවියන් ඔවුන්ට පොරොන්දු වූ ඊශ්‍රායෙල් රජ යේසු බව විශ්වාස කිරීම හෝ පිළිගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කළා.

මෙයින් සඳහන් වන්නේ එම යුදෙව් නායකයන් තමන් සතු ඉහළ තනතුරු අත්හැරීමට අකමැති වූ බවයි. ඔවුන් හරියට යේසු ඉගැන්වූ එක් උපමාවක එන මෙහෙකරුවන් මෙන්ය. එම මෙහෙකරුවන්: "මෙම මිනිසා අප කෙරෙහි රජකම් කරනවට අප අකමැතිය" කියා සිටියා - ලූක් 19:14. ඉතින් එම යුදෙව් නායකයින් යේසුව මැරීමට තීරණය කළා. යේසුස් ලෝ ආවේ අපව පාපයෙන් ගළවන පිණිස සිය ජීවිතය සිය කැමැත්තෙන්ම පුද කිරීමටයි. එසේ නොවුනා නම් එම යුදෙව් නායකයන්ට එතුමගේ සෙවනැල්ල ළඟටවත් ඒම උගහටය.

ලෝ අත්තිවාරමටත් ප්‍රථම යේසු තුළ දෙවිඳුගේ සැළසුම වූයේ ඉශ්‍රායෙල් ජාතිය පමණක් නොව, මුළු ලොවම පාපයෙන් හා සාපයෙන් ගළවාගැනීමටය. "එහෙත් එතුමා පොඩිකරනු ලැබීමට ස්වාමින් කැමතිව, එතුමාව දුකට පත් කළේය. ඔබ එතුමගේ ප්‍රාණය පාප පූජාවක් කරන විට, එතුමා සිය වංසය දකින්නේය. සවාමින්ගේ කැමැත්තද එතුමගේ සුරතේ සපලවන්නේය" - යෙසායා 53:10.

# 18 වටිනා තෑග්ගක කතාන්දරය

යොහාන් 12:1-8



[1]යේසුස් පාස්කු මංගල්‍යයට සදවසකට
පළමුවෙන් බෙතානියට ආසේක. යේසුස්
ක්‍රිස්තුස් විසින් මළවුන්ගෙන් නැගිටෙවු
ලාසරුස් එහි සිටියේය. [2]එබැවින් ඔවුහු
එතුමට එහි කෑමක් පිළියෙල කළෝය. මාතී
උපස්ථාන කළාය; එහෙත් ලාසරුස් එතුමා
සමග කෑමට හිඳගත් අයගෙන් එක්කෙනෙක්
විය. [3]එවිට මරියා ඉතා අනර්ඝ ජටාමාංස
තෙල් රාත්තලක් ගෙන එතුමගේ පාද
ආලේප කර, ඇගේ හිසකෙස්වලින් එතුමගේ
පාද පිසදැම්මාය. තෙල් සුවඳින් නිවස්
පිරුණේය. [4]එහෙත් ක්‍රිස්තුස්ගේ ගෝලයන්-
ගෙන් එක අයෙක්වූ එතුමව පාවාදෙන්නට
සිටිය යුදෙස් ඉස්කාරියොත් කථා කර: [5]මේ
තෙල් මසු තුන්සීයයකට විකුණා දිළිඳුන්ට
නුදුන්නේ මක්නිසාදැයි කීවේය. [6]ඔහු මෙය
කීවේ දිළිඳුන් සැලකූ නිසා නොව, ඔහු
සොරෙකු බැවිනුත්, මුදල් පසුම්බිය භාරව
එහි දැමූ දේ රැගෙන ගිය බැවිනුත්ය.
[7]එබැවින් යේසුස් කියනසේක්: මා තැන්පත්
කරන දවසට මේ තෙල් තබාගන්නට ඇයට
ඉඩ හරින්න. [8]මක්නිසාද දිළින්දෝ ඔබලා
සමග නිතරම සිටිති; නුමුත් මම ඔබලා
සමග නිතරම නොසිටිමියි කීසේක.

## සියලු ගෞරවයට යේසු වටින්නේය

යේසු ලාසරස්ව මරණින් නැගිට්ටෙව් පසු, එවකට සිටි යුදෙව් මන්ත්‍රණ සභාව තීරණය කළා එතුමව මරා දැමීමට. නමුත් යේසුගේ මිතුරන් එතුමට ප්‍රසංසාවෙන් යුතුව ප්‍රීතියෙන් ඉපිළී එතුමට ගෞරවයක් වශයෙන් විශේෂ රාත්‍රී භෝජනයක් පිළියෙළ කළා. ඇත්තෙන්ම මරියා දැන සිටියා යේසු කවුද කියා. ඇයගේ ආදරය යේසුට කොයි තරම්ද යත්, එදවස් අවුරුද්දක වැටුපක් පමණ වටිනා සුවඳ තෙලක් යේසුට පූජා කළේ, යේසුගේ වචන තේරුම් ගත් මරියා එතුමව තව සුළු දවසකින් මරණයට පත් කරන බව වටහාගෙන සිටි බැවිනි. - මතෙව් 26:2

“අපගේ දෙවියනී. ඔබ ප්‍රසංසාවත්, ගෞරවයත්, බලයත් ලබන්නට සුදුසු තැනැත්තෙකි. මක්නිසාද ඔබ සියලු දෙය මැවුසේක, ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුණේය. ඒවා මවන ලදී“ - එළිදරව් 4:11

දසදහස් වර දසදහසක සවර්ගීය දේවදූතයන් යේසු සමිඳුට ප්‍රසංසා කිරීමේදී, එතුමා විසින් ගළවාගත් සියලු ග්‍රෝතිකයන්ද, භාෂාවන්ද, සොනඟද, ජාතීන්ද, ඒ දේවදූතයන් සමඟ එකට එකතු වී ප්‍රසංසා කරන බව පෙරදැකීමකින් යොහන් අපට පෙන්නුම් කරයි. - එළිදරව් 5:9[අ], 11[අ]. "මරණ ලද බැටළුපැටවා, බලයත්, ධනයත්, ප්‍රඥාවත්, පරාක්‍රමයත්, ගෞරවයත්, තේජසත්, ප්‍රසංසාවත් ලබන්ට වටිනා තැන්තතෙකි." - එළිදරව් 5:12 අපගේ ප්‍රසංසාවත්, සියලු නමස්කාරයත් ලබන්ට යේසුස් සුදුසුය.

## අපට යේසුට දිය හැකි තෑගි

අපගේ කෘතඥ පුර්ව නමස්කාරය පෙන්වීම පිණිස අපට යේසුට දිය හැකි තෑගි මොනවද? "එබැවින් සොයුරාණෝ, ඔබලගේ ශරීරයන් ජීවමාන ශුද්ධ දෙවියන් විසින් පිළිගැනීමට හැකි යාගයක් කර ඔප්පු කරන ලෙසට, දේව දයාවන් නිසා ඔබලගෙන් ඉල්ලමි. එය ඔබලගේ ආත්මික සේවය වේ. මේ ලෝකයේ ආකාරයට ඔබලා සමාන නොවී, දෙවියන්ගේ කැමැත්ත, එනම් යහපත්, පිළිගත යුතු සම්පුර්ණ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර අය වෙන්න" - රෝම 12:1,2. නැතිවී යන තාවකාලික ලෝ දෙස සිත යොමු නොකර, යේසුට ප්‍රිය උපදවන ලෙස ජීවත්වීමට අපි අපේ ශරීර සමඟ එතුමට දෙමු. එතුමගේ නාමය, වචනය සහ ක්‍රියා ගැන සිතීමට හා මෙනෙහි කිරීමට අපි අපේ මනසද එතුමට දෙමු.

දෙවිඳුට සේවය කිරීම ඔබගේ කාලය, තලෙන්තු හා ජීවිතය නාස්ති කිරීමක් ලෙස සමහරෙක් අඳුනාදීමට පුළුවන. මරියා ඒ වටිනා සුවඳ තෙල යේසුගේ හිසේ ගැල්වීම නාස්තියක් ලෙස යුදෙස් අඳුනා දුන්නේ නැද්ද? නමුත් අද යුදෙස් කොහේද? "ධර්මිෂ්ඨයා සිහිකිරීම වාසනාවන්තය; එහෙත් දුෂ්ඨයන්ගේ නම් දිරා යයි" - හිතෝපදේශය 10:7. "ධර්මිෂ්ඨයා සදාකල්හිම සිහිකරනු ලබයි" - ගීතාවලිය 112:6[අ]

අපි ක්‍රිස්තියානි සොහොයුරන්ට ආදරය වෙමු නම්, එවිට අපි ඔවුන් තුළ ක්‍රිස්තුට ගෞරවය කරමු. ඔබ යේසුට සළකන විදියටම, ඔබගේ මාපියන්ට හෝ බිරිඳට හෝ සැමියාට හෝ දරුවන්ට හෝ ක්‍රිස්තියානින්ට සළකනවාද? අපි අපේ සතුරන්ට ආදරය දක්වමු නම්, එතැනදී ද අපි යේසුට ගෞරවය කරමු. ඒ ඇයිද යත්, එසේ කිරීමට යේසු අපෙන් ඇරයුම් කර තිබෙන නිසාය. - මතෙව් 5:44

යේසු අපට කොපමණ ආදරේද කියනවා නම්, අපව පාපයෙන් හා සාපයෙන් ගළවාගැනීමට එතුමගේම නිරමල ජීවිතය සිය කැමැත්තෙන්ම රුදුරු මරණයකින් අප වෙනුවෙන් පුජා කළා. ".....මිහිරි සුවඳක් පිණිස දෙවිඳුට පුජාවක්ද, යාගයක්ද, කර ...." එපීස 5:2 "එබැවින් දෙවිඳුගේ නාමයට ස්තුති කරන තොල්වල පලවන ප්‍රසංසාව නැමැති පුජාව එතුමා තුළ දෙවිඳුට නිතරම ඔප්පු කරමු" - හෙබ්‍රෙව් 13:15

# 19 යහපත් රජෙකුගේ කතාන්තරය



යොහන් 12:12-16

12පසුවදා මංගලාෳයට ඇවිත් සිටිය
අති මහත් සමූහයක් යේසුස් ක්‍රිස්තුස්
යෙරුසලමට එන බව අසා, 13තල් අතු රැ
ගෙන එතුමගේ පෙරමගට පිටත්ව ගොස්:
හෝසන්නා! සවාමින්ගේ නාමයෙන් එන
තැනැත්තා, එනම්, ඉශ්‍රායෙල්ගේ රජ
ආශිර්වාද ලද්දෙකැයි මොරගසා කීවෝය.
14සියොන් දියණියෙනි, භය නොවන්න.
බලන්න, 15ඔබේ රජ කොටළු පැටවෙකු
පිට නැගී එන්නේ යයි ලියා තිබෙන හැටියට
යේසුස් කොටළු තරයෙකු ලැබ එවු පිට
හිඳ ගත්සේක. 16එතුමගේ ගෝලයෝ ඒ
කාරණා පළමුවෙන් තේරුම් නොගත්තෝය.
නුමුත් යේසුස් මහිමයට පැමිණි කළ එතුමා
ගැන එසේ ලියා තිබුණු බවද, ඔවුන් එතුමට
එසේ කළ බවද, ඔවුහු සිහි කළෝය.

## උතුම් අභිමානවත් රජෙකු ලෙස යේසු නැවත එයි

අනාගතවක්තෘ සෙකරියා මෙසේ කීවා: "සියොන් දියණියෙනි, බෙහෙවින් ප්‍රීතිවෙන්න; යෙරුසලම් දියණියෙනි, කෑගසන්න. බලන්න, ඔබේ රජ ඔබ වෙත එන්නේය. එතුමා ධර්මිෂ්ඨය, ගැළවීම ඇත්තාය; එතුමා යටහත්ය, කොටළුවෙකු, එනම්, කොටළු දෙනෙකුගේ පැටියෙකුගේ පිට නැගී එන්නේය" - සෙකරියා 9:9. ඔව්, යේසු මිනිසෙකු ලෙසත්, ගැළවුම්කරුවෙකු ලෙසත්, දාසයෙකු ලෙසත්, අනාගතවක්තෘන් එතුමා ගැන අනාගතවාක්‍යයෙන් පැහැදිලි කර ඇත. එතුමගේ මරණය හා නැවත නැගිටීම ගැන පමණක් අනාගතවාක්‍යය 300 වඩා සම්පූර්ණ වී තියෙනවා. සහස්‍ර වසරක් ලෝ පාලනය සඳහා උතුම්, අභිමානවත් රජෙකු ලෙස යේසු නැවත ලෝ පැමිණෙන විට, ඊට වඩා තුන් ගුණයක් පමණ අනාගතවාක්‍යය සංඛ්‍යාවක් සම්පූර්ණ වෙනවා - එළිදරව් 20:4


"මක්නිසාද සවාමින් මහත් ශබ්දයක්ද, උත්තම දේවදූතයෙකුගේ හඬද, දෙවියන්ගේ හොරණෑ නාදයද ඇතිව සවර්ගයෙන් බසින්නේය. ක්‍රිස්තුස් තුළ මැරුණු අය පළමුව නැගිටිති. එවිටම ජීවිත්ව ඉතිරිව සිටින අපි, එකවිටම ඔවුන් සමඟ සවාමින් හමුවන පිණිස වළාකුළුවලින් අහසට ඇදගනු ලැබේ. මෙසේ නිතරම සවාමින් සමඟ අපි සිටිමුව" - තෙසලෝනික 4:16,17

"දෙවියන් නාඳුනන්ටත්, අපගේ සවාමින් වූ යේසුගේ සුභාරංචියට කීකරු නොවන්නන්ටත් දඬුවම් දීම පිණිස සවාමිවූ යේසු පරාක්‍රමයේ දූතයන් සමග ඇවිලෙන ගින්නකින් යුතුව සවර්ගයෙන් එළිදරව් වේ" - 2 තෙසලෝනික 1:6,7

## එතුමගේ නැවත ඊමට ඔබ සූදානම්ද?

අපේ ප්‍රේමණීය දෙවියන් කිසිදාක එතුමා අපට දී ඇති පොරොන්දු බිඳ නොහෙලයි. එතුමගේ නැවත ඊම පමා වී තියෙන්නේ, තව තවත් සෙනඟ ගැළවෙන පිණිසය. ".....සියල්ලන් ගැළවෙනවාට මිස කිසිවෙක් විනාශ වෙනවට එතුමා කැමති නැත" -2 ප්‍රේතැස් 3:9. නමුත් එතුමා අද වුනත් ඊමට බැරි නැත. එපමණටම එතුමගේ ඊම ඉතාමත් ආසන්නය! ශුද්ධ ජීවිතයක් ගත කරමින්, අන් අයවද යේසු වෙත ගෙන එමින්, යේසුගේ නැවත ඊමට ඔබ සූදානම්ව සිටිනවද? "එහෙත් සොරෙකු මෙන් සවාමින්ගේ දවස් පැමිණෙයි. එදින, අහස මහත් ශබ්දයකින් පහව යයි; මුල ද්‍රව්‍යයන් අධික රස්මියකින් දිය වී යයි, පොළොවද, එහි ඇති නිර්මාණයන්ද දැවී යයි. මේ සියල්ල මෙසේ දිය වී යෑමට තිබෙන බැවින්....... ශුද්ධ හැසිරීමෙහිත්, භක්තිවන්තකමෙහිත් කොයි ආකාරවල අයව සිටින්ට ඕනෑද" - 2 පේත්‍රුස් 3:10,11

# 20 තිරුඟු බීජයේ කතාන්දරය



**යොහන් 12:24-26**

**[24]සැබවක්, සැබවක් ඔබලට කියම් - ගෝධුම බීජය පොළොවෙහි වැටී මැරුනේ නැත්නම් තනිව තිබෙයි; නුමුත් මැරුනොත් බොහෝ එල දෙයි. [25]තමාගේ ජීවිතයට ප්‍රිය වන්නාට ඒක නැති වන්නේය; මේ ලෝකයෙහි තමාගේජීවිතයට වෛර කරන්නා සදාකාල ජීවනයට එය ආරක්‍ෂා කරගන්නේය. [26]යමෙක් මට සේවය කරයි නම් ඔහු මා අනුව ඒවා; මම යම් තැනක සිටිම්ද එතැන මගේ සේවකයාද සිටී.**

## මරණයේ ඇති වටිනාකම

මරණය පැමිණෙන්නේ නැවත නැගිටීමට ප්‍රථමය. යේසුස් ක්‍රිස්තුස් තුළ එය සැබැවක් වූ ලෙසම, අප තුළද එය සැබැවක් වේ. යේසුස් ක්‍රිස්තුස් උදෙසා මමත්වයෙන් තොර පරාර්ථකාමීව ජීවත්වීම කුමක්ද කියා අපෝස්තුලු පාවුල් මෙසේ අපට කියයි: "එසේ වී මුත්, මට ලාභව තිබුණ යම් යම් දෙය ක්‍රිස්තුස් නිසා අලාභ යයි සිතීමට පැමිණියෙමි.... එතුමා

හා එතුමගේ නැවත නැගිටීමේ බලයත් ... දන්නා පිණිසය" - පිලිප්පි 3:7-11

විටින් විට යේසුට කීකරු වන විට, ආත්මාර්ථකාමී ආසාවන් මැරී යා යුතුයි. ඒ ඇයිද යත් යේසුගේ බලය අප තුළ ක්‍රියා කරන්නේ, මමත්වය මරුණු පසුය. අපගේ මමත්වය යේසු හා කුරුසිපත් කළ යුතුයි. අප කීකරුව ඉදිරියට යන විට, ඇදැහිල්ල තුල අප අලුත් මැවිල්ලක් වෙයි. "මම ක්‍රිස්තුස් සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි; එසේ වී නමුත් ජීවත්වෙමි; නමුත් මා නොව ක්‍රිස්තුස් මා තුළ ජීවත්ව සිටියි. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ආදරය කළ, මා උදෙසා තමන්ම පවා දුන් දෙවිඳුගේ පුතුනුවන් කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි" - ගලාති 2:20 "මක්නිසාද ඔබලා මාංසික ලෙස ජීවත්වේ නම් මැරෙන්ට ඕනෑය. නමුත් ආත්මයෙන් ශරීරයේ ක්‍රියා නසනවා නම් ජීවත් වන්නේය" - රෝම 8:13. ඔබ සිය ජීවිතයෙන් මොනවා පහ කර දැමිය යුතුද යත් දැනගැනීමට නම් දෙවිඳුගේ ශුද්ධාත්ම මගපෙන්වීමට ඉඩ අරින්න. සමහර විට යම් නරක පුරුද්දක් හෝ වැරදි ගතිපැවතුමක් වීමට බැරි නැත. මෙසේ ශුද්ධාත්මයාණන්ට කීකරුව දිවිගෙවන විට, නව ජීවනයකට දේව බලය ඔබ ගෙන යන බවත්, ඔබගේ ජීවිතයේ ජය ලැබීම පිණිස අලුත් පුරුදුවලට හා ගතිපැවතුම්වලටත්, ජීවිතය සඵලවීමටත්, දේව බලය ඔබව ගෙන යන බව අත්දකියි.

# 21 නිදසුන් හා පනත් මගින් යේසු උගන්වයි



**යොහන් 13:3-17; 34,35**

**[3]එතුමා පියාණන් විසින් තමන්ගේ අත්වලට සියල්ල දී තිබෙන බවද, තමන් දෙවියන් වෙතින් ආ බවද, තමන් දෙවියන් ළගට යන බවද දැන, [4]රාත්‍රි කෑමෙන් නැගිට, උඩ ඇඳුම ගලවා තබා, රෙදිකඩක් රැගෙන ඉගටියෙහි බැඳගත්සේක. [5]ඉන්පසු එතුමා භාජනයකට වතුර වත්කර ගෝලයන්ගේ පාද සෝදන්ටත් තමන් ඉගටියේ බැඳගත් රෙදිකඩින් පිස දමන්ටත් පටන්ගත්සේක. [6]එතුමා සීමොන් පේත්‍රැස් ළගට ආසේක. ඔහු: සවාමිනී, ඔබ මාගේ පාද සෝදන්නේදැයි කීවේය. [7]එතුමා උත්තර දෙමින්: මම කුමක් කරම්දැයි දැන් ඔබ දන්නේ නැත; නුමුත් පසුව ඔබට තේරෙනවා ඇතැයි ඔහුට කීසේක. [8]ඔබට කිසිකලෙක මාගේ පාද සෝදන්ට නොදෙමියි පේත්‍රැස් එතුමට කීවේය. එතුමා උත්තර**

**දෙමින්: මම ඔබ නොසේදුවොත් මා හා සමග පංගුකාරකමක් ඔබට නැතැයි ඔහුට කීසේක. [9]සීමොන් පේත්‍රුස්: සවාමිනී මාගේ පාද පමණක් නොව අත්ද, හිසද (සේදුව මැනවයි) එතුමට කීවේය. [10]යේසුස්: නැවාවු තැනැත්තා මුළුමනින්ම පවිත්‍ර බැවින් ඔහුට ඕනා කරන්නේ පාද සේදීම පමණක්ය. ඔබලා පවිත්‍රය, නුමුත් සියල්ලෝම නොවේ යයි ඔහුට කීසේක. [11]ඔබලා සියල්ලෝම පවිත්‍ර නැතැයි කීවේ එතුමා තමන් පවාදෙන්නා දැනගෙන සිටි හෙයිනි. [12]මෙසේ එතුමා පාද සෝදා තමන් ඇඳුම් ඇඳ නැවත හිඳ ගත කල ඔවුන්ට කියනසේක්: මා ඔබලට කලදේ කිමෙක්දැයි නුඹලා දන්නවද? [13]ආචාරිනී, සවාමිනී කියා ඔබලා මට කියති. ඔබලා කියනවා හරිය; මක්නිසාද මම එසේ වෙමි. [14]ඉතින් ස්වාමින්ද, ආචාරීන්ද වු මම ඔබලගේ පාද සේදුවා නම් ඔබලා විසිනුත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. [15]මක්නිසාද මා ඔබලට කළ ලෙස ඔබලත් කරන පිණිස ඔබලට ආදර්ශයක් දුනිමි. [16]සැබවක් සැබවක් නුඹලාට කියමි - දාසයෙක් තමාගේ සවාමියාට වඩා උතුම් නැත; පණිවුඩකාරයෙක්ද තමා යැවූ තැනැත්තාට වඩා උතුම් නැත. [17]ඉතින් මේ දේවල් දන්නා ඔබලා ඒවා කරනවා නම් ඔබලා ආශිර්වාද ලද්දෝය.**

**[34]මා ඔබලට ප්‍රේම කළ සේම ඔබලත් එකිනෙකාට ප්‍රේම කරන ලෙස, එකිනෙකාට ප්‍රේම කරන්න කියා අලුත් ආඥාවක් මම ඔබලට දෙමි. [35]ඔබලා එකිනෙකාට ප්‍රේම කරනවා නම්, ඔබලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැනගන්නවා ඇතැයි කීසේක.**

## ඔබ කළ යුතු දෙය

එතුමගේම නිදසුනින් ඉගැන්වු කරුණු දෙක මොනවාද?

01. ඉතින් සවාමින්ද, ආචාරීන්ද වු මම ඔබලගේ.................. ..........................නම් ඔබලා විසිනුත් එකිනෙකාගේ ......................... ........................... යුතුය. (14 පදය)

02. මා ඔබලාට.............................කලසේම ඔබලාත් එකිනෙකාට.......................කරන්න. (34 පදය)

## සතුටෙහි රහස

අප එතුමගේ ආදර්ශය අනුගමනය කරමින් අන් අයට උදව් කරනවනම්, අපට සතුටුවීමට හැකි බව යේසු පවසයි. දාසයෙකු සේ යටහත්ව මැවුම්කරු විසින්ම සිය ගෝළයන්ගේ පාද සේදීම, මොන පුදුමයක්ද? මොන ආදර්ශයක්ද? "යේසුස් ක්‍රිස්තුස් තුළ තිබු සිතම ඔබලටත් තිබේවා. එතුමා දෙවිඳුගේ රූපය දැරුවත්, දෙවිඳුට සමානව සිටීම

තමන් විසින්ම දැරිය වස්තුවක් යයි නොසිතා, එය ඉවත් කර, දාසයෙකුගේ ස්වරූපය ගෙන මිනිසාගේ සමානත්වයට පැමිණිසේක. මිනිසෙකු මෙන් සිටිය කලද, මරණය එසේය. කුරුසියේ මරණය දක්වා කීකරු වුසේක. එබැවින් දෙවිඳු එතුමව ඉතා උසස් කර සියලු නාමවලට වඩා උසස් නාමය එතුමට දුන්සේක." - පිලිප්පි 2:5-9

අපි කෙසේ අන් අයට සේවය කළ යුතුද යත් සැබැවින්ම සොයා බලා, ඔවුන්ගේ වුවමනාවන්ට අතහිත දීම දේව කැමැත්ත වේ. එය අපේ පිවිතුරු සතුටට බෙහෙවින් ඉවහල් වන දෙයකි. අපි යේසු සමිඳුගේ තිර පිවිතුරු අනුගාමිකයන් වෙන්නේ අන් අයට ආදරයෙන් උදව් උපකාර කරමින්ය. ඒ ඇයිද යත්, යේසුද එසේම කළ නිසාය.

# 22 පුදුමාකාර පොරොන්දු පහක්

### 1. යොහන් 14:1-3,6

1ඔබලාගේ සිත් නොකැළඹේවා. දෙවියන් කෙරේ විශ්වාස කරන්න. 2මාගේ පියාණන්ගේ ගෘහයෙහි බොහෝ වාසස්ථාන ඇත්තේය. එසේ නොවේ නම් මා ඔබලට කියනවා ඇත; මක්නිසාද ඔබලට ස්ථානයක් පිළියෙළ කරන පිණිස යමි. 3මම ගොස් ඔබලට ස්ථානයක් පිළියෙල කරමි නම්, මා සිටින තැන ඔබලත් සිටින පිණිස මම නැවත ඇවිත් ඔබලා මා ළඟට ගන්නෙමි. 6යේසුස් ක්‍රිස්තුස් ඔහුට කියනසේක්: මාර්ගයද සැබෑවද, ජීවනයද, මමය. මා කරණකොට ගෙන මිස කිසිවෙක් පියාණන් වෙතට පැමිණෙණෝන්නේ නැත.

### 2. යොහන් 14:12

12සැබෑවක්, සැබෑවක්, ඔබලට කියමි- මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාත් කරන්නේය; මා පියාණන් ළඟට යන නිසා මීට වඩා මහත් ක්‍රියා ඔහු කරන්නේය.

### 3. යොහන් 14:13,14

13ඔබලා මාගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත්, පුත්‍රයා තුළ පියාණන් මහිමය ලබන පිණිස මම එය ඉටු කරමි. 14ඔබලා මාගේ නාමයෙන් ඉල්ලන සැම දෙයම ඉටු කරමි.

### 4. යොහන් 14:15 -17

15ඔබලා මට ප්‍රේම කරත් නම් මාගේ පනත් රකින්නාහුය. 16මම පියාණන්ගෙන් ඉල්ලන්නෙමි, එවිට එතුමා ඔබලා සමඟ සදාකල්ම සිටින්නට වෙන සැනසිලිකාරයෙකු ඔබලට දෙනසේක. 17ඒ සැනසිලිකාරයාණෝ



**සැබෑවේ ආත්මයාණෝය. එතුමව පිළිගන්ට ලෝකයාට නුපුළුවන; මක්නිසාද ලෝකයා එතුමව දකින්නේවත් අඳුනන්නේවත් නැත. ඔබලා එතුමව අඳුනති; මක්නිසාද යේසුස් ඔබලා සමග නැවතී සිටිනසේක, ඔබලා තුළෙහි සිටිනසේක.**

**5. යොහන් 14:27**

**[27]ඔබලා වෙත සමාදානය තබා යමි; මාගේ සමාදානය ඔබලට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. ඔබලගේ සිත් කැළඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙන්න.**

01. එතුමගේ අනුගාමිකයන්ට **ස්ථානයක් පිළියෙල කිරීමට** යේසු පොරොන්දු වුනා - යොහන් 14:1-3,6

02. එතුමා පියාණන් වෙත යන නිසා **වඩා මහත් බලයක්** දෙන බවට යේසු පොරොන්දු වුනා. එතුමාගේ ආත්මය ඇදැහිලිවතුන් තුළ විසීමෙන්, එතුමා ලෝ සිටින විට කළ දෙයට වඩා මහත් දෙය කිරීමට ඔවුන්ට හැකිවනු ඇති කියා යේසු කීවා. - යොහන් 14:12

03. එතුමට අයිති සියල්ලන්ට **විශේෂ යාඥා අයිතිවාසිකමක්** දෙන බවට යේසු පොරොන්දු වුනා. - යොහන් 14:13,14

04. එතුමගේ ගෝළයන්ට එතුමගෙ **මහත් අභිමුඛය** දීමට යේසු පොරොන්දු වුනා. ශුද්ධාත්මයාණන් නිසා, ඔවුන් සමග පමණක් නොව, ඔවුන් තුළද ජීවත් වීමට යේසුට පුළුවන. - යොහන් 14:15,17

05. ලොවට දීමට නොහැකි **මහත් සාමයක්** දීමට යේසු පොරොන්දු වුනා. - යොහන් 14:27 කිසිවිට අප කිසිම දෙයකට බය විය නොයුතුයි. ඒ මන්ද යත්: "ලෝ තුළ සිටින තැනැත්තාට වඩා ඔබලා තුළ සිටින තැනැත්තා බලවත්" නිසා - 1 යොහන් 4:4

## ඔබ කළ යුතු දෙය

අ. යේසු හෝ ශුද්ධාත්මයාණන් ඔබට කුමක් කරත්ද කියා යේසු කී ලෙස ලියන්න.

ආ. විශේෂ යයි හැඟෙන පද තුනක් යොහන් 14 තෝරාගන්න, කට පාඩම් කරගන්න, එම සඳහන් කිරීම් මෙහි ලියන්න.

........................................................................................................................................

# 23 මිදි වැලේ කතාන්තරය



### යොහන් 15:1-11

[1]මම සැබෑවු මිදිවැලය, මාගේ
පියාණන් ගොවියාය. [2]මා තුළ ඇති ඵල
නොදරන සියලු අතු එතුමා පහ කරනසේක.
ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස
එතුමා පවිත්‍ර කරනසේක. [3]මා විසින් ඔබලට
කී වචනය කරණකොටගෙන ඔබලා දැන්
පවිත්‍රය. [4]මා තුළ පවතින්න, මමද ඔබලා
තුළ පවතින්නෙමි. අත්ත මිදිවැලෙහි
නොපවතී නම් තනියම ඵල දරන්ට
නුපුළුවන් සේ ඔබලා මා තුළ නොපවතී
නම් ඵල දරන්ට ඔබලට නුපුළුවන. මිදිවැල
මමය, ඔබලා අතුය. [5]යමෙක් මා තුළ
පවතින්නේද, මම ඔහු තුළ පවතිම්ද, ඒ
තැනැත්තා බොහෝ ඵල දරයි. මක්නිසාද
මගෙන් වෙන්ව කිසිවක් කරන්ට ඔබලට
නුපුළුවන. [6]යමෙක් මා තුළ නොපවතී නම්,
ඔහු අත්තක් මෙන් පිටත දමනු ලැබ වියළී
යයි; ඒවා එක්කොට ගින්නට දමනු ලැබේ,
ඒවා දැවී යන්නේය. [7]ඔබලා මා තුළ පවතී
නම්, මගේ වචනය ඔබලා තුළ පවතී නම්,
ඔබලා කැමති දෙයක් ඉල්ලන්න, එවිට
ඔබලට ලැබේ. [8]මාගේ පියාණන්ට ගෞරව
ලැබෙන්නේ ඔබලා බොහෝ ඵල දැරීමෙන්ය;
මෙසේ ඔබලා මාගේ ගෝලයෝ වන්නෝය.
[9]පියාණන් මට ප්‍රේම කළ සේම මමද
ඔබලට ප්‍රේම කෙළෙමි. මගේ ප්‍රේමයේ
පවතින්න. [10]මම මාගේ පියාණන්ගේ පනත්
රැක එතුමගේ ප්‍රේමයේ යම් සේ පවතිම්ද,
එසේම ඔබලත් මගේ පනත් රකින්නේ නම්
මගේ ප්‍රේමයේ පවතින්නහුය. [11]මගේ ප්‍රීතිය
ඔබලා තුළ පවතින පිණිසද, ඔබලා
ඔබලගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිසද,
මේ දේවල් ඔබලට කියම්.

## ක්‍රිස්තුස් තුළ සිටීම

පටන්ගැන්මේ සිටම එතුමාව විශ්වාසකර, එතුමගේ සමාව හා පිරිසිදුකම සමග නව ජීවනය ලැබ ඇත්නම්, අපේ ක්‍රිස්තියානි ජීවිතය පුරාම යේසුගේ ආත්මයෙන් පූර්ණව අප ජීවත් විය යුතුයි. අපේම ශක්තියෙන් හා හැකියාවෙන් අපට ජීවත් විය හැකිය කියා කිසිදාක අප සිතිය නොයුතුයි. "ආත්මයාණන් තුළ පටන්ගත් ඔබලා, දැන් මාංසයෙන් සම්පූර්ණව සිටිහුද?" - ගලාති 3:3

අපව හරි ලෙස හැඩගැස්සීමට හා අපෙන් නොවුවමනා දෙය ඉවත් කිරීමට සමහරවිට යේසුට සිදුවෙයි. එනම්, පරීක්ෂණ හා දුක් විඳීමේ කාලයක් මැදින් අපට යෑමට සිදුවීමයි. එසේ එතුමා කරන්නේ, අපව තව තවත් ඵලදායි කිරීම පිණිසයි. "කිසි දඬුවමක් ලබන කළ එය දුකට මිස, ප්‍රීතියට කරුණක් ලෙස පෙනෙන්නේ නැත. නමුත් එයින් පෙළුනු තැනැත්තන්ට ධර්මිෂ්ඨකමේ සාමයේ ඵල හටගනියි" - හෙබ්‍රෙව් 12:11

## ආත්මික පල නම් මොනවාද?

පාවුල් අපට මෙසේ කියයි: "නමුත් ආත්මයාණන්ගේ පල නම්, ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත, විශ්වාසය, මෘදුකම, ආත්මදමනය" - ගලාති 5:22,23. සැමදින ඔබව පිරිසිදු කිරීමට, එනම් ශුද්ධාත්මයෙන් ඔබව පූර්ණ කිරීමටත් යේසුගෙන් ඉල්ලන විට, එම සාමලත් ලස්සන රන්වන් පල ඔබ ජීවිතයේ තව තවත් ලියලන්නට පටන් ගනී. ධර්මිෂ්ඨකමේ පල නම්, සාමයෙන් හා ප්‍රීතියෙන් පිරුණු ආලෝකමත්, ස්තුතිවන්ත හදක් ඇතිව සිටීම, යටහත් ආත්මයකින් පූර්ණවීම, අන් අයව යේසු වෙත ගෙන ඒම, දේව සේවයට උපකාර කිරීම, වේලාව අපතේ නොහැරීම, බුද්ධිමත්ව හා නිබයව දේව වචනය කියා දීම හා යාඥාවට පිළිතුරු ලබාගැනීම වේ.

## තදබල අනතුරු ඇඟවීමක්

අප යේසු තුළ නොපවතීනම්, යේසු අපට මෙසේ අනතුරු අඟවයි: අත්තක් මෙන් ඉවත දමනු ලැබ වියළී යයි. ඒවා එකතුකර ගින්නට දමනු ලැබ පිළිස්සී යයි. නමුත් එතුමගේ ගෝලයෝ නම්, එතුමා තුළ පවතිමින් පල දරන අය වෙති. පද 6-8. "ස්වාමීන් මිසර දේශයෙන් සෙනග ගළවා, ඉන්පසු විශ්වාස නොකළ අයව විනාශ කළසේක" කියා අපෝස්තුළු යුද් අපට මතක් කර දෙයි. - යුද් 5

මෙම පල සව උත්සහයෙන් හෝ ශක්තියෙන් දැරීමට බැරි නිසා, කැඩපතකින් බලනා සේ, දිනපතා අප දේව වචනය (බයිබලය) බැලිය යුතුයි. "ඔබලා ඇදැහිල්ලේ සිටිනවද කියා ඔබලම පරීක්ෂාකර බලන්න; ඔබලවම සෝදිසිකර බලන්න............ යේසුස් ක්‍රිස්තුස් ඔබලා තුළ වෙසෙන බව.........." 2 කොරින්ති 13:5. යේසු සමිඳුගේ වචන අප තුළ නම්, ඒවට අප කීකරු නම්, එහෙනම් අපි එතුමගේ ආදරය තුළ වෙසෙමු - යොහන් 15:10. අපට විශ්වාස නම් යේසුස් ක්‍රිස්තුගේ ආත්මය අප තුළ කියා, එහෙනම් අප බිය විය යුතු නැහැ. එමන්ද අප යේසු සතු බවට අප **වගකීම හා සහතිකය** ශුද්ධාත්මයාණන් වන නිසාය. ඉතාමත් වැදගත් උසස් පරීක්ෂණය ආදරය බව අමතක කරන්න එපා. "දෙවියන් ආදරයයි, ආදරයේ පවතින්නා, දෙවියන් තුළ සිටි, දෙවියන්ද ඔහු තුළ සිටියි" - 1 යොහන් 4:16[අ] දෙවිඳු ඔබට කොපමණ ආදරේද ! ඒ ආදරයේම ජීවත්වෙන්න.

# 24 මිතුරන් වීමට තෝරාගෙන ඇත

යොහන් 15:12-17

[12]මගේ ආඥාව නම් මා ඔබලට ප්‍රේම කළ සේ ඔබලත් එකිනෙකාට ප්‍රේම කරන්න යනුය. [13]යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතය දීමට වඩා මහත් ප්‍රේමයක් කිසිවෙකුට නැත. [14]මා ඔබලට ආඥා කරන දේ ඔබලා කරත් නම්, ඔබලා මගේ මිත්‍රයෝය. [15]දාසයා තමාගේ සවාමියා කරන්නේ කුමක්දැයි නොදන්නා බැවින් තවත් ඔබලට දාසයෝ යයි නොකියමි; මක්නිසාද මාගේ පියාණන්ගෙන් මා ඇසූ සියල්ල ඔබලට දැන්වූ බැවින් ඔබලා මිත්‍රයෝ යයි කියමි. [16]ඔබලා මා තෝරා ගත්තා නොව මම ඔබලා තෝරාගෙන පත් කෙළෙමි. එසේ කළේ ඔබලා ගොස් ඵල දරන පිණිසත් ඒවා පවතින පිණිසත්ය: මගේ නාමයෙන් පියාණන්ගෙන් ඔබලා ඉල්ලන කොයි දෙයක් නුමුත් එතුමා ඔබලට දෙන පිණිසත්ය. [17]මේ දේවල් මා ඔබලට අණ කරන්නේ ඔබලා එකිනෙකාට ප්‍රේම කරන පිණිසය.

# 25 වධහිංසා බලාපොරොත්තුවෙන්න කියා යේසු අපට උගන්වයි

යොහාන් 15:18-25

[18]ලෝකයා ඔබලට වෛර වෙනවා නම්, ඔබලට පළමුවෙන් මට වෛර වූ බව ඔබලා දනිති. [19]ඔබලා ලෝකයට අයිති නම්, ලෝකය තමුන්ගේම අයට ආදරේ වෙති. නුමුත් ඔබලා ලෝකයාගෙන් නොවන නිසාත් මා විසින් ලෝකයෙන් ඔබලා තොරාගත් නිසාත් ලෝකයා ඔබලට වෛර වෙති. [20]දාසයෙක් තමාගේ සවාමියාට වඩා උතුම් නොවේ යයි ඔබලට මා කී වචනය සිහි කරන්න. ඔවුහු මට ප්‍රීඩා කළෝ නම් ඔබලටත් ප්‍රීඩා කරති; මගේ වචනය රකිත් නම් ඔබලගේ වචනයත් රකිති. [21]නුමුත් ඔවුන් මා එවූ තැනැත්තව නාඳුනන බැවින් මගේ නාමය නිසා මේ සියල්ල ඔබලට කරනවා ඇත. [22]මම ඇවිත් ඔවුන්ට කථා නොකෙළෙම් නම්, ඔවුන්ට පාපයක් නැත. නුමුත් දැන් ඔවුන්ගේ පාපය ගැන ඔවුහු නිරුත්තරව සිටිති. [23]මට වෛර කරන්නා මගේ පියාණන්ටත් වෛර කරයි. [24]වෙන කිසිවෙකු විසින් නොකළ ක්‍රියා මම ඔවුන් අතරෙහි නොකෙළෙම් නම්, ඔවුන්ට පාපයක් නැත. නුමුත් දැන් ඔවුහු මාද, මගේ පියාණන්වද දැක වෛර වූහ. (මෙසේ වුණෝ) [25]ඔවුහු නිස්කාරණයේ මට වෛර වුණෝ යයි ඔවුන්ගේ ව්‍යවස්ථාවෙහි ලියා තිබෙන වචනය සම්පූර්ණ වන පිණිසය.

**යොහන් 16:1-3, 33**

[1]ඔබලා බාධා නොවන පිණිස මේ
දේවල් මම ඔබලට කීවෙමි. [2]ඔබලව
සිනගෝගවලින් පිටත දමන්නහුය. එසේය,
ඔබලා මරන්නා වු කවරෙක් නුමුත් එය
තමුන් විසින් දෙවියන්ට කරන මෙහෙයක්
යයි සිතන කාලය පැමිණෝන්නේය.
[3]ඔවුන් පියාණන්වද මවද, නාඳුනන බැවින්
මේ දේවල් කරනවා ඇත. [33]මා තුළ
ඔබලට සමාදානය තිබෙන පිණිස මේ
දේවල් ඔබලට කීවෙමි. ලෝකයෙහි
ඔබලට පීඩා තිබේ. නුමුත් ධෛයඹවත්
වෙන්න; මම ලෝකයෙන් ජය ගතිමියි
කීසේක.

## ඔබ කළ යුතු දෙය

01. ඔවුන්.................................නොවන නිසා ලෝකයා ක්‍රිස්තියානින්ට වෛර කරයි. (15:19)

02. යේසුː මට වෛරකරන්නා මගේ.............................වෛර කරති. (15:23)

03. එතුමා ලෝ සිටින විට බොහෝ පුදුම දෙය කළත් අවිශ්වාස සිත් ඇති අය යේසුවද, පියාණන්වද........................................ ...............................වුහ. (15:24)

04. ඇත්තෙනම් ලෝකයා......................................යේසුට වෛර කරති. (15:25)

05. ඔවුන් ක්‍රිස්තියානින්ව.......................... .................................කරන සේවයක් බවට විශ්වාස කරන කාලයක්ද පැමිණේ. (16:2)

06. ඔවුන් පියාණන්වද, මාවද...........................බැවින් මෙම කුරිරු දේවල් කරනවා ඇත. (16:3)

07. මෙම වධහිංසා ලෝකයේ අපට තියෙන නමුත් යේසු ලෝකයෙන් ...................... නිසා අපට ධෛර්යවත් වීමට පුළුවන. (16:33)

# 26 යේසු ඔබ උදෙසා යාඥා කරයි

**යොහන් 17:1-8, 15 -26**

[1]යේසුස් මේ දේවල් කියා, සවර්ගීය
දෙසට ඇස් ඔසවා කියනසේක්:
පියාණෙනි, පැය පැමිණ තිබේ; [2]ඔබගේ
පුත්‍රයාට ඔබ දුන් සියල්ලන්ට
ඔහු විසින් සදාකාල ජීවනය දෙන පිණිස
ඔබ සියලු මිනිසුන් කෙරෙහි ඔහුට බලය
දුන් ලෙස, පුත්‍රයා ඔබ ගෞරවයට
පමුණුවන පිණිස ඔබ පුත්‍රයා ගෞරවයට

පැමිණෙවුව මැනව. 3සදාකාල ජීවනය නම්
මෙය එකම සැබෑවූ දෙවියන් වන ඔබ
සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන
යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳිනගැනීමය.
4ඔබ මට කරන්ට දුන් වැඩ මම තීන්දුකර
පොළොවේ දී ඔබ ගෞරවයට පත් කළෙමි.
5දැන් පියාණෙනි, ලෝකය තිබෙන්ට
පළමුවෙන් ඔබ වෙත මට තිබුණු
මහිමයෙන් ඔබ වෙත මා ගෞරවයට
පැමිණෙවුව මැනව. 6ඔබ ලෝකයෙන් මට
දුන් මිනිසුන්ට ඔබගේ නාමය ප්‍රකාශ
කළෙමි. ඔවුහු ඔබ සන්තක වූවෝය, ඔබ
ඔවුන් මට දුන්සේක; ඔවුහු ඔබගේ වචනය
රැක ගත්තෝය. 7ඔබ මට දුන් සියල්ලම
ඔබගෙන් පැමිණුණ බව ඔවුහු දැන් දනිති.
8මක්නිසාද ඔබ මට දුන් වචනය මම
ඔවුන්ට දුනිමි; ඔවුහු ඒවා පිළිගෙන, ඔබ
මා එවූ බව විශ්වාස කළෝය.

15ඔබ ලෝකයෙන් ඔවුන් අහක්කරන
පිණිස නොව, නපුරාගෙන් (සාතන්ගෙන්)
ඔවුන් රැකගන්නා පිණිස යාඥා කරමි. 16මා
ලෝකයෙන් නොවන්නාක් මෙන් ඔවුහුද
ලෝකයෙන් නොවෙති. 17ඔබගේ සැබෑව
තුළින් ඔහුන්ව පවිත්‍ර කළ මැනව. 18ඔබගේ
වචනය සැබෑවය. ඔබ මා ලෝකයට එවූසේ
මමද ඔවුන්ව ලෝකයට යැවීමි. 19සැබෑවෙන්
ඔවුන් ද පවිත්‍ර වන පිණිස ඔවුන් උදෙසා
මා පවිත්‍ර වුයෙමි. 20මොවුහුන් ගැන පමණක්
නොව, මොවුහුන්ගේ වචනය තුළින් මා
කෙරෙහි විශ්වාස කරන්නවුන් ගැනත්,
21ඔවුන් සියල්ලන් ඒකත්වයක් වන පිණිස,
පියවූ ඔබ මා තුළෙහිද මා ඔබ තුළෙහිද



සිටින්නාක් මෙන්ම ඔබ මා එවූ බව
ලෝකයා විශ්වාස කරන පිණිසත්, අප තුළ
ඔවුන් ඒකත්වයක් වන පිණිසත් යාඥා
කරමි. 22අප ඒකත්වයක්ව සිටිනා සේම
ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට
දුන් මහිමය ඔවුන්ට දුනිමි. 23මෙසේ කෙළේ
මා ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද සිටිමින්
ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස
පැමිණෙන පිණිසත්, ඔබ මා එවූ බවද
මට ප්‍රේම කළ සේම ඔවුන්ටත් ප්‍රේම කළ
බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය.
24පියාණෙනි, ඔබ මට දුන් මහිමය
ඔබ මට දුන්නාවුන් විසිනුත් දක්නා පිණිස,
මා සිටින තැන ඔවුනුත් මා සමග සිටිනවට
කැමැත්තෙමි. මක්නිසාද ලෝකය මැවීමට
පළමුවෙන් ඔබ මට ප්‍රේම කළසේක.
25ධර්මිෂ්ඨ පියාණෙනි, ලෝකයා ඔබ

**හැඳින්නේ නැත, නුමුත් මම ඔබ හැඳිනෙමි;**
**මොවුහුද ඔබ විසින් මා එවූ බව දැන**
**ගත්තෝය. 26ඔබ මා කෙරෙහි ඇතුව සිටි**
**ප්‍රේමය ඔවුන් තුළද, මා ඔවුන් තුළද වන**
**පිණිස ඔබගේ නාමය ඔවුන්ට දැන්වීමි,**
**තවත් දන්වන්නෙමියි කීසේක.**

# යේසු ඔබ උදෙසා යාඥා කරයි

"වැරදිකාරයන් උදෙසාද එතුමා මැදහත්කම් කරයි" කියා අනාගතවක්තෘ යෙසායා අනාවැකි කීවා - යෙසායා 53:12. එතුමා පිළිගන්නා සියල්ලන්ටම සදාකාල ජීවනය දීම යේසුගේ කැමත්තය - යොහන් 17:2

එතුමගේ ගෝලයෝ උදෙසා යේසු යාඥා කළා. එක්වතාවක දී එතුමා පේත්‍රුස්ට : "සීමොන් සීමොන් බලන්න, ගෝධුම (තිරිඟු) මෙන් ඔබව හලන්ට සාතන් ඉල්ලුවා. නමුත් ඔබේ ඇදහිල්ල නැති නොවන පිණිස ඔබ උදෙසා මම යාඥා කළා" - ලූක් 22:31,32. මැරෙන්ට ප්‍රථමද නපුරා වන සාතන්ගෙන් ආරක්‍ෂා වීම පිණිස සිය ගෝලයන් උදෙසා යේසු යාඥා කළා. තවද, මෙම යටහත්, ලැදි ගෝලයන්ගේ සාක්‍ෂිය අසා, අනාගතයේ දී එතුමා ගැන විශ්වාස කරන සියල්ලන් උදෙසාද යේසු යාඥා කළා. ඒ ඔබ හා මා ගැනයි!

එතුමා ඔබ ගැන නිරතුරුවම යාඥා කරන බව බයිබලය අපට පෙන්වා දෙයි. එතුමා අපට කොපමණ ආදරේද යත් එයින් අපට පැහැදිලි වෙනවා. "එබැවින් එතුමා කරණකොට ගෙන දෙවියන් වෙත ළඟා වෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස එතුමා නිරතුරුවම ජීවත් වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට එතුමට පුළුවන" - හෙබ්‍රෙව් 7:25. අප ගැළවුම්කරු යේසු කොපමණ යහපත්ද! අප එතුමා සමඟද, එකිනෙකා සමඟද, ආදරය තුළ පූර්ණව, එක්සිත්ව එක්සත්ව, එකමුතුව, සියල්ල සාමයෙන් බෙදාහදා ජීවත් වීම පිණිස අප උදෙසා යේසු කොපමණ යාඥා කරනවා ඇත්ද! එතුමගේ ඒ උතුම් යාඥාවල පිළිතුරු ඔබගේ ජීවිතයේද ඔබ පවුල පුරාම සැමදින නිති තිර වේවා!

එතුමා ගෙත්සමනේ උයනේ යාඥා කරමින් සිටින අතර තම ගෝලයන්ගෙන් මෙසේ ඇසුවා : "ඇයි මේ, මා සමඟ එක් පැයක්වත් අවදිව ඉන්ට ඔබලට බැරි වුනාද?" - මතෙව් 26:40. නොමඟ ගොස් අතරමං වූ අය ගැනත් යේසුව පිළිනොගෙන නැතිවී සිටින අය ගැනත්, රූප වන්දනාවට, මිත්‍යාවන්ට, යන්ත්‍රමන්ත්‍ර හා සාස්තරවලට වහල්වූ අය ගැනත් යේසුගේ අනුගාමිකයන් ගැනත්, කරුණාවේ සිංහාසනයේ ඉදිරියේ දී ඔබ යේසු හා මැදහත්කම් කරනවද? යාඥාවෙන් එතුමව හමුවීම කොපමණ ආශිර්වාදයක්ද, වරප්‍රසාදයක්ද! "අපට දායව ලැබෙන පිණිසද, අපේ ඕනෑඑපාකම්වලදී අප උවමනාවන්ට අනුග්‍රහය ලැබෙන පිණිසද නිසැකකමින් කරුණාවේ සිංහාසනයට ළං වෙමු" -හෙබ්‍රෙව් 4:16.

# 27 යේසුගේ ජීවිතයට හා මරණයට එතුමට බලය ඇත



### යොහන් 10:17, 18

17මා විසින් නැවත ගන්නා පිණිස මගේ
ප්‍රාණය දෙන බැවින් මගේ පියාණන් මට
ප්‍රේම කරනසේක. 18කිසිවෙක් එය මගෙන්
උදුරාගන්නවා නොව මමම එය දෙමි. එය
දෙන්ට මට බලය තිබේ, නැවත ගන්ටද
මට බලය තිබේ. මේ ආඥාව මාගේ
පියාණන්ගෙන් ලදිමියි කීසේක.

### යොහන් 19:4-11

4පිලාත් නැවත පිටතට ගොස්: මොහු
අත කිසි වරදක් මට නොපෙනෙන බව
ඔබලා දැනගන්නා පිණිස, මෙන්න, මොහු
ඔබලා ළගට ගෙනෙමියි ඔවුන්ට කීවේය.
5එකල යේසුස් කටු ඔටුන්නද, රත්නිල්
වස්ත්‍රයද ඇතිව පිටතට ආසේක. පිලාත්ද:
මෙන්න, ඒ මිනිසා! කියා ඔවුන්ට කීවේය.
6එවිට නායක පූජකයෝද සේවකයෝද
එතුමා දුටු කළ: කුරුසියෙහි ඇණගසන්න
කුරුසියේ ඇණගසන්න කියා මොර
ගැසුවෝය. පිලාත්ද: ඔබලම මොහු ගෙන
ගොස් කුරුසියෙහි ඇණ ගසාපල්ලා.
මක්නිසාද මොහු අත කිසි වරදක් ඇති
බව මට පෙනෙන්නේ නැතැයි කීවේය.
7යුදෙව්වරු ඔහුට උත්තර දෙමින්: අපට
ව්‍යවස්ථාවක් තිබේ, තමාම දෙවියන්ගේ
පුත්‍රයා යයි ඔහු කී බැවින්, ඒ ව්‍යවස්ථාවේ
හැටියට ඔහු මරනු ලැබිය යුතු යයි කීවෝය.
8එබැවින් පිලාත් ඒ කීම අසා, වඩාත් භය
වී, 9නැවත ප්‍රේතෝරියම් ශාලාවට ඇතුල්ව:
ඔබ කොතැනින්දැයි යේසුස්ගෙන් ඇසුවේය.
නුමුත් එතුමා ඔහුට කිසි උත්තරයක්
නුදුන්සේක. 10ඔබ මට කථා කරන්නේ නැද්ද?
ඔබ මුදාහරින්ට බලයද මට ඇති බව ඔබ
දන්නේ නැද්දැයි පිලාත් එතුමට කීවේය.
11යේසුස් ඔහුට උත්තර දෙමින්: ඉහළින් එය
ඔබට නොදුන්නේ නම්, මට විරුද්ධව ඔබට
කිසි බලයක් නැත. එහෙයින් මා ඔබට
පාවාදුන් තැනැත්තාගේ පාපය මීට වඩා
මහත් යයි කීසේක.

## යේසුට මැරෙන්න පුළුවන්ද?

යේසු සැබවින්ම දේව පුතුනුවන් නම්, එහෙම නම් එතුමව මරා දැමීමට කිසිවෙකුට පුළුවන්ද? කොහෙත්ම බැහැ. එතුමට විරුද්ධව කිසිම බලයක්, කිසිම මිනිසෙකු ළඟ නැහැ. එතුමගේ ජීවිතය පුදකර, නැවත මරණීන් නැඟිට ජීවමාන වීම යේසුටම සීමාවූ දේව බලයයි! දේව කැමැත්තයි!

පිලාත්ට යේසු මෙසේ කීවා: "මගේ රාජ්‍යය මෙලොව සබඳව නොවේ. මගේ රාජ්‍යය මගේ රාජ්‍යය මෙලොවට සම්බන්ධ නම්, යුදෙව්වරුන්ට මා භාර නොදෙන පිණිස මගේ සේවකයන් සටන් කරනවා ඇත" - යොහන් 18:36. යුදෙව්වන් එතුමව අල්ලා ගත්තේ, එසේ අල්ලාගැනීමට යේසු ඉඩ හැරිය නිසයි. ඔවුන් එතුමව අල්ලාගත් පසු යේසු: "දේව දූතයන් ලෙගියොන් දොළසකට වඩා මා වෙත මෙදැන් එවන ලෙස මාගේ පියාණන්ගෙන් ඉල්ලන්ට මට බැරි යයි ඔබලා සිතනවාද? එසේ ඉල්ලුවොත් මෙලෙස විය යුතු යයි කියන ලියවිලි සම්පූර්ණ වෙන්නේ කෙසේද?" - මතෙව් 26:53,54. යේසු ගෙත්සමෙනේ උයනේ යාඥා කරමින් සිටින විට එතුමට උපස්ථාන කරමින් සිටි දේව දූතයන්ට පුළුවන්කම තිබුණා, ඇසිපිය හෙළන සැනින් එම සොල්දාදුවන්ව විනාශ කිරීමට. නමුත් එසේ නොවුනේ මිනිසාට දී තිබූ පොරොන්දුව යේසු විසින් ඉටු කළ යුතු නිසයි.

යේසු මෙසේ කියා තිබුණා: "මනුෂ්‍ය පුත්‍රයා බොහෝ වධ විඳින්ටත්, වැඩිමහල්ලන් විසින්ද, නායක පූජකයන් විසිනද, ලියන්නන් විසින්ද එපා කරනු ලබන්ටත්, මරනු ලබන්ටත්, තුන්වන දින නැගිටින්ටත් ඕනෑය" - ලූක් 9:22. දැන් ඔබට වැටහෙනවා ඇති යේසුගේ මරණය, ලෝ පටන්ගැන්මටත් ප්‍රථම තිබූ දේව සැළස්මක් බව (එළිදරව් 3:18)


යේසු මරණය පැරදවීම දෙවිඳුගේම අනගි සැළස්මයි. "එහෙයින් දරුවන් ලේ සහ මාංසයට පංගුකාරයන්ව සිටින නිසා එතුමද එලෙසම එවට පංගුකාරයෙක් විය. එසේ කළේ මරණය කෙරෙහි බලය ඇති යක්ෂයාව මරණය තුළින් බලය නැති කර ජීවිතය මුළුල්ලෙහි මරණයට බියෙන් හා වහල්කමට යටත්ව සිටි සියල්ලන්ව නිදහස් කරන පිණිසය" - හෙබ්‍රෙව් 2:14,15. මරණයට ඔබ බයද? යේසු මැරුණේ ඔබව නිදහස් කිරීමටයි! ඒ ඔබට ආදරේ නිසයි.

# 28 යේසුව කුරුසියේ ඇණගසා සොහොන් කරන ලදී

**යොහන් 19:17, 18, 30-37**

**[17]එතුමම කුරුසිය උසුලාගෙන,
හෙබ්‍රෙව් භාෂාවෙන් ගොල්ගොතා කියන ලද
ඉස්කබල නැමැති ස්ථානයට පිටත්ව
ගියසේක. [18]එහිදී ඔවුහු එතුමව කුරුසියෙහි
ඇණගැසුවෝය; මැද එතුමද එතුමා සමග
දෙපැත්තේ තවත් දෙදෙනෙක්ද කුරුසිවල
ඇණගැසුවෝය. [30]යේසුස් කාඩිගත් පසු:
තීන්දු වුණේය කියා හිස නමා, තමන්
ආත්මය භාර දුන්සේක. [31]ඒ දවස සූදානම්
වීමේ දවස බැවින්, සබත් දවසේ දී ශරීර
කුරුසියෙහිම නොතිබෙන පිණිස, ඔවුන්ගේ
කෙණ්ඩා කඩා, ඔවුන් ඉවත් කරන්ට
යුදෙව්වරු පිලාත්ගෙන් ඉල්ලුවෝය.
මක්නිසාද ඒ සබත් දවස මහත් දවසක්ය.**

32එබැවින් හේවායෝ ඇවිත්, පළමු
වෙනියාගෙත් ඔහු සමඟ කුරුසියෙහි
ඇණගැසූ අනික් අයගේත් කෙණ්ඩා
කැඩුවෝය. 33නුමුත් ඔවුහු එතුමා ළඟට
ආ කළ, එතුමා මැරී සිටි බව දැක, එතුමගේ
කෙණ්ඩා නොකැඩුවෝය. 34එසේ වුවත්,
හේවායින්ගෙන් එක් කෙනෙක් හෙල්ලයකින්
එතුමගේ ඇළයට ඇන්නේය. එකෙනෙහිම
ලේත් වතුරත් නික්මුණේය. 35ඒ දුටු
තැනැත්තා සාක්ෂි දී තිබේ, ඔහුගේ සාක්ෂිය
සැබෑය. ඔබලත් විශ්වාස කරන පිණිස තමා
සැබෑව කියන බව ඔහු දන්නේය.
36මක්නිසාද මේ දේවල් සිදුවුණේ: එතුමගේ
ඇටයක්වත් කඩනු නොලැබේ කියා ලියා
තිබුණු ලියවිල්ල සම්පූර්ණ වන පිණිසය.
37නැවතත්: ඔවුන් විසින් අනින ලද
තැනැත්තා දෙස ඔවුහු බලන්නෝ යයි වෙන
ලියවිල්ලක කියා තිබේ.



**යොහන් 19:40-42**

40ඔවුහු යේසුගේ ශරීරය රැගෙන,
යුදෙව්වරුන් තැන්පත් කරන සිරිත ලෙස,
සුවඳ බඩු සමඟ සිහින් හණ රෙදිවලින්
එය එතූහ. 41එතුමා කුරුසියෙහි ඇණගසනු
ලැබූ ස්ථානයෙහි උයනක් තිබුණේය: ඒ
උයනෙහි එතෙක් කිසිකලෙක කිසිවෙකු
නොතැබූ අලුත් සොහොන්ගෙයක් තිබුණේය.
42ඒ සොහොන් ගෙය ළඟ තිබුණු බැවින්,
යුදෙව්වරුන්ගේ සූදානම්වීමේ දවස නිසා,
ඔවුහු එතුමව එහි තැබුවෝය.

# යේසුගේ මරණය අනතුරකින් සිදුවුවක් නොව

බයිබලය පිරිසිදුව වටහාගැනීමෙහි ලා එකම දොරටුව නම්, එහි ඇති සියලුම ලියවිලි යේසු වටා ගෙතුනු ඒවා බව පිළිගැනීමයි. “මෝසෙස්ගෙන්ද, සියලු අනාගතවක්තෘන්ගෙන්ද, පටන්ගෙන, සියලු ලියවිලිවල තමන් ගැන තිබූ කාරණා ඔවුන්ට තෝරාදුන්සේක” - ලූක් 24:27. යේසු දැන සිටියා: “මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙහිද, අනාගතවක්තෘන්ගේ ලියවිලිවලද, ගීතිකාවලද, එතුමා ගැන ලියූ සියල්ල සම්පූර්ණ විය යුතු බව” - ලූක් 24:44. එවිට එතුමා ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදා ඔවුන්ට කියනසේක: "මෙසේ ක්‍රිස්තුස් වධ වදින්නටත්, තුන් වන දින මළවුන්ගෙන් නැගිටින්නටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල හා පව්කමාවද එතුමගේ නාමයෙන් ප්‍රකාශ කිරීමටත් යුතු යයි“ ලියා තිබේ - ලූක් 24:54-57.


දේව සැලැස්ම කොපමණ අනගිද? කොපමණ පුදුමද? ඔබ ළඟ බයිබලයක් තියෙනවා

නම් පරණ ගිවිසුමේ දී දෙවියන් ලෝකයාට දුන් සැලැස්ම යේසු සම්දු සම්පූර්ණ කළ සැටි පහත දී ඇති පදවලින් කියවා බලන්න (යේසුගේ පළමු ඊම ගැන පමණක් අනාගතවාක්‍ය 300 තියෙනවා. මේ ඉන් ඉතා සවල්පයකි.)

| යේසු කෙරෙහි දේව සැලැස්ම | අනාගත වාක්‍යය | සම්පූර්නත්වය |
|---|---|---|
| පොරොන්දු වූ "ස්ත්‍රියකුගේ වංශය" | උත්පත්ති 3:15 | ගලාති 4:4 |
| පොරොන්දු වූ "ආබ්‍රහම්ගේ වංශය" | උත්පත්ති 18:18 | ක්‍රියා 3:25 |
| බෙත්ලෙහෙමේදී ඉපදීම | මීකා 5:2 | මතෙව් 2:1 |
| කන්‍යාවක් තුළින් ඉපදීම | යෙසායා 7:14 | මතෙව් 1:18 |
| ගලීලයේ සේවය කිරීම | යෙසායා 9:1,2 | මතෙව් 4:12-16 |
| අනාගතවක්තෘ ලෙස | ද්විතීය 18:15 | යොහන් 6:14 |
| පූජකයෙකු ලෙස | ගීතාවලිය 110:4 | හෙබ්‍රෙව් 6:20 |
| රජෙකු ලෙස | යෙසායා 9:7 | යොහන් 18:36,37 |
| යුදෙව්වන් විසින් එපා කිරීම | යෙසායා 53:3 | යොහන් 1:11, 5:43 |
| ජයමන් ඇතුල්වීම | සෙකරියා 9:9 | යොහන්12:13-15 |
| මිතුරෙකු විසින් පවා දීම | ගීතාවලිය 41:9 | මාර්ක් 14:10 |
| රිදී මිල 30 විකුණනු ලැබීම | සෙකරියා 11:12 | මතෙව් 26:15 |
| බොරු සාක්ෂිකාරයන්ගේ චෝදනා | ගීතාවලිය 27:12 | මතෙව් 26:60,61 |
| චෝදනා ඉදිරියේ නිහඬව සිටීම | යෙසායා 53:7 | මතෙව් 26:62,63 |
| පහරදී එතුමට කෙළගැසීම | යෙසායා 50:6 | මාර්ක් 14:65 |
| පව්කාරයන් සමග කුරුසියේ ඇණගැසීම | යෙසායා 53:12 | මතෙව් 27:38 |
| අත් පා සිදුරු කරනු ලැබීම | ගීතාවලිය 22:16 | යොහන් 20:27 |
| කවටකම් කර නින්දා අපහස කරනු ලැබීම | ගීතාවලිය 22:6-8 | මතෙව් 27:39,40 |
| බීමට කාඩි (විනාකිරි) දීම | ගීතාවලිය 69:21 | ලූක් 19:29 |
| සිය සතුරන් ගැන යාඥා කිරීම | යෙසායා 53:12 | යොහන් 23:34 |
| ඇළය සිදුරු කරනු ලැබීම | සෙකරියා 12:10 | යොහන් 19:34 |
| කිසිම කෙණ්ඩාවක් (ශරීරයේ ඇට කටු) බිඳනු නොලැබීම | ගීතාවලිය 34:20 | යොහන් 19:33 |
| ධනවතුන් සමග සොහොන් කරනු ලැබීම | යෙසායා 53:9 | මතෙව් 27:57-60 |
| එතුමගේ නැවත නැගිටීම | ගීතාවලිය 16:10 | මතෙව් 28:9 |
| එතුමා සවර්ගයට නැග යෑම | ගීතාවලිය 68:18 | ලූක් 24:50,51 |

(යේසුගේ සම්පූර්ණ මරණය ගැන දැනගැනීමට මෙම පරිච්ඡේදයන් කියවන්න: මතෙව් 26 හා 27; මාර්ක් 14 හා 15; ලූක් 22 හා 23; යොහන් 18 හා 19; යෙසායා 53 හා ගීතාවලිය 22)

# 29 යේසු මරණින් නැගිට්ටියි



යොහන් 20:1-9

1සතියේ පළමුවෙනිදා අලුයම්වේලේ,
අඳුර තිබියදීම, මග්දලාය් මරියා සොහොන
ගෙය ළගට ගොස්, සෙහොන්ගෙයින් ගල
අහක්කොට තිබෙන බව දුටුවාය. 2එහෙයින්
ඈ සීමොන් පේත්‍රුස් ළගටද එතුමා ප්‍රේම
කළ අනික් ගෝලයා ළගටද දුවගොස්: ඔවුන්
සවාමින්ව සොහාන් ගෙයින් අහක් කොට
ගෙන ගොස් තිබේ, එතුමව කොතැන
තැබුවාද කියා අපි නොදනිමු යයි ඔවුන්ට
කීවාය. 3එබැවින් පේත්‍රුස් ද, අනික්
ගෝලයාද පිටපත්ව සොහොන් ගෙය දෙසට
ගියෝය. 4ඔවුන් දෙදෙනා එක්ව දිව්වෝය.
අනික් ගෝලයා පේත්‍රුස් පසුකර දුවගොස්,
පළමුව සොහොන් ගෙය ළගට පැමිණ,
5නැමී බලා, සිහින් හණරෙදි එහි තිබෙනවා
දුටුවේය; නුමුත් ඇතුළට ගියේ නැත.
6සීමොන් පේත්‍රුස් ඔහුට පසුව පැමිණ,
සොහොන් ගෙය ඇතුළට ගොස්, 7හණ රෙදි
තිබෙන බවත්, එතුමගේ හසේ තිබුණු රෙදි
කඩ, හණ රෙදි සමග නැතිව වෙනම
එක්තැනක අකුලා තිබෙන බවත් දුටුවේය.
8එකල පළමුවෙන් සොහාන් ගෙය ළගට
ආ ඒ අනික් ගෝලයාද ඇතුළට ගොස්,
දැක විශ්වාස කෙළේය. 9මක්නිසාද යේසුස්
මළවුන්ගෙන් නැගිටින්ට ඕනෑ යයි ලියන
ලද ලියවිල්ල එතෙක් ඔවුහු නොදැන
සිටියෝය.

## ඇයි නැවත නැගිටීම මෙපමණ වැදගත්

යෝබ් මෙසේ ඇසුවා: "මිනිසෙකු මළ පසු ඔහු නැවත ජීවත්වෙනවද?" - යෝබ් 14:14. ඔහු ලද ප්‍රීතිමත් පිළිතුරු නම්: "මගේ මිදුම්කරු ජීවත්ව සිටින බවද, අන්තිමේදී එතුමා පොළොව පිට සිටින බවද දනිමි. මේ මගේ හම ගියායින් පසු, මගේ මාංශය නැතිව නමුත්, දෙවියන් දකිමි" - යෝබ් 19:25,26. ඔව්, "එතුමා ජීවත්ව සිටින නිසා, අපිද ජීවත්ව සිටිමු" - යොහන් 14:19. "මක්නිසාද එතුමා දුර්වලකමින් කුරුසියේ ඇණගසනු ලද මුත් දෙවියන්ගේ බලයෙන් ජීවත්වනසේක. එසේම අපිද එතුමා තුළ දුර්වලව සිටින නමුත් එතුමා සමග දෙවියන්ගේ ඔබලා උදෙසා ජීවත් වෙමු" - 2 කොරින්ති 13:4.

පාවුල් මුළු ශුභාරංචියම පද දෙකකට කෙටි කර ඇත: "මා ලද දෙය සියල්ලට පළමුව ඔබලට භාර දුනිමි. එනම්, ලියවිලි අනුව අපේ පව් නිසා ක්‍රිස්තුස් මැරුණු බව, තවද ලියවිලි අනුව එතුමා තැන්පත් කල බවත්, තෙවන දින එතුමා නැගිටි බවත්ය" -

1 කොරින්ති 15:3,4. මරණය පරදවා තෙවන දින යේසු මරණින් නැගිට්ටේ නැත්නම්, අප මොනවා දේසනා කරන්නද? අපට කිසිම බලාපොරොත්තුවක්ද නැතිව, පාපයේම ජීවත්ව පාපයේම මැරී අපාගත විමටම සිදුවෙයි. නමුත් අප දෙවිඳුට ප්‍රසංසා වේවා! යේසු ජීවමානයි! එතුමට පුළුවන් ඔබ තුළද ජීවමාන වෙන්න! තවද, "යේසුව මළවුන්ගෙන් නැගිටවූ තැනැන්වහන්සේගේ ආත්මය ඔබලා තුළ වාසය කරන්නේ නම්, ක්‍රිස්තුස් යේසුව මළවුන්ගෙන් නැගිටවූ තැනැන්වහන්සේ ඔබලා තුළ වසන තම ආත්මයාණන් කරනකොටගෙන, ඔබලගේ මරණීය ශරීරයද ජීවත් කරනසේක" - රෝම 8:11.

## එතුමා උදෙසා අපි ජීවත් විය යුතුයි


"ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි බලපවත්නේය; එසේය, එක් අයෙක් සියල්ලන් උදෙසා මැරුණේ කියාත්, බැවින් සියල්ලෝම මැරුණේ කියාත්, එතුමා සියල්ලන් උදෙසා මැරුණේ, ජීවත් වන්නන්, තවත් තමන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවෙන් මැරී නැවත නැගිටි එතුමා උදෙසා ජීවත්වන පිණිස කියාත්, නිශ්චිතවම අපි කියමු" - 2 කොරින්ති 5:14,15.

අපි අපේ පාපයේම මැරී සිටිනා විට ක්‍රිස්තුස් යේසුස් අප උදෙසා සිය දිවි පිදුවා. නමුත් දැන් අපි දෙවිඳු වෙනුවෙන් ජීවමානව සිටිනවා. දැන් අප යේසු තුළ අළුත් මැවිල්ලකි! එමනිසා අප වෙනුවෙන් ජීවත් නොවී, එතුමා උදෙසා ජීවත් විය යුතුයි. ඇත්තෙන්ම දැන් ඔබ ඔබට අයිති නැහැ. නමුත්, ඔබ අයිති අළුත් ජීවනය දුන් යේසුටයි! "ඔබලා ඔබලට අයිති නැත; මක්නිසාද ඔබලව මිළේට ගනු ලැබුවහුය. එබැවින් ඔබලගේ ශරීරයෙන් දෙවිඳුට ගෞරවය කරන්න" - 1 කොරින්ති 6:20.

# 30 යේසු මරියාට එළිදරව් වෙයි

**යොහන් 20:11-17**

**11නුමුත් මරියා සොහොන් ගෙය ළඟ පිටත හඬමින් සිටියාය. මෙසේ ඈ හඬමින්, නැමී සොහොන් ගෙය ඇතුළ බැලුවාය. 12එවිට එතුමගේ ශරීරය තබන ලද තැන සුදු වස්ත්‍ර පැළඳ ගත් දේව දුතයන් දෙදෙනෙක්, එක්කෙනෙක් හිස ළඟද එක්කෙනෙක් පාද ළඟද ඉන්නවා දුටුවාය. 13එකල ඔවුහු: ස්ත්‍රීය, මක්නිසා හඬනවාදැයි ඇගෙන් ඇසුවෝය. ඈ ඔවුන්ට කථාකොට: මාගේ සවාමින්ව අහක්කොට ගෙන ගොස් කොතැන තැබුවේදැයි මා නොදන්නා නිසා යයි කීවාය. 14ඈ මෙසේ කියා, ආපසු හැරී, එතුමා සිටිනවා දුටුවාය, නුමුත් ඒ යේසුස් බව ඈ නොදැන සිටියි. 15යේසුස්: ස්ත්‍රීය,**



**ඔබ කුමක් නිසා හඬනවද? කවරෙකු සොයනවාදැයි ඇගෙන් ඇසුසේක. ඔහු උයන්ගොව්වා යයි ඇ සිතා: මහත්මයාණෙනි,
ඔබ එතුමව ගෙන ගියා නම්, එතුමා
කොතැන තැබුවාද කියා මට කියන්න. මම
එතුමව ඉවත් කර ගෙන යමි කීවාය.
එතුමා: 16මරියා කියා ඇට කීසේක. ඇ
හැරී හෙබ්‍රෙව් භාෂාවෙන්: රබ්බෝනි එතුමට
කීවාය; එහි අර්ථය ආචාරිනී යනුයි.
17එතුමා: මට අත නොගසන්න; මක්නිසාද
මම තවම පියාණන් වෙතට නොනැංගෙමි.
නුමුත් මගේ සහෝදරයන් ළගට ගොස්,
මම මගේ පියාණන් හා ඔබලගේ පියාණන්ද,
මාගේ දෙවියන් හා ඔබලගේ දෙවියන්ද
වෙතට නගිමියි ඔවුන්ට කියන්න යයි ඇට
කීසේක.**

## ස්ත්‍රීන්ට යේසුගේ ගෞරවය

ඉතාමත් දුක්ඛිත අඳුරු පැයේදීද, ඉතාමත් දීප්තිමත් සතුටේදීද යේසු ස්ත්‍රීන්ට ගෞරවය කළා. යේසු මරණ වේදනාවෙන් කුරුසිය මත සිටිනා විට සිය මවට ඉතා ආදරයෙන් කතා කර, ඇයව සිය ආදර ගෝලයා වන යොහන්ට භාර කළා - යොහන් 19:26,27. එමෙන්ම, එතුමගේ විජයග්‍රාහික නැවත නැගිටීමේදී යේසු පළමුව එළිදරව් වුනේ මරියා නැමති තවත් ස්ත්‍රීයක්ටය.


දෙවියන් කෙරෙහි විශ්වාස කරන දේව භක්ති ස්ත්‍රීන් ඉතා යටහත් හා සන්සුන් ආත්මයකින් සැරසී සිටිය යුතුය. එසේ වු විට, ඔවුන් “දෙවියන් ඉදිරියේ ඉතා අනඟිය...” 1 පේත්‍රුස් 3:4. පුරුෂයා පමණක් නොව, නමුත් ස්ත්‍රීයවද දෙවියන්, එතුමගේම හැඩරුවට හැදුවා - උත්පත්තිය 1:27. පුරුෂයා වේවා, ස්ත්‍රිය වේවා, ඔවුන්ගේ වෙනසක් දෙවියන් ඉදිරියේ නැත. එනිසා යේසු වෙත පැමිණ සියලුම ආත්මික උරුමයන් එක හා සමානව ලබාගැනීමට දෙවියන් ඔවුන්ට ආශිර්වාද කර ඇත. “එතුමා අපට ඉතා අනගි පොරොන්දු දී ඇත.... ඒ පොරොන්දු දේව ස්භාවයට අප පංගුකාරයන් වන පිණිසය - 2 පේත්‍රුස් 1:4 ක්‍රිස්තුස් යේසුස් තුළ ඔබ සියල්ලෝම එක්කෙනෙක්මය.... පුරුෂයා හෝ ස්ත්‍රියක් නැත්තේය” - ගලාති 3:28.

ස්ත්‍රින්ට දෙවියන් කොපමණ ගෞරවය කරයිද යත්, ක්‍රිස්තුස් යේසු සිය සභාවට (ඔබට මට) ආදරය කර, ඒ වෙනුවෙන් සිය දිවි පිදුවද, එසේම සිය භාර්යාවන්ට,

පිච්තුරුව ආදරය කරන ලෙස පුරුෂයන්ට දෙවියන් අණ කර ඇත. - එපීස 5:25 "එසේම පුරුෂයන් විසින්ද සිය භාර්යාවන්ට තමන්ගේම ශරීරයට මෙන් ආදරය කළ යුතුය. සිය භර්යාවට ආදරය කරන්නා තමටද ආදරය කරයි" - එපීස 5:28.

සැමියා හා බිරිඳ අතර සර්වසම්පූර්ණ එකඟතාවය හා සමාදානය දේව සතුට වෙයි. එමෙන්ම දික්කසාදයට එතුමා ද්වේශ කරයි. "මක්නිසාද (භාර්යාවන්) අත්හැර දැමීමට මම ද්වේශ කරමියි ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමින් කියයි" මලාකි 2:16. "ඔබලා එකම ආදරයක් ඇතිව, එකඟව සිට, එකම කරුනම අභිප්‍රාය කරගෙන, එක්සිතින් සිටීමෙන් මාගේ ආදරය සම්පූර්ණ කරන්න. පක්ෂවාදයෙන් හෝ නිෂ්ඵල පාරට්ටු කරගැනීමෙන් හෝ කිසිදෙයක් නොකර, තමාට වඩා වෙන කෙනෙක් උසස් කියා යටහත්කමින් එකිනෙකා සිතන්න" - පිලිප්පි 2:2,3.

# 31 සිය ගෝළයන්ට යේසු එළිදරව් වෙයි



**යොහාන් 20:19-22**

**19සතියේ පළමුවෙනි වූ ඒ දවසේ සවස්**
**වූ කළ, යුදෙව්වරුන්ට භයින් දොරවල් වසා**
**තිබේද්දී, ගෝලයන් එක්ව සිටි තැනට එතුමා**
**ඇවිත් මැද සිට: ඔබලට සාමය වේවා**
**කියා ඔවුන්ට කීසේක. 20එතුමා මෙසේ කියා,**
**තමන්ගේ අත්ද, ඇළයද ඔවුන්ට පෙන්වුහ.**
**එවිට ගෝලයෝ සවාමින් දැක සන්තෝෂ**
**වුහ. 21එතුමා: ඔබලට සාමය වේවා යයි**
**නැවතත් ඔවුන්ට කියා, පියාණන් මා**
**එවුසේම, මමත් ඔබලා යවමියි කීසේක.**
**22එතුමා මෙසේ කියා, ඔවුන් දෙසට හුස්ම**
**හෙළා: ශුද්ධාතමයාණන් පිළිගන්න කියා**
**ඔවුන්ට කී සේක.**

## ඔබ කළ යුතු දෙය


යේසු කී වචනින් හිස්තැන් පුරවන්න

01. "ඔබලට .................................. වේවා" (19)

02. "පියානන් මා එවු සේම ............................................................. කියා කීසේක. (21)

03. "ශුද්ධාත්මයාණන් ............................................ (22)

# 32 අවිශ්වාස කළ ගෝළයාගේ විශ්වාස කිරීම



යොහන් 20:24-29

24එතුමා ආ කළ, දොළොස් දෙනාගෙන්
එක්කෙනෙක් වූ දිදිමුස් නම් තෝමස් ඔවුන්
සමග නොසිටියේය. 25එහෙයින් අනික්
ගෝලයෝ: අපි ස්වාමින් දිටිමු යයි ඔහුට
කීවෝය. නුමුත් ඔහු ඔවුන්ට කථාකොට:
එතුමගේ අත්වල ඇණ ලකුණු දැක, ඒ
ලකුණුවල මගේ ඇඟිල්ල තබා, එතුමගේ
ඇළයෙහි මාගේ අත තබා බැලුවොත් මිස,
නැත්නම් විශ්වාස නොකරමියි කීවේය.
26අට දවසකට පසු එතුමගේ
ගෝලයෝ නැවතත් ගේ ඇතුළෙහි සිටියෝය,
තෝමස්ද ඔවුන් සමග සිටියේය. දොරවල්
වසා තිබිය දී යේසුස් ඇවිත් මැද සිට:
ඔබලට සාමය වේවායි කීසේක. 27එකල
එතුමා තෝමස්ට කථා කර, මගේ අත්
බලන්න; ඔබේ අත දිගුකර, මගේ ඇළයෙහි
බහන්න. අවිශ්වාස නොකර, විශ්වාස
කරන්න යයි කීසේක. 28තෝමස් උත්තර
දෙමින්: මගේ සවාමිනි, මගේ දෙවියනි
එතුමට කීවේය. 29ඔබ මා දුටු බැවින්
විශ්වාස කළා. නුදුටු නුමුත් විශ්වාස කළ
අය ආශිර්වාද ලද්දෝ යයි එතුමා කීසේක.

## විශේෂ ආශිර්වාදයක්


පියවි නෙතින් ඔබ යේසු දැක නැතත්, එතුමව විශ්වාස කිරීමෙන් පමණක් ඉමහත් විශේෂ ආසිරි ඔබට ඇති බව යේසු පවසයි. එතුමගේ ආත්මය අප තුළ ජීවත්ව සිටින නිසාත්, ශුද්ධ බයිබලය තුළින් එතුමා අපට කතා කරන නිසාත්, අද අපි එතුමව දැන අඳුනා සිටිනවා.

දවසකදී අපි එතුමව සැබවින්ම දකිනවා. “එතුමා ප්‍රකාශ වූ පසු අපි එතුමට සමාන වන බව දිනිමුව; මක්නිසාද එතුමා සිටින විදියටම අප එතුමව දකින්නෙමුව” - 1 යොහන් 3:2ආ. “සිතින් පිවිතුරුව සිටින්නෝ ආශිර්වාද ලද්දෝය; මක්නිසාද ඔවුහු දෙවිඳුන්ව දකින්නෝය” - මතෙව් 5:8. “බලන්න, එතුමා වළාකුල්වලින් එන්නේය, සියලු ඇස්ද, එතුමට ඇන්න අයද එතුමව දකින්නෝය; පොළොවේ සියලු ගෝත්‍රද එතුමා නිසා වැළපෙන්නෝය” - එළිදරව් 1:7. ඔබ යේසුව දුටු විට ඔබ සිත ප්‍රීතිවෙයිද නැතහොත් දුක්වෙයිද? යේසුස්ව, තෝමස්ට ස්වාමින් හා දෙවියන් වූ ලෙසම ඔබටත් එතුමා එසේ වී නම්, එහෙනම් ඔබද එදිනට ප්‍රීතිවෙයි.

# 33 ඔබගේ ඕනෑඑපාකම් සැපයීමට යේසුට බලය ඇත

යොහන් 21:2-6; 9-12; 15-17
2සීමොන් පේත්‍රුස් ද දිදිමුස් නම්
තෝමස්ද ගලීලයේ කානා නුවර
නතානියෙල්ද සෙබදීගේ පුත්‍රයෝද
එතුමගේ ගෝලයන්ගෙන් තවත් දෙදෙනෙක්ද
එක්ව සිටියෝය. 3සීමොන් පේත්‍රුස්: මසුන්
අල්ලන්ට යමියි ඔවුන්ට කීවේය. අපිත් ඔබ
සමග එනවා යයි ඔවුහු ඔහුට කීවෝය.
ඔවුහු පිටත්ව ගොස් ඔරුවට නැගුණෝය;
නුමුත් ඒ රාත්‍රියේ ඔවුන් කිසිවක් ඇල්ලුවේ
නැත. 4පහන්වන කල්හි යේසුස් වෙරළෙහි
සිටිසේක. එසේ වුවත් ඒ යේසුස් බව
ගෝලයෝ දැන නොගත්තෝය. 5එවිට
යේසුස්: දරුවෙනි, ඔබලා ළග කන්ට යමක්
ඇද්දැයි ඔවුන්ගෙන් ඇසුසේක. ඔවුහු එතුට
උත්තර දෙමින්: නැතැයි කීවෝය. 6ඔරුවේ
දකුණු පැත්තෙන් දැල දමන්න, එවිට
සම්බවේ යයි එතුමා ඔවුන්ට කීසේක. එසේ
දැමූ කළ, මසුන් රාශිය නිසා දැල ඇදගන්ට
ඔවුන්ට බැරි විය.

9මෙසේ ගොඩබැස්ස විට ඔවුහු
එහි ගිනි අඟුරු ද ඒ පිට මාලු තිබෙන
බවද රොටිද දුටුවෝය. 10ඔබලා දැන් ඇල්ලූ



මසුන්ගෙන් ගෙනෙන්න කියා එතුමා ඔවුන්ට
කීසේක. 11එබැවින් සීමොන් පේත්‍රුස් ඔරුවට
නැගී, ලොකු මසුන් එකසිය පණස් තුන්
දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට අද්දේය.
එපමණ තිබුණු නුමුත් දැල ඉරුණේ නැත.
12යේසුස් කථා කර: ඇවිත් කන්න යයි
ඔවුන්ට කීසේක. ඒ සවාමීන් බව දැන: ඔබ
කවුදැයි එතුමගෙන් අසන්ට ගෝලයන්ගෙන්
කිසිවෙකුට ධෛර්‍ය නොතිබුණේය.

15මෙසේ ඔවුන් කෑ පසු එතුමා සීමොන්
පේත්‍රුස්ට කථා කර: යොහන්ගේ පුත්‍රවූ
සීමොන්, මොවුන්ට වඩා ඔබ මට ප්‍රේම
කරනවාද ඇසුසේක. ඔහු: එසේය, සවාමිනි,
මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නවා
යයි එතුමට කීවේය. යේසුස්: මගේ බැටළු
පැටවුන් පෝෂණය කරන්න ඔහුට කීසේක.
16නැවතත් දෙවෙනි වරක්: යොහන්ගේ
පුත්‍රවූ සීමොන්, ඔබ මට ප්‍රේම කරනවද
ඔහුගෙන් ඇසුසේක. ඔහු: එසේය, ස්වාමිනී
මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නවා
කියා එතුමට කීවේය. යේසුස්: මගේ
බැටළුවන් පාලනය කරන්න එතුමා කීසේක.
17එතුමා තුන්වෙනි වතාවටත් ඔහුට කථා
කර: යොහන්ගේ පුත්‍රවූ සීමොන්, ඔබ මට
ප්‍රේම කරනවද ඔහුගෙන් ඇසුසේක.
තුන්වෙනි වර: මට ප්‍රේම කරනවද කියා
එතුමා තමාගෙන් ඇසූ බැවින් පේත්‍රුස් දුකට
පැමිණ, ස්වාමිනී, ඔබ සියල්ල දන්නාසේක;
මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නාසේකැයි
එතුමට කීවේය. යේසුස් ඔහුට කථා කර:
මාගේ බැටළුවන් පෝෂණ කරන්න.

# ඇවිත් කෑම කන්න

කෑම මේසයට අපව ඇරයුම් කිරීම යේසුගේ කොපමණ ලස්සන, අලංකාර ගතිපැවතුමක්ද? බහුලත්වයෙන් පිරුණු සැපයීමකට යේසු, සිය ගෝළයන්ට මඟ පෙන්නුවා. ධර්මිෂ්ඨකමට ඔබට සාගින්නක් හෝ පිපාසයක් හෝ තිබෙනවද? යේසු; "ධර්මිෂ්ඨකමට සාපිපාසයක් ඇත්තෝ ආශිර්වාද ලද්දෝය; මක්නිසාද ඔවුහු තෘප්තියට පැමිණෙති" - මතෙව් 5:6

ආත්මය සනසන එතුමගේ වචනය කියවමින්, සෑම උදයකම එතුමා සපයන ආත්මික ආහාරය අනුභව කරමින් යේසුගේ අභිමුඛයට එන්න. වහල්කමින් ඔබව නිදහස් කළ ඔබේම ස්වාමින් හා දෙවියන්: "ඔබගේ කට හොඳින් අරින්න, මම එය පුරවන්නෙමි" - ගීතාවලිය 81:10අා.

ඔබ යේසුට අයිතිනම්, "ඇවිත් කෑම කන්න" යනුවෙන් තවත් උතුම් ඇරයුමක් ඔබට ඇත. **රජුන්ගේ රජ හා ස්වාමින්ගේ ස්වාමින්** හැටියට යේසු ලෝ ඒමට පෙර, එතුමගේ සියලු අනුගාමිකයන් හා එතුමගේ සදාකාල සම්බන්ධවීමේ සරණ මංගල්‍ය කෑම මේසයකින් පටන්ගනී.

යොහන්: "අපි අතිශයින් ප්‍රීතිවෙමු; සන්තෝෂ වෙමු, එතුමට ගෞරවය දෙමු. මක්නිසාද බැටළුපැටවාණන්ගේ සරණ මංගල්‍යය පැමිණියේය, එතුමගේ භාර්යාවද සූදානම්ව සිටින්නීය. දීප්තිමත් වූ, පවිත්‍ර වූ, සිහින් වස්ත්‍රයෙන් පැළඳෙන්ට ඇයට ලැබුණේය. සිහින් වස්ත්‍ර නම් ධර්මිෂ්ඨ ක්‍රියාවන්ය. " එළිදරව් 19:7,8. ඒ සරණ මංගල්‍යය කෑම මේසට ඔබ සූදානම් ද? දෙවිඳු ඉදිරියේ අපේ පුද්ගලික ධර්මිෂ්ඨකම් නොවටිනා බව සිත් බැදගන්න. "අපේ සියලුම ධර්මිෂ්ඨකම් කිලිටි වැරහැලි මෙන්ය" - යෙසායා 64:6. ඒ අනගි සරණ මංගල්‍යයට අපව කැඳවන එකම ධර්මිෂ්ඨකමේ වස්ත්‍රය, **යේසු පමණය**. "අප එතුමා තුළ දෙවියන්ගේ ධර්මිෂ්ඨකම වන පිණිස, පාපයක් නොදත් එතුමා අප වෙනුවට පාපය වෙන්ට (දෙවියන්) සැලසුසේක" - 2 කොරින්ති 5:21. කොපමන පුදුමාකාර හුවමාරුවක්ද? එතුමගේ ධර්මිෂ්ඨකම අපට දෙන පිණිස, අපේ පාපය එතුමා ගත්තා.

# මාගේ බැටළුවන් පෝෂණය කරන්න

යේසු ඔබව පෝෂනය කරන සේම විධියටම ඔබ අන් අයව පෝෂනය කළ යුතු බව යේසු කියයි. මෙම යොහන්ගේ බයිබල් පාඩමෙන් ඇත්තෙන්ම ඔබ ආත්මය පෝෂණය වුණාද? එසේනම්, දෙවිඳු ඔබට ඉගැන්වූ දෙය ඔබ අන් අය සමඟ බෙදාගත යුතුයි. "ඔබලා අතර සිටින දෙවියන්ගේ රැළ පෝෂණය කරන්න..... රැළට ආශිර්වාදයක් (නිදසුනක්) මෙන්" - 1 පේත්‍රුස් 5:2,3 දේව වචනය අන් අය සමඟ බෙදාගනිමින් ඔවුන්ට ආශිර්වාදයක් හා නිදසුනක් වීමට අපට පුළුවන "මා විසින් ඔබලට අණ කළ සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තය දක්වා හැම කල්හිම ඔබලා සමඟ සිටිමි" - මතෙව් 28:20

# පිළිතුරු

**පිටු 4, 5**

01. දෙවියන්
02. දෙවියන් සමග
03. ජීවනය
04. අඳුරේදී
05. යොහන්
06. සෙනග
07. දේව දරුවන්
08. ලෙයින් මාංසයෙන්වත් මිනිස් දෙවියන්ගෙන්ම
09. මාංසවත්ම
10. අප
11. පූර්ණත්වයෙන්, අනුග්‍රහයෙන් අනුග්‍රහය
12. පුත්‍රයාණන්ම

**පිටු 8, 9**

01. වනයේ, හඬ
02. මාර්ගය, සමතලා
03. පසුව, පළමුව
04. ලෝකයේ, පාපය, දෙවියන්ගේ බැටළුපැටවා
05. ඉශ්‍රායෙල්වරුන්ට
06. පරවියෙකු, ශුද්ධාත්මයෙන්

**පිටුව 14**

01. එතුමා ඔබලට කියන කොයි දෙයක් නමුත් කරන්න
02. කට ළඟටම පිරවුහ

**පිටු 21, 22**

01. ප්‍රධානියෙක්, රාත්‍රියේ
02. ගුරුවරයෙක්
03. නැවත උපදින්ට
04. වතුරෙන්ද, ආත්මයෙන්ද
05. මාංසයය
06. ආත්මයය
07. මෝසෙස්, සර්පයා
08. ප්‍රේම, විනාශ, ජීවනය
09. විනිශ්චය, ගළවන
10. විනිශ්චය, නොඅදහන්නා
11. ආලෝකයට, අඳුරට, නපුරු, විනිශ්චය
12. සැබෑව

**පිටු 28, 29**

01. වෙහෙසව සිටියා
02. මට බොන්න දෙන්න
03. සමාරියන් සමග යුදෙව්වරුන්ගේ ගනුදෙනුවක් නැති
04. ජීවනදායක වතුර
05. මේ වතුර බොන සැමදෙනාටම නැවත පිපාසය වන්නේය. නමුත් මා දෙන වතුර බොන කවරෙකුට නමුත් කිසි කලෙක පිපාසය නොවන්නේය.
06. ඈට පුරුෂයන් පස් දෙනෙක් සිටින බවත් දැන් සිටින තැන්තාද ඇයගේ පුරුෂයා නොවන බව
07. නමස්කාර
08. ආත්මයෙන්ද, සැබෑකමෙන්ද
09. නුවරට ගොස් මිනිසුන්ට ක්‍රිස්තුස් ගැන කිවා
10. එතුමා එවූ තැන්තාගේ කැමැත්ත කර එතුමගේ වැඩ ඉෂ්ඨ කිරීමටය
11. ක්‍රිස්තුස් නම් ලෝකයාගේ ගැළවුම්කාරයාණ්ය.

**පිටුව 34**

01. තිස් අට
02. සුවය
03. නැගිට යන්න
04. තවත් පව් නොකරන්න
05. සුව, දෙවියන් හා සමාන

**පිටුව 42**

01. පවතිනවානම්, ගෝළයන්ය
02. සැබෑව
03 වහල්ලුය
04. පුත්‍රයා
05. ආදරය
06. දෙවියන්ගෙන්
07. කැමැත්ත, දැනගත්තේය.

**පිටු 44, 45**

01. යේසුස්
02. අසල්වැසියෝ
03 ඵරිසිවරු
04. මව්පියෝ
05. අන්ධ මිනිසා
06. යේසුස්
07. අන්ධ මිනිසා

**පිටුව 61**

01. පාද, සේදුවා, පාද සේදිය
02. ප්‍රේම, ප්‍රේම

**පිටුව 67**

01. ලෝකයෙන්
02. පියාණන්වත්
03. දැක, වෛර
04. නිස්කාරණයේ
05. මැරීම, දෙවියන්ට
06. නාඳුනන
07. ජයගත්

**පිටුව 77**

01. සාමය
02. මමත් ඔබලා යවමි
03. පිළිගන්න